srilanka
WONDER OF ASIA



# වාර්ෂික වාර්තාව
# 2014

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

අංක 80, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
දුරකථන: +94 112 432 059 – 60 | www.srilanka.travel

# වාර්ෂික වාර්තාව

# 2014

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

# පටුන


සභාපතිතුමාගේ පණිවුඩය ..... 5

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය, 2014 ..... 7

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, 2014 ..... 7

1. පසුබිම ..... 9

1.1 ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳපොළ දහය මගින් මෙරටට ආකර්ෂණය කරගත් සංචාරකයන් 2014..... 9

2. හැඳින්වීම ..... 10

2.1 ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ..... 10

2.2 සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම් ..... 10

2.2.1 විගමන අයබදු, සංචාරක සංවර්ධන අයබදු සහ වෙළඳ දායක මුදල් ..... 10

2.3 ක්‍රමෝපායික විග්‍රහය ..... 11

2.3.1 දැක්ම ..... 11

2.3.2 මෙහෙවර ..... 11

2.3.3 අරමුණු ..... 11

2.4 සන්නම් නාමය ..... 12

2.4.1 ලාංඡනය උදෘත පාඨය තේමාව හා අද්විතීය විකුණුම් සාධක(UPS) ..... 12

3. සංචාරක ප්‍රවර්ධන කටයුතු ..... 13

3.1 ඒ ඒ දේශයට සුවිශේෂී වන පරිදි සංවිධානය කරන ලද අලෙවිකරණ කටයුතු සක්‍රීය කිරීම..... 13

3.1.1 ඉන්දියාව ..... 14

3.1.2 එක්සත් රාජධානිය ..... 16

3.1.3 චීනය ..... 20

3.1.4 ජර්මනිය ..... 27

3.1.5 ප්‍රංශය ..... 30

3.1.6 රුසියාව ..... 32

3.1.7 ඕස්ට්‍රේලියාව ..... 34

3.1.8ඇමරිකා එක්සත් ජනපදය ..... 35

3.1.9ජපානය ..... 36

3.1.10කැනඩාව ..... 38

3.1.11මැදපෙරදිග රටවල් ..... 38

3.1.12නෙදර්ලන්තය ..... 39

3.1.13මැලේසියාව ..... 42

3.1.14ඉතාලිය ..... 42

3.1.15සිංගප්පූරුව ..... 44

3.1.16නොර්වේ......45

3.1.17දකුණු කොරියාව......46

3.1.18 පෝලන්තය, හංගේරියාව, තුර්කිය හා චෙක් ජනරජය......48

3.1.19 ඔස්ට්‍රියාව......51

3.1.20 බෙල්ජියම......52

3.2 ගෝලීය ප්‍රචාරණය......54

සීඑන්එන් හා අල් ජසීරා නාලිකාව තුළින් ගෝලීය රූපවාහිනී ව්‍යාපාරය......54

3.3 අනෙකුත් ප්‍රවර්ධන ක්‍රියාකාරකම්......54

මගී නැව්වලින් විනෝද චාරිකාවල යෙදෙන පුද්ගලයන් පිළිගැනීම. ......54

3.4 දේශීය උත්සව අවස්ථා......54

3.5 සුවිශේෂී ජයග්‍රහණ......55

ශ්‍රී ලංකා සංචාරක සංචරණය 2014 වසරේ මෙරටට සම්ප්‍රාප්ත වූ 1,000,000 වන සංචාරකයාව මහත් හරසරින් පිළිගනියි......55

ශ්‍රී ලංකා සංචාරක සංචරණය 2014 වසර තුළ දී ම 100,000 වන චීන සංචාරකයාවමහත් හරසරින් පිළිගැනීම......55

2014 වසරේ දී අන්තර්ජාතික මාධ්‍ය වෙතින් ශ්‍රී ලංකාව ලැබූ සුවිශේෂී ඇගයීම්......56

4. මූල්‍ය ප්‍රකාශන 2014......57

5. විගණන වාර්තාව ...... 76

# සභාපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ ස්ථාපනය කරන ලද ආයතනයකි. 2014 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. දේශීය වශයෙන් සහ ගෝලීය වශයෙන් අග්‍රගන්‍ය සංචාරක සහ සංචාර ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සහ අලෙවි කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ප්‍රධාන පෙළේ කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වරක් හෝ කීප වතාවක් ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට සංචාරකයන් පොළඹවා ගැනීමේ අභිප්‍රායෙන් සංචාරක නිෂ්පාදන අටක් ප්‍රදර්ශනය කරමින් දිවයිනේ අද්විතීය විකුණුම් සාධක ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන පෙළේ වෙළඳපොළ 22 ක් තුල ක්‍රියාකාරීව කටයුතු කරන අතර මෙරටට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රධාන පෙළේ වෙළඳපොළවල දී ඒ ඒ රටට සුවිශේෂී වූ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මෙහෙයවීමේ වගකීම ද සාර්ථකව ඉටු කර තිබේ.

සියලුම පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ඉටු කිරීම තුළින් ශ්‍රී ලංකා සංචරණය එහි ක්‍රමෝපායික සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීමට සමත්ව තිබේ. එමඟින්, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රයත්නය සමඟ අනුගතව සමාජයේ විවිධාකාර තරාතිරම්වලට අයත් පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් වෙත සංචාරක කර්මාන්තයේ ප්‍රතිලාභ බෙදා හැරීම තහවුරු කර තිබේ. 2014 වර්ෂයේ දී මිලියන 1.5 ක සංචාරකයන් පිරිසක් ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීමේ අරමුණ මුදුන් පමුණුවා ගැනීම තුළින්, අඛණ්ඩව ප්‍රගමණය වෙමින් පවතින ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ විශිෂ්ටතම සන්ධිස්ථානයක් සනිටුහන් කිරීමට ශ්‍රී ලංකා සංචරණයට හැකියාව ලැබී ඇත. 2014 වර්ෂයේ දී ඉතා ස්ථාවර වර්ධනයක් අත්පත් කර ගැනීමට මෙම කර්මාන්තයට හැකියාව ලැබුණු අතර ඉදිරි වසර දෙකක කාලය තුළ, සංචාරකයන් මිලියන 2.5 ක් ආකර්ෂණය කර ගැනීමේ එහි ප්‍රධාන ඉලක්කය 2016 වර්ෂය වන විට සපුරා ගැනීම පිළිබඳව මේ අනුව ස්ථිර වශයෙන්ම තහවුරු කිරීමට හැකි වී තිබේ. 2013 වර්ෂයේ සමස්ථ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙම වර්ෂය තුළ 19.8%ක වර්ධනයක් වාර්තා කරමින් සංචාරකයන් 1,527,153 ක් මෙරටට ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා සංචරණය සමත් විය. සංචාරක කර්මාන්තයේ තවත් ආශ්චර්යමත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2014 අගෝස්තු මාසයේ 28 වන දින බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපළින් මෙරටට සම්ප්‍රාප්ත වූ 1,000,000 වන සංචාරකයාව ඉමහත් හරසරින් පිළිගැනීමේ අවස්ථාවද, මෙරටට සම්ප්‍රාප්ත වූ 100,000 වන චීන සංචාරකයාව ඉමහත් හරසරින් පිළිගැනීමේ අවස්ථාවද 2014 වර්ෂය තුළදී ම ශ්‍රී ලංකා සංචරණයට හිමි විය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, මෑත අතීතයේදී ප්‍රධාන වෙළඳපොළවලින් මෙන්ම, නැඟී එන වෙළඳපොළවලින් ද මෙරටට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාවේ කැපී පෙනෙන වර්ධනයක් සාක්ෂාත් කර කිරීමට ශ්‍රී ලංකා සංචරණය සමත්ව තිබේ. ජාතියේ සංචාරක කර්මාන්ත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) දැන්වීම්කරණය, මහජන සම්බන්ධතා සහ මාධ්‍ය වැඩසටහන්, වෙළඳ ප්‍රදර්ශන හා කර්මාන්ත වැඩසටහන්, පාරිභෝගික ප්‍රවර්ධන කටයුතු, මාධ්‍යගත සන්නිවේදනය සහ පාරිභෝගිකයන් සඳහා පහසුකම් සැලසීමේ වැඩසටහන් ඇතුළු ක්‍රියාකාරකම්වල ප්‍රධාන වශයෙන් ම නිරතව සිටියි. සංචාරක කර්මාන්තය පිළිබඳ ගෝලීය වශයෙන් ඉහළම ඇගයීමට ලක් වූ වඩාත්ම හරිත වර්ණ සංචාරක ගමනාන්ත දිවයින වශයෙන් ශ්‍රී ලංකාව ස්ථාපනය කිරීමේ හා ශ්‍රේණිගත කිරීමේ අරමුණින් 2014 වර්ෂයේ දී පැවැත්වූ ප්‍රවර්ධනාත්මක ව්‍යාපාර පිළිබඳ විස්තර ඇතුළත් කරන ලද කාර්යසාධන වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය, 2014

| නම | තනතුර | කාල පරිච්ඡේදය |
|---|---|---|
| භාෂ්වර සේනාංක ගුණරත්න මහතා | සභාපති/ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය/ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 2012 ජූනි මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |
| ආචාර්ය ඩී.එස්. ජයවීර මහතා | අධ්‍යක්ෂ ජෙනරාල්/ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 2013 මාර්තු මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |
| හේමා ධර්මවර්ධන මිය | අතිරේක ලේකම් (පාලන)/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2014 මැයි මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |
| රූමි ජවුෆර් මහතා | කළමනාකරණ අධ්‍යක්ෂ/ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 2013 මැයි මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |
| එස්.එච්.ඩී. කලුතන්ත්‍රි මිය | අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2012 ඔක්තෝබර් මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |
| නිල්මිනී නානායක්කාර මහතා | කළමනාකරණ අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2013 ජූලි මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |
| මර්වින් ප්‍රනාන්දුපුල්ලේ මහතා | සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2013 ජූලි මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |

# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, 2014

| තනතුර | නම | කාල පරිච්ඡේදය |
|---|---|---|
| සභාපති | බී.එස්. ගුණරත්න මහතා | 2012 ජූනි මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |
| කළමනාකරණ අධ්‍යක්ෂ | රූමි ජවුෆර් මහතා | 2011 මැයි මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |
| අලෙවිකරණ අධ්‍යක්ෂ | මධුභානි පෙරේරා මෙය | 2008 ජනවාරි මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |
| මූල්‍ය අධ්‍යක්ෂ | ඩබ්. විමලසේන මහතා | 2014 මැයි මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |
| මහජන සම්බන්ධතා අධ්‍යක්ෂ | දුෂාන් වික්‍රමසූරිය මහතා | 2012 ජූලි මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා |

## 1. පසුබිම

2014 වසර තුළ මිලියන 1.5 ක සංචාරක පිරිසක් ශ්‍රී ලංකාව වෙත ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා සංචරණය සමත් වූ අතර ඉහළම ලාභ ලබමින් අතිශය සාර්ථක ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලාංකික සංචාරක කර්මාන්තයේ රන් අකුරින් සනිටුහන් වන වසරක් බවට එම වසර පත් වී තිබේ. සමාලෝචිත වර්ෂය තුළ සංචාරක කර්මාන්තය වඩාත් ස්ථාවර වර්ධනයක් වාර්තා කිරීමට සමත් වූ අතර 2016 වසර අවසානය වන විට මිලියන 2.5 ක සංචාරකයන් පිරිසක් අප රට වෙත ආකර්ෂණය කර ගැනීමේ ප්‍රධාන ඉලක්කය ඉදිරි වසර දෙක තුළ දී සාක්ෂාත් කර ගැනීමට අපට හැකි වන බව ස්ථිර වශයෙන් ම පැවසිය හැකිය.

ශ්‍රී ලංකා සංචරණය 2013 වර්ෂය තුළ සමස්ථයක් වශයෙන් සංචාරකයන් 1,274,593 ක් ආකර්ෂණය කර ගනිමින් 26.7% ක වර්ධනයක් අත්පත් කර ගැනීමට සමත් වූ අතර 2014 වසර තුළ දී ද සංචාරකයන් 1,527,153 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලද අතර එය 2013 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ මෙරට සංචාරය කරන ලද මුළු සංචාරක පිරිසට සාපේක්ෂව 19.8% ක වර්ධනයකි. ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ විශාලතම වෙළඳපොළ දහය උපයෝගී කර ගනිමින් 2014 වසර තුළ ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය අත්පත් කර ගත් ජයග්‍රහණ පහත සඳහන් කර තිබේ.

### 1.1ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳපොළ දහය මගින් මෙරටට ආකර්ෂණය කරගත් සංචාරකයන් 2014

| අනුක්‍රමික අංකය | රට | ජනවාරි- දෙසැම්බර් 2014 |
|---|---|---|
| 1 | ඉන්දියාව | 242,734 |
| 2 | එක්සත් රාජධානිය | 144,168 |
| 3 | චීනය | 128,166 |
| 4 | ජර්මනිය | 102,977 |
| 5 | මාලදිවයින | 86,359 |
| 6 | ප්‍රංශය | 78,883 |
| 7 | රුසියාව | 69,718 |
| 8 | ඕස්ට්‍රේලියාව | 57,940 |
| 9 | ඇ.එ.ජ. | 39,371 |
| 10 | ජපානය | 39,136 |

වගුව 1 2014 වසර තුළ ශ්‍රී ලංකාවේ විශාලතම සංචාරක වෙළඳපොළවලින් මෙරටට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

ආසියාවේ නැගී එන ආශ්චර්ය බවට ශ්‍රී ලංකාව පත් කිරීමේ ජාතික ප්‍රයත්නයට අනුකූලව කටයුතු කරන අතරතුර සංචාරක කර්මාන්තයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සපුරාලමින් ද, සමාජයේ විවිධ ස්ථරවලට අයත් පුද්ගලයන් විශාල පිරිසක් වෙත සංචාරක කර්මාන්තයේ ආර්ථික ප්‍රතිලාභ බෙදාහැරීම සහතික කරමින් ද ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය එහි ක්‍රමෝපාය සංවර්ධන සැලැස්මේ ප්‍රධානතම අරමුණු සාක්ෂාත් කර ගැනීමට සමත් ව සිටියි. අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් ආර්ථික සංවර්ධන අමාත්‍ය, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකා සංචරණයේ ප්‍රබල මැදිහත්වීම් තුළින් පූර්ව වාර්තා බිඳ හෙළමින් වාර්තාගත සංචාරකයන් පිරිසක් මෙරටට ආකර්ෂණය කර ගැනීමට මෙම වසර තුළ දී අපට හැකි විය.




රූපය 1 2014 ජනවාරි දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ වැඩිම සංචාරක පැමිණීම් වාර්තා වූ රටවල් දහය (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

සංචාරක කර්මාන්තයේ තවත් සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2014 වසර තුළ මෙරටට සම්ප්‍රාප්ත වූ 1,000,000 වන සංචාරකයා බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළේ දී ඉමහත් හරසරින් පිළිගැනීමේ අනගිභවනීය අවස්ථාව 2014 අගෝස්තු 28 වන දින ශ්‍රී ලංකා සංචරණයට හිමි විය. එමෙන්ම, 100,000 වන චීන සංචාරකයා පිළිගැනීමේ අවස්ථාව ද 2014 වසර තුළ දී ම ශ්‍රී ලංකා සංචරණයට හිමි විය. චීනයේ ශැංහයි නගරයේ සිට ශ්‍රී ලංකන් ගුවන් සමාගමට අයත් යූ එල් 867 ගුවන් යානයෙන් පෙරවරු 5.30 ට මෙරටට සම්ප්‍රාප්ත වූ හේ යන්ග් සහ චෙන් හුයි හුවා යුවළ ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලද 100,000 වන චීන සංචාරකයා වශයෙන් සාදරයෙන් පිළිගැනීමට සංචාරක නිලධාරීන් හා චාරිකා හා සංචාරක කර්මාන්ත නියෝජිතයන් ද සමඟ ශ්‍රී ලංකා සංචරණය කටයුතු කරන ලදී.



## 2. හැඳින්වීම

### 2.1 ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය



මෙහි SLTPB ලෙස දක්වා ඇති ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් පනවන ලද 2005 අංක 38 දරණ සංචාරක කර්මාන්ත පනත යටතේ ස්ථාපනය කරන ලද ආයතනයක් වන අතර එය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ.

සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට පැවරී ඇති බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම කාර්යාංශය වෙත වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීම සංචාරක සංවර්ධන අධිකාරියට පැවරී ඇති වගකීමකි. එසේ වෙන් කරනු ලබන අරමුදල් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වගකීම වන්නේ ය.

දේශීය හා ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාව සංචාරක හා සංචාර ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම හා අලෙවිකරණය සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) මගින් ඉටු කරයි. මේ සඳහා ශ්‍රී ලංකාවේ පවතින අද්විතීය විකුණුම් සාධක (USP) ප්‍රවර්ධනය කිරීම සඳහා සංචාරක කාර්මික නිෂ්පාදන අටක් විශේෂයෙන් ප්‍රදර්ශනය කරමින් ශ්‍රී ලංකාව නැරඹීමට වරක් හෝ කීප වතාවක් පැමිණීමට සංචාරකයන් පොළඹවා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා සංචරණය ප්‍රධාන පෙළේ වෙළඳපොළවල් 22 ක දී ක්‍රියාකාරීව කටයුතු කරයි. සංචාරක පැමිණීම් සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) ප්‍රධාන පෙළේ වෙළඳපොළවල දී ඒ ඒ රටට සුවිශේෂී වූ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සිදු කරනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙරට පැවති සිවිල් යුද්ධය නිමාවට පත්වීමත් සමඟ ප්‍රධාන පෙළේ වෙළඳපොළවලින් මෙන්ම නැඟී එන වෙළඳපොළවලින් ද මෙරටට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාවේ වර්ධනයක් ඇති කිරීමට ශ්‍රී ලංකා සංචරණය සමත් විය. ජාතික සංචාරක කර්මාන්ත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) දැන්වීම්කරණය, මහජන සම්බන්ධතා සහ මාධ්‍ය වැඩසටහන්, වෙළඳ ප්‍රදර්ශන හා කර්මාන්ත වැඩසටහන්, පාරිභෝගික ප්‍රවර්ධන කටයුතු, මාධ්‍යගත සන්නිවේදනය සහ පාරිභෝගිකයන් සඳහා පහසුකම් සැලසීමේ වැඩසටහන් ඇතුළු ක්‍රියාකාරකම්වල ප්‍රධාන වශයෙන් ම නිරතව සිටියි.

### 2.2 සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම්

#### 2.2.1 විගමන අයබදු, සංචාරක සංවර්ධන අයබදු සහ වෙළඳ දායක මුදල්

නැවකින් හෝ ගුවන්යානයකින් මෙරටින් පිටව යන පුද්ගලයන්ගෙන් විගමන අයබදු පනවා අයකරනු ලැබේ. ගුවන්යානා ටිකට්පත් හෝ නැවක ගමන් කිරීම සඳහා ටිකට්පත් නිකුත් කිරීමේ දී අයබද්දක් පනවා අයකිරීම සඳහා 2003 අංක 25 දරණ මූල්‍ය පනත මගින් විධිවිධාන සලසා තිබේ. 1961 අංක 19 දරන විගමන බදු පනත වෙනුවට මෙම පනත බලාත්මක වී ඇති අතර ගුවන් සංචරණ පනතේ 365 වන අධිකාරිය ද එම පනත මගින් ම සංශෝධනය වී තිබේ. එමෙන්ම, 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්ලාභී ආයතනවල පිරිවැටුම මත ද 2003 අංක 25 දරණ මූල්‍ය පනත මගින් අයබද්දක් පනවා ඇති අතර ඒ සම්බන්ධ කරුණු හා ඊට ආනුෂාංගික කරුණු සඳහා ද මෙම පනතේ විධිවිධාන සලසා ඇත.

මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා සංචාරක කර්මාන්ත අමාත්‍යාංශය මගින් 2003 සැප්තැම්බර් මාසයේ දී සංචාරක සංවර්ධන අයබද්ද හඳුන්වා දෙනු ලැබීය. ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් මෙම සංචාරක සංවර්ධන අයබදු උපයෝගී කර ගැනේ. 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්ලාභී සෑම ආයතනයක් ම එහි මාසික පිරිවැටුපෙන් සියයට එකක අයබද්දක් ගෙවිය යුතුය. 2004 ජනවාරි 1 වනදා සිට ක්‍රියාත්මක වන පරිදි, 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනත යටතේ සංචාරක නියෝජිතයකු ලෙස බලපත්ලාභී සාමාන්‍ය අලෙවි නියෝජිතයකුගේ පිරිවැටුපෙන් මෙම අයබද්ද අය කරනු නොලැබේ. මෙහි උපවගන්තිය යටතේ රැස් කරන ලද සම්පූර්ණ අයබදු ප්‍රමාණය ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත රඳවා තබා ගැනීමට අවසරය ලබා දී තිබේ. එමෙන්ම, ඒ ආකාරයෙන් රැස් කර ගන්නා ඉපයීම් ඒ සම්බන්ධයෙන් නියම කර ඇති පරිදි, එම ඉපයීම් රැස් කර ගන්නා ලද දිනෙන් දින 30 ක් ඇතුළත මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ප්‍රේෂණය කළ යුතු වන්නේය.

මෙම අයබදු වර්ග දෙකට අමතරව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් වෙළඳ හා පාරිභෝගික සැණකෙළි හා මාර්ග දැක්ම සංචාරක ප්‍රදර්ශන වැනි අදාළ ප්‍රවර්ධන කටයුතු සඳහා පහසුකම් සැලසීමේ ගාස්තුවක් වශයෙන් වෙළඳ දායක මුදල් අය කරයි. උත්සව අවස්ථා සම්බන්ධීකරණය, සන්නාමකරණය හා ප්‍රචාරක කාර්යයන් වෙනුවෙන් උපයෝගී කර ගන්නා ද්‍රව්‍ය හා වේදිකා නිර්මාණය කිරීම, වීසා නිර්දේශ කිරීම ඇතුළු වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැපයීමේ සේවා ද ඇතුළු සමස්ත ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) මගින් සිදු කරනු ලැබේ. විගමන බදු, සංචාරක සංවර්ධන අයබදු හා වෙළඳ දායක මුදල් එක් රැස් කිරීම මගින් උත්පාදනය කරන ලද ආදායම් පවත්නා රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය තවදුරටත් සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් යොදවනු ලැබේ.

## 2.3 ක්‍රමෝපායික විග්‍රහය

### 2.3.1 දැක්ම

සංචාරක කර්මාන්තය පිළිබඳ ගෝලීය වශයෙන් ඉහළම ඇගයීමට ලක් වූ වඩාත්ම හරිත වර්ණ සංචාරක ගමනාන්ත දිවයින වශයෙන් ශ්‍රී ලංකාව ස්ථාපනය කිරීම හා ශ්‍රේණිගත කිරීම

### 2.3.2 මෙහෙවර



ශ්‍රී ලංකාවේ දැකුම්කළු වෙරළ තීර, ප්‍රියමනාප මිත්‍රශීලී මිනිසුන්, ස්වභාව ධර්මයේ මාහැඟි නිපයුම්, ප්‍රබල සංස්කෘතිය හා වීර වික්‍රමාන්විත චාරිකා වැඩිදුරටත් ප්‍රවර්ධනය කරමින් ආසියානු සංචාරක කර්මාන්තය පිළිඹිබු කරන ප්‍රතිමූර්තියක් ලෙස වැජඹීමට ශ්‍රී ලංකාවට අවස්ථාව සලසා දීම හා එහි ප්‍රතිරූපය ඉහළ නැංවීම තුළින් මෙරට සංචාරය කිරීමේ විභවය සහිත ගෝලීය සංචාරකයන්ගේ මනසේ ප්‍රබලව රැඳුණු, ඔවුන්ගේ ඉහළම ඇගයීමට ලක් වූ ගමනාන්ත දිවයින ලෙස ශ්‍රී ලංකාව ශ්‍රේණිගත කිරීම හා සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන්ට හා ශ්‍රී ලාංකික ජනතාව වෙත ප්‍රතිලාභ ලබාදෙන විශාලතම විදේශ විනිමය උපයන්නා බවට පත්වීම.

### 2.3.3 අරමුණු

සංචාරක පනත ප්‍රකාරව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) පහත දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම අවශ්‍ය වන්නේය.

1. සංචාරක සංවර්ධන අධිකාරියේ උපදෙස් හා මඟ පෙන්වීම අනුව ද, සංචාරක සංවර්ධන සැලසුමට අනුකූලව ද, ගුණාත්මක බවින් සපිරුණු සංචාරක හා චාරිකා ගමනාන්තයක් ලෙස ඍජුව හා වක්‍රාකාරව අලෙවිකරණය හා ප්‍රවර්ධනය කිරීම.

2. දකුණු ආසියානු කලාපයට පිවිසීමේ දොරටුවක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම

3. සංචාරක කළමනාකරණය හා සංවර්ධනය පිළිබඳව කලාපයේ විශිෂ්ටතම මධ්‍යස්ථානය ලෙස පිළි ගැනීමක් ශ්‍රී ලංකාව වෙත ළඟා කර දීම.

## 2.4 සන්නාම් නාමය

### 2.4.1 ලාංඡනය, උද්‍යෘත පාඨය, තේමාව හා අද්විතීය විකුණුම් සාධක (USP)

2 වන රූපය ශ්‍රී ලංකා සංචරණයේ සන්නාමය (සන්නම්නාම මාර්ගෝපදේශ SLTPB, 2010)

2014 වර්ෂය තුළ සිදු කරන ලද වඩාත් ඵලදායි අලෙවිකරණ ක්‍රියාකාරකම් තුළින් ගෝලීය සංදර්භය තුළ වඩාත් ප්‍රබල මතයක් ස්ථාපනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ වර්තමාන වෙළඳ වටිනාකම ඉහළ නැංවීමට හැකියාව ලැබුණි. ශ්‍රී ලංකා සන්නම් නාමයේ මධ්‍යයේ යොදනු ලබන ශ්‍රී ලංකා දිවයිනේ හැඩය සමඟ "WONDER OF ASIA" යන උද්‍යෘත පාඨය සියලුම ප්‍රවර්ධන කටයුතු සඳහා භාවිත කෙරේ.

විවිධාකාර ස්වභාවික දසුන්, විවිධ කාලගුණික රටා, වසර 2500 ක් පැරණි සංස්කෘතිය, පසු කාලීනව ලන්දේසි හා පෘතුගීසී සංස්කෘතිවලින් ලද ආභාෂය, ලෝක ප්‍රසිද්ධ ඓතිහාසික උරුමයන් එකොළහ සහ ලෝකයේ අටවන පුදුමය, උණුසුම් වෙරළාශ්‍රිත ජලාශවල හා වැලි වෙරළවල සාරවත්ව වැඩෙන පොල් ශාඛය මෙන්ම සුවදායක උස්බිම්වල වගා කර ඇති ලෝක ප්‍රසිද්ධ තේ වතු ආදී විවිධත්වයෙන් යුත් බෝග වගාවන් ද, ඉතා සුලභව දක්නට ලැබෙන ශාක, සතුන් හා වන ජීවීන්ද, ශ්‍රී ලංකාවට ආවේණික වූ වැසි වනාන්තර යනාදි සියල්ල මෙම අතිශය කුඩා දිවයින තුළ එකට කැටි කොට චමත්කාරජනක ලෙස පිහිටුවා ඇති ආකාරය කිසිසේත් ම අවබෝධ කරගත නොහැකි සදාතනික අභිරහසක් බවට වී ඇත.



කලාපීය හා ගෝලීය වශයෙන් අනෙකුත් සංචාරක ගමනාන්ත වෙතින් එල්ල වන අති ප්‍රබල තරඟකාරීත්වයට මුහුණ දීමට ද ශ්‍රී ලංකාවට සිදු වී ඇත. එසේ වුවද, පාරිභෝගික සහ සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත මෙම ප්‍රවර්ධන කටයුතු තුළින් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය සඳහා කැපී පෙනෙන බලපෑමක් සිදු වී ඇති අතර අනෙකුත් රටවලින් එල්ල වන තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි සංචාරක ගමනාන්තයක් ලෙස තවදුරටත් රැඳී සිටීමට හා මෙම තරඟකාරී පසුබිම තුළ ද අග්‍රගණ්‍ය සංචාරක ගමනාන්තයන් ලෙස තිරසාරව පැවතීම සඳහා ද සංචාරය කිරීමේ විභවයෙන් යුත් සංචාරකයන් අතර ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා උපයෝගී කරගත හැකි සංචාරක නිෂ්පාදන පරාසය වශයෙන් හඳුනා ගත් තේමා අටක් යටතේ සුවිශේෂී ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ අවධානය යොමු වී ඇත. ශ්‍රී ලංකාව සමඟ තරඟ කරන වෙනත් සංචාරක ගමනාන්ත අතරින් ශ්‍රී ලංකාව විශේෂයෙන් ම කැපී පෙනෙන පරිදි වෙන් කිරීම සඳහා අද්විතීය විකුණුම් සාධක (USP) තුනක් ශ්‍රී ලංකා සංචරණය මගින් හඳුනාගෙන තිබේ.

මෙම සාධක අනෙකුත් තරඟකාරී ගමනාන්ත අතර සුවිශේෂී වෙනස්කම් සහිත ගමනාන්තයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචරණය මගින් ප්‍රධාන වශයෙන්ම උපයෝගී කර ගන්නා සංචාරක කර්මාන්ත මෙවලම් වන අතර ඒවා පහත දක්වා තිබේ.

- විවිධත්වය
- තථ්‍යභාවය
- සුසංහිතබව

ශ්‍රී ලංකා සංචරණයේ ප්‍රවර්ධන ක්‍රමෝපාය මෙම අද්විතීය විකුණුම් සාධක (USP) සමඟ සුසංයෝගී වී ඇත. දිවයිනේ සංචාරය කර සුවිශේෂී අත්දැකීම් ලබා ගැනීමේ අවස්ථාව සංචාරකයා වෙත පිළිගැන්වීම මගින් සංචාරකයාගේ ස්වසන්තාන පරිපූර්ණ අවශ්‍යතාව තෘප්තිමත් කිරීමේ අභිප්‍රායෙන් සියළු ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කේන්ද්‍ර ගත කර ඇත.



## 3. සංචාරක ප්‍රවර්ධන කටයුතු

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් මෙම කාර්යාංශය වෙත පවරා ඇති වාර්ෂික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඒ ඒ දේශය සම්බන්ධ සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව සංචාරක ව්‍යාපාරයේ සහාය ඇතිව ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කරනු ලැබීය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ පර්යේෂණ තොරතුරුවලට අනුව සංචාරක පැමිණීම්, සංචාරකයකුගේ දිනක වියදම, සංචාරක ආදායම හා මෙරට ගත කරන දින ගණන මත පදනම් වෙමින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ (SLTPB) වාර්ෂික අලෙවිකරණ අරමුණු වැඩි දියුණු කර ඇත. සංචාරක පනත යටතේ පැහැදිලිව දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) මගින් ප්‍රතිපත්ති ද සකස් කර තිබේ. සෘජු අලෙවිකරණය, විකුණුම් ප්‍රවර්ධනය, මහජන සම්බන්ධතා සහ ප්‍රචාරණය යනාදී ප්‍රවර්ධනය මත පදනම් වූ ක්‍රමෝපායන් යටතේ ප්‍රවර්ධන කටයුතු ව්‍යූහගත කර තිබේ. ඉහළ පරිමාණයෙන් ක්‍රියාත්මකව පවතින සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශීය දූත මණ්ඩල හා දේශීය සංචාරක කර්මාන්තය මගින් ලබා දී ඇති නිර්දේශවලට අනුව වැඩි දියුණු කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද ඒ ඒ රටට සුවිශේෂී වන වාර්ෂික අලෙවිකරණ ක්‍රියාකාරී සැලැස්ම සමඟ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ (SLTPB) සියලු ක්‍රියාකාරකම් එකිනෙකට සම්බන්ධ වී ඇත.

එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය, ඔස්ට්‍රියාව, බෙල්ජියම, ඉතාලිය, රුසියාව, චෙක් ජනරජය, පෝලන්තය, ස්කැන්ඩිනේවියාව, ස්වීඩනය, නෙදර්ලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය, චීනය, ජපානය, කොරියාව, මැලේසියාව, සිංගප්පූරුව, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, ඊශ්‍රායලය, මැද පෙරදිග රටවල් සහ තුර්කිය යන ප්‍රධාන වෙළඳපොළ 22 කදී අලෙවිකරණ ක්‍රියාකාරකම් සිදු කරනු ලැබීය.

ශ්‍රී ලංකාව වෙත සංචාරකයන් පැමිණෙන ප්‍රධාන වෙළඳපොළවල් පහත ලෝක සිතියමේ දක්වා ඇත.




රූපය 3 ශ්‍රී ලංකා සංචාරක සංචරණයේ ප්‍රධාන වෙළඳපොළවල් (2014)

| | |
|---|---|
| රතු | ස්ථාපිත වෙළඳපොළ |
| කොළ | නැගී එන වෙළඳපොළ |
| කහ | විභව්‍ය වෙළඳපොළ |
| නිල් | ශ්‍රී ලංකාව |

### 3.1 ඒ ඒ දේශයට සුවිශේෂී වන පරිදි සංවිධානය කරන ලද අලෙවිකරණ කටයුතු සක්‍රිය කිරීම.

අන්තර්ජාතික සංචාරක ව්‍යාපාරය සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීමේ අවස්ථා ඇති කිරීමේ අරමුණින් 2014 වසර සඳහා වාර්ෂික වෙළඳ ප්‍රදර්ශන සැලැස්මක් හඳුනා ගැනීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සමත් විය.

පවතින සම්බන්ධතා ශක්තිමත් කිරීමට සහ නව ව්‍යාපාරික අවස්ථා ස්ථාපනය කිරීමේ අරමුණින් සෑම ව්‍යාපාරික සැණකෙළියක් සමඟ ම තනි පුද්ගල වෙළඳ හවුල්කරුවන් සමඟ ද්විපාර්ශ්වික ව්‍යාපාරික සාකච්ඡා පැවැත්වීම සඳහා අවස්ථා ලබා දෙමින් මාර්ග දැක්ම, සංචාරක ප්‍රදර්ශන ද පැවැත්වීමට කටයුතු පිළියෙළ කර තිබුණි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) මගින් ගමනාන්ත ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල නිරත වීමට ද, වෙළඳ සැණකෙළි, කර්මාන්ත පුහුණු කිරීමේ වැඩසටහන් හා දැනුවත් කිරීමේ සාකච්ඡා වට සඳහා සහභාගීවීම තුළින් සංචාරක කර්මාන්තය පිළිබඳ වෘත්තීය නිපුණතාව වැඩිදියුණු කර ගැනීමේ අවස්ථා ද කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකත්ව අංශය (SME) වෙත ලබා දීමට කටයුතු පිළියෙළ කර ඇත.



### 3.1.1 ඉන්දියාව




රූපය 4 මාසික සංචාරක පැමිණීම් 2013 සහ 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 16,938 | 17,886 |
| පෙබරවාරි | 14,429 | 17,534 |
| මාර්තු | 15,281 | 18,734 |
| අප්‍රේල් | 12,657 | 17,192 |
| මැයි | 17,834 | 22,981 |
| ජූනි | 15,297 | 19,911 |
| ජූලි | 14,783 | 19,277 |
| අගෝස්තු | 18,999 | 17,912 |
| සැප්තැම්බර් | 18,389 | 19,244 |
| ඔක්තෝබර් | 21,833 | 26,148 |
| නොවැම්බර් | 19,796 | 19,762 |
| දෙසැම්බර් | 22,559 | 26,153 |
| එකතුව | 208,795 | 242,734 |

වගුව 2 2014 වසරේ දී ඒ ඒ මාසවල ඉන්දීය සංචාරකයන් පැමිණීම. (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)



2014 වසර තුළ, ශ්‍රී ලංකාවේ අසල්වැසි රාජ්‍යය වන ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාව වෙත සංචාරය කරන ලද වැඩිම සංචාරක පිරිස වශයෙන් සංචාරකයන් 242,734 ක් ශ්‍රී ලංකාව වෙත සම්ප්‍රාප්ත වී තිබුණි. මෙය 2013 වසරේ පැමිණි සංචාරකයන් පිරිසට සාපේක්ෂව 16% ක වැඩි වීමකි.

අගෝස්තු මාසයේ සංචාරකයන් සංඛ්‍යාවේ පහත බැසීමක් වාර්තා වුවද, අනෙකුත් සෑම මාසයකදීම සංචාරක පැමිණීම් ඉහළ නැගීමේ නැඹුරුතාව සාමාන්‍ය පරිදි අඛණ්ඩව පවත්වා ගැනීමට ශ්‍රී ලංකා සංචරණය සමත්ව තිබුණි. 2015 වසරේ 30% ක වර්ධනයක් වාර්තා කරමින් ඉන්දීය සංචාරකයන් 315,000 ක් මෙරටට ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) ඉලක්ක කරයි.

## පාරිභෝගික සහ සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

## SATTE සංචාරක සැණකෙළිය, නව දිල්ලිය, 2014 ජනවාරි 29 31

දකුණු ආසියාවේ ප්‍රමුඛ පෙළේ සංචාර සහ සංචාරක සැණකෙළිය වන SATTE 2014 ජනවාරි 29 31 දින දක්වා නවදිල්ලියේ ප්‍රගති මෛධාන් හි දී පවත්වනු ලැබීය. වර්ගමීටර් 54 ක භූමි ප්‍රමාණයක් තුළ ශ්‍රී ලාංකික සංචාරක ව්‍යාපාරික නියෝජිතයන් 12 දෙනෙකු සමඟ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) මෙම සැණකෙළියට සහභාගී වූ අතර රටින් පිටතට චාරිකා මෙහෙයවනු ලබන වෘත්තීය ගැණුම්කරුවන් මුණ ගැසීමේ පොදු වේදිකාවක් වශයෙන් මෙම සැණකෙළිය ක්‍රියාත්මක වූ අතර නව ව්‍යාපාරික සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීම සඳහා ශ්‍රී ලාංකික සංචාරක නියෝජිතයන් මෙන්ම චාරිකා මෙහෙයවන්නන් ද දිරිගැන්වීමට මෙම සැණකෙළිය මහෝපකාරී විය.

SATTE සංචාරක සැණකෙළිය, උතුරු ඉන්දියාවේ චාරිකා සහ සංචාරක කර්මාන්තය තුළ නව පුද්ගලයන් මුණ ගැසී නව ව්‍යාපාරික සම්බන්ධතා ස්ථාපනය කර ගැනීම සඳහා පවතින විශාලතම වේදිකාවක් ලෙස සැලකිය හැකිය. SATTE සංචාරක සැණකෙළිය සඳහා සහභාගී වන ප්‍රදර්ශකයන් හා අන්තර්ජාතික හා දේශීය ගැණුම්කරුවන් ඇතුළු නරඹන්නන් සංඛ්‍යාව වසරින් වසර ඉහළයන අතර වර්තමානය වන විට දකුණු ආසියාවේ සංචාර හා සංචාරක කර්මාන්තය

සඳහා වන විශාලතම සම්බන්ධතා ජාලය සහිත වේදිකාව වන්නේ SATTE සංචාරක සැණකෙළියයි. UBP පීඑල්සී හි අංශයක් වන UBM ඉන්දියා මගින් SATTE සංවිධානය කරයි. UBM පීඑල්සී යනු ලන්ඩනයේ කොටස් වෙළඳපොළේ ලැයිස්තු ගත වී ඇති ප්‍රමුඛ පෙළේ ගෝලීය ව්‍යාපාරික මාධ්‍ය ආයතනයක් වන අතර ප්‍රමුඛ පෙළේ සංචාරක ව්‍යාපාරික සංගම් වන TAAI, TAFI, ADTOI, ATTOI, හා IATO යන ආයතන සියල්ලේම සහාය මෙම ආයතනය වෙත ලැබී තිබේ. වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් ගැණුම්කරුවෝ හා ව්‍යාපාරික නරඹන්නෝ 7500 කට ආසන්න සංඛ්‍යාවක් 2014 වසරේ SATTE සංචාරක සැණකෙළිය සඳහා සහභාගී වූහ.

## OTM මුම්බායි, සංචාර හා සංචාරක සැණකෙළිය, 2014 පෙබරවාරි 07 සිට 09 දක්වා සහ OTM නව දිල්ලිය, 2014 පෙබරවාරි 13 සිට 15 වන දා දක්වා




OTM සංචාර හා සංචාරක සැණකෙළිය දශක දෙකකට අධික කාලයක් මුළුල්ලේ සිදු කෙරෙන ගෝලීය සංචාරක කර්මාන්තයේ නිරත පුද්ගලයන් අතර සම්බන්ධතා ශක්තිමත් කරන ඉන්දියාවේ විශාලතම සංචාරක ව්‍යාපාර සැණකෙළිය වශයෙන් සැලකිය හැකිය. ඉන්දියානු සංචාරක ව්‍යාපාරයේ නියෝජිතයන්, සංස්ථාපිත නිලධාරීන් සහ සාමාන්‍ය නරඹන්නන් සමබර ප්‍රමාණයකින් සහභාගී වන ඉන්දියාවේ පැවැත්වෙන එකම සංචාරක සැණකෙළිය වන්නේ ද OTM ප්‍රදර්ශනයයි. එමෙන්ම, මෙම සැණකෙළිය ඉන්දීය සංචාරක ව්‍යාපාරය, රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන සහ ප්‍රදර්ශනවලින් (MICE) සමන්විත වන සංචාරක කර්මාන්ත අංශය (කලින් සැලසුම් කරන ලද විශාල කණ්ඩායමක් යම් අරමුණක් සඳහා එකට රැස් කිරීම) සඳහා මෙන්ම ශ්‍රී ලංකා යන සංචාරක ගමනාන්තය, සංචාරකයන් වෙත අලෙවිකරණය කිරීම සඳහා පවතින විශිෂ්ටතම වේදිකාවක් විය. මුම්බායි හා නව දිල්ලිය ඉන්දියාවෙන් බැහැරව සංචාරයේ නිරත වන සංචාරකයින් විශාල වශයෙන් සිටින විශාලතම වෙළඳපොළ යුගලය වශයෙන් නම් කළ හැකිය. ඉන්දියාවෙන් බැහැරව සංචාරයේ නිරත වන සංචාරක සංඛ්‍යාවෙන් අර්ධයකට අධික සංඛ්‍යාවක් මෙම වෙළඳපොළ ද්විත්වය ඔස්සේ රටින් බැහැරව යති. චාරිකා මෙහෙයවන්නන්, සංචාරක නියෝජිතයන්, හෝටල්කරුවන් සහ ගුවන් සමාගම් සමඟ මෙම සංචාරක සැණකෙළියට පැමිණෙන අමුත්තන්ට සම්බන්ධතා ඇති කර ගත හැකි වූ අතර එමඟින් ඔවුන්ට අවශ්‍ය තොරතුරු ලබාගෙන දේශීය හා අන්තර්ජාතික සංචාර සඳහා සැලසුම් සකස් කර ගත හැකි විය. සංචාරවල නිරතවීමේ හැකියාවෙන් යුත් සංචාරකයින් හා සංචාරක කර්මාන්තයේ සාමාජිකයන් විශාල වශයෙන් OTM සැණකෙළිය නැරඹීමට පැමිණි අතර ඔවුන් සමඟ ඍජු සම්බන්ධතා ඇතිකර ගනිමින් පෙර නොවූ විරූ අලෙවිකරණ අවස්ථා අනාවරණය කර ගැනීමට මෙම සැණකෙළිය මගින් ප්‍රදර්ශකයන්ට අවස්ථාව සලසා දී තිබුණි.

මෙම OTM සැණකෙළිය පෙබරවාරි 7 9 දක්වා කාල සීමාව තුළ මුම්බායේ දී පවත්වනු ලැබූ අතර 2014 පෙබරවාරි 13 15 දක්වා කාලසීමාව තුළ නව දිල්ලියේ දී ද පවත්වනු ලැබීය. මෙම සැණකෙළි භූමිය තුළ ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා සංචාරක සංචරණයේ ප්‍රදර්ශන කුටිය තුළ ශ්‍රී ලංකාවේ ජල ක්‍රීඩා, කොළඹ නගරය, වෙරළ තීර, වන සතුන් හා උත්සව අවස්ථාවල විචිත්‍රවත් දර්ශන අතිශයින්ම චමත්කාරජනක ආකාරයෙන් ප්‍රදර්ශනය කර තිබුණි. ජාතික සංචාරක සංවිධානවල නියෝජිතයෝ, රාජ්‍ය චාරිකා මෙහෙයුම්කරුවෝ, චාරිකා හා සංචාරක නියෝජිතයෝ සහ මාධ්‍යගත සංචාරක නියෝජිතයෝ මෙම ප්‍රදර්ශන කුටිය වෙත ආකර්ෂණය වූ විශාල අමුත්තන් පිරිස අතර වූහ. OTM 2014 සැණකෙළිය සඳහා අන්තර්ජාතික ප්‍රජාව නියෝජනය කරමින් රුසියාව, මැලේසියාව, ස්විට්සර්ලන්තය, චීනය, ඊජිප්තුව, තායිලන්තය, මාලදිවයින, චීනය, ස්විඩනය සහ ආර්ජන්ටිනාව යනාදී රටවල නියෝජිතයන් ද සහභාගී වී සිටියහ.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) ශ්‍රී ලංකාවේ සංචාරක සහ හෝටල් කර්මාන්තය නියෝජනය කරන සමාගම් 26 ක නියෝජිතයන් සමඟ අනුගාමීව තෙවන වරට ද මුම්බායේ හා නවදිල්ලියේ පැවැත් වූ OTM සැණකෙළි සඳහා සහභාගී විය. මුම්බායේ ශ්‍රී ලංකා දූත මණ්ඩලය හා නව දිල්ලියේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් කාර්යාලය මෙම උත්සව අවස්ථා වෙනුවෙන් සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංචරණයට පහසුකම් සලසනු ලැබීය.

### සුරාජ්කුන්ඩ් අන්තර්ජාතික අත්කම් මේලා සැණකෙළිය 2014 (2014 පෙබරවාරි 01 සිට 15 වන දා දක්වා)

හර්යානා ප්‍රාන්ත රජයේ සංචාරක අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද සුරාජ්කුන්ඩ් අන්තර්ජාතික අත්කම් මේලා සැණකෙළිය ෆරිඩාබාද් හි දී 2014 පෙබරවාරි 01 15 දක්වා පවත්වනු ලැබීය. මෙම ජනප්‍රිය වාර්ෂික උත්සවය ලොව විශාලතම අත්කම් ප්‍රදර්ශනය වූ අතර රටවල් 23 ක් ඔවුන්ගේ අත්කම් භාණ්ඩ, රෙදිපිළි, සංස්කෘතිය, කලා, ආහාර හා සංචාරක විභවය ලොවට ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් මෙම සැණකෙළියට සහභාගී වූහ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධනය කාර්යාංශය (SLTPB) විසින් මෙම සැණකෙළිය සඳහා සහභාගී වීම සඳහා ජාතික අත්කම් කවුන්සලයට සහාය දක්වනු ලැබීය.

### ඉන්දියාවේ මුම්බායි නගරයේ පැවැත් වූ ශ්‍රී ලංකා ආහාර උළෙල, 2014 මාර්තු 07 සිට 14 වන දා දක්වා

මුම්බායි නගරයේ ට්‍රයිඩන්ට් හෝටලයේ ප්‍රන්පිපාර්නි රෙස්ටුරන්ට් හි දී පැවැත් වූ ශ්‍රී ලංකා ආහාර උළෙල මුම්බායේ ට්‍රයිඩන්ට් හෝටලයේ සහ ශ්‍රී ලංකාවේ ගල්කිස්ස මහා හෝටලයේ සහයෝගීතාව ලබා ගනිමින් මුම්බායේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය මගින් සංවිධානය කරනු ලැබීය. 'ගමනාන්ත ප්‍රවර්ධනය' යන තේමාව යටතේ ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම ආහාර උළෙල පැවැත් වූ අතර සම්ප්‍රදායික මෙන්ම සැබෑ ශ්‍රී ලාංකික ආහාර සහ ඉවුම් පිහුම් ක්‍රම එම උළෙල දී නරඹන්නන් වෙත ඉදිරිපත් කරනු ලැබීය.

### OTM – හයිද්‍රාබාද් සංචාර හා සංචාරක සැණකෙළිය 2014 ජූලි 11 13 දක්වා හයිද්‍රාබාද්හි හයිටෙක්ස් ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබීය.

ඉන්දියාවේ මෙන්ම විදේශ සංවිධානවල නිෂ්පාදන හා සේවා වාර්ෂිකව ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව සලසමින් හයිද්‍රබාද් හි පැවැත්වෙන මෙම OTM සංචාර හා සංචාරක සැණකෙළිය සංචාර හා සංචාරක කර්මාන්තය වෙනුවෙන් ඉන්දියාවේ පවත්වනු ලබන ප්‍රධාන පෙළේ ප්‍රදර්ශනයකි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) ශ්‍රී ලංකාවේ සංචාර හා සංචාරක කර්මාන්තයේ නියෝජිතයන් 09 දෙනෙකු සමඟ හයිද්‍රාබාද් හි පැවැත්වූ OTM සංචාර හා සංචාරක 2014 සැණකෙළිය සඳහා සහභාගී විය. එමෙන්ම, මෙහිදී පැවැත් වූ සම්මාන ප්‍රදානෝත්සවයේ දී, ඉතාම උත්කර්ෂවත් ලෙස සරසා තිබූ ප්‍රදර්ශන කුටිය වශයෙන් ශ්‍රී ලංකා සංචරණයේ ප්‍රදර්ශන කුටිය පිදුම් ලැබීය.

### IITM - බැංගලෝරය 2014 ජූලි 18 20 වන දා දක්වා.

ද්විපාර්ශ්වික ව්‍යාපාරික සාකච්ඡා පැවැත්වෙන ඉන්දියාවේ විශාලතම සංචාරක කර්මාන්ත සැණකෙළියක් වූ IITM - බැංගලෝරය සැණකෙළිය වාර්තාගත නරඹන්නන් පිරිසක් බැංගලෝරයට ආකර්ෂණය කර ගනිමින්, ඒ වෙත පවතින පිළිගැනීම නව මානයකට ඔසවා තබමින් නිමාවට පත් විය. සංචාරක කර්මාන්තයේ නිරතව සිටින අමුත්තන් 2,540 ක් ද, එයට අමතරව, 7,040 කට අධික සාමාන්‍ය අමුත්තන් පිරිසක් ද මෙම සැණකෙළිය නැරඹීම සඳහා පැමිණ තිබුණි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සංචාරක කර්මාන්ත සමාගම් 15 ක් සමඟ වර්ග මීටර් 27 ක භූමි ප්‍රමාණයක් තුළ මෙම සැණකෙළියට සහභාගී විය. IITM – 2014 බැංගලෝර් සැණකෙළිය සංචාර, සංචාරක කර්මාන්තය, ආගන්තුක සත්කාරය, විවේකය හා අනෙකුත් ආශ්‍රිත කර්මාන්ත ප්‍රදර්ශනය කරමින් ඉන්දියාවේ පැවැත්වෙන ප්‍රධාන පෙළේ සැණකෙළියකි. සංචාර ව්‍යාපාරයේ නියෝජිතයන්, සංස්ථාපිත ගැණුම්කරුවන් මෙන්ම ඉහළ ක්‍රය ශක්තියෙන් යුත් පාරිභෝගිකයන් ද, සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන් ද එකම ස්ථානයක දී මුණ ගැසීමට සැලැස්වීම මෙම ප්‍රදර්ශනයේ අරමුණ විය.

### 3.1.2 එක්සත් රාජධානිය




රූපය 5 මාසික සංචාරක පැමිණීම් 2013 සහ 2014 (SLIDAසංඛ්‍යාන වාර්තාව 2014)

2014 වසරේ දී එක්සත් රාජධානියේ සිට සංචාරකයන් 144,168 ක පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. 2013 වසරේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 5% ක වර්ධනයකි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB)

එක්සත් රාජධානියේ ප්‍රවර්ධන වැඩසටහන් සාධනීය අයුරින් ක්‍රියාත්මක කිරීම තුළින්, 2013 වසරේ අප්‍රේල් මාසයේ සංචාරක පැමිණීම අඩුවීම සාර්ථකව මැඩ පවත්වා ගනිමින් 2014 අප්‍රේල් මාසයේ දී සංචාරකයන් වැඩි සංඛ්‍යාවක් මෙරටට ගෙන්වා ගැනීමට සමත් විය. ඒ හා සමානව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) මගින් එක්සත් රාජධානියේ දී ක්‍රියාත්මක කළ ඵලදායක පාරිභෝගික ප්‍රවර්ධන කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන්, 2014 ජූලි සිට අගෝස්තු දක්වා ද, ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ ද එක්සත් රාජධානියේ සිට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබුණි. සමාලෝචිත වසරේ ඒ ඒ මාසය තුළ එක්සත් රාජධානියේ සිට ශ්‍රී ලංකාව වෙත සංචාරක පැමිණීම් පහත දක්වා ඇත.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 11,350 | 12,896 |
| පෙබරවාරි | 13,604 | 14,316 |
| මාර්තු | 13,590 | 11,823 |
| අප්‍රේල් | 8,642 | 12,380 |
| මැයි | 6,567 | 6,918 |
| ජූනි | 7,642 | 7,790 |
| ජූලි | 16,424 | 16,692 |
| අගෝස්තු | 15,519 | 15,532 |
| සැප්තැම්බර් | 9,356 | 8,983 |
| ඔක්තෝබර් | 9,850 | 10,112 |
| නොවැම්බර් | 9,663 | 10,730 |
| දෙසැම්බර් | 15,209 | 15,996 |
| එකතුව | 137,416 | 144,168 |

වගුව 3 එක්සත් රාජධානියේ සිට ශ්‍රී ලංකාවට ඒ ඒ මාසය තුළ පැමිණි සංචාරකයන් සංඛ්‍යාව (**SLIDA** සංඛ්‍යාන වාර්තාව 2014)

## පාරිභෝගික හා සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

## TRADE – UNITE MEET, සංචාරක ව්‍යාපාරික සැණකෙළිය, එක්සත් රාජධානිය, 2014 මාර්තු

UNITE වාර්ෂික ඉන්දියානු සාගර සැණකෙළිය මාර්තු මාසයේ දී ලන්ඩන් නගරයේ මර්මේඩ් සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේ දී පැවැත් වූ අතර සංචාරක ව්‍යාපාරික ගැණුම්කරුවන් සැලකිය යුතු ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට එම සැණකෙළියට හැකිවිය. හෝටල්, ගුවන් සමාගම්, සංචාරක මණ්ඩල, සංගම්, බිම් මට්ටමේ මෙහෙයුම්කරුවන් සහ කුලී සමාගම් 500 කට අධික පිරිසක් නියෝජනය කරමින් ප්‍රදර්ශකයන් ලෙස මෙම ප්‍රදර්ශනයට සහභාගී වූ සමාගම් 80 ක දූත මණ්ඩල 110 ක් අතරට ශ්‍රී ලංකා සංචාරක සංවරණය ද ඇතුළත් විය.

## Consumer – RIHALA MEANING JOURNEY සැණකෙළිය

**Consumer – RIHALA MEANING JOURNEY** සැණකෙළිය හලාල් චාරිත්‍රයට ගරු කරන සංචාරක ගමනාන්තවල විශිෂ්ටත්වය ප්‍රදර්ශනය කිරීම සඳහා පැවැත්වෙන පාරිභෝගික සංචාරක සැණකෙළියකි. 2014 මාර්තු මාසයේ දී ලන්ඩනයේ මයිෆෙයාර් හි අරාබිබ්‍රිතාන්‍ය වාණිජ මණ්ඩලයේ දී පැවැත් වූ ප්‍රථම රීහාල සැණකෙළිය සඳහා නොමිලේ සහභාගී වීමේ අවස්ථාව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ (SLTPB) එක්සත් රාජධානි ශාඛා කාර්යාලයට ලබා දී තිබුණි. අද්විතීය සංචාරක අත්දැකීම් ලබාගත හැකි ගමනාන්ත පිළිබඳ අනාවරණය කර ගැනීමට බලාපොරොත්තු වන ධනවත් මුස්ලිම් සංචාරකයන්ගෙන් සමන්විත, වර්ධනය වෙමින් පවත්නා වෙළඳපොළක් ලෙස හඳුනා ගන්නා ලද මෙම සංචාරක පිරිස වෙත අග්‍රගන්‍ය සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම මෙහි අභිලාෂය විය.

## ගමනාන්ත පුහුණු වැඩසටහන LYCA HOLDINGS, 2014 මාර්තු මාසය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ (SLTPB) එක්සත් රාජධානි ශාඛා කාර්යාලය මගින් අනුග්‍රහය දක්වන ලද ශ්‍රී ලාංකික පුහුණු වැඩසටහන ශ්‍රී ලංකාවේ සංචාර අලෙවි කිරීමේ නිරත වන මාධ්‍යගත නිවාඩු වෙළඳපොළක් වන LYCA HOLDINGS ආයතනයේ දී පවත්වනු ලැබීය. මෙම සමාගම ලොව පුරා ගුවන් ගමන් හා නිවාඩු කාල තුළ සංචාරය කිරීම පිළිබඳ විශේෂඥ දැනුමකින් යුත් එක්සත් රාජධානියේ ශීඝ්‍රයෙන් වැඩි දියුණු වෙමින් පවතින විවේක සංචාර සමාගම් අතරින් එකකි. අඩු වියදම් ගුවන් ගමන් අවශ්‍ය වන පාරිභෝගිකයන්ගේ සිට සුඛෝපභෝගී සංචාරක අවශ්‍යතා සහිත පාරිභෝගිකයන් දක්වා පුළුල් පරාසයක වූ පාරිභෝගික පිරිසක් වෙනුවෙන් මෙම සමාගම සේවා සපයනු ලබයි.

## 50 + නිවාඩු සහ සංචාරක ප්‍රදර්ශනය ලන්ඩන් නුවර 2014 ජූලි 10 සිට 12 දක්වා

ලන්ඩනයේ ඔලිම්පියා හි දී ජූලි 10 12 දක්වා පැවැත් වූ ලන්ඩන් නිවාඩු හා සංචාරක ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ එක්සත් රාජධානි ශාඛා කාර්යාලය සහභාගී විය. මෙම සැණකෙළියට පාරිභෝගිකයන් 12,000 ක් පමණ ආකර්ෂණය කර ගත හැකි විය.

## ලෝක සංචාරක වෙළඳපොළ(WTM) 2014 නොවැම්බර් 3 6 දක්වා එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර



සංචාර සහ සංචාරක ව්‍යාපාරයේ උන්නතිය සඳහා පැවැත්වෙන ප්‍රමුඛ පෙළේ ගෝලීය සැණකෙළියක් වන ලෝක සංචාරක වෙළඳපොළ (WTM) 2014 නොවැම්බර් 3 6 දක්වා එක්සත් රාජධානියේ ලන්ඩන් නගරයේ එක්සෙල් ප්‍රදර්ශන ශාලාවේ දී පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) දේශීය සංචාරක ව්‍යාපාරික සමාගම් 58 ක් සමග වර්ගමීටර් 250 ක භූමි ප්‍රමාණයක් තුළ මෙම ගෝලීය සැණකෙළියට සහභාගි විය. ලෝක සංචාරක වෙළඳපොළ (WTM) 2014 සැණකෙළිය ලොව පුරා සංචාර හා සංචාරක කර්මාන්තය වෙනුවෙන් ව්‍යාපාරික ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීම සඳහා දින හතරක කාලයක් වෙන් කර දෙන ප්‍රමුඛ පෙළේ ගෝලීය සැණකෙළියකි. මෙම දැකුම්කළු දිවයිනේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙන්ම 2015 වසර තුළ හා ඉන් ඔබ්බට සංචාරක කර්මාන්තයේ අනාගත සංවර්ධනය පිළිබඳව අතිශයින්ම වැදගත් පණිවුඩ මුළු ලොවටම සන්නිවේදනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සංචාරක කර්මාන්තයේ හවුල්කරුවන් ද සමග මෙම ප්‍රදර්ශනයට සහභාගී විය. ලෝකයේ සෑම ප්‍රදේශයකින්ම පැමිණි 30,000 කට අධික නරඹන්නන් සංඛ්‍යාවක්, ව්‍යාපාරික හවුල්කරුවන් (ප්‍රදර්ශකයන්) 5000 ක් සහ පුවත්පත් කලාවේදීන් 3000 කට අධික පිරිසක් ආකර්ෂණය කර ගැනීමට ලෝක සංචාරක වෙළඳපොළ (WTM) සැණකෙළිය තුළින් අවස්ථාව සැලසුණි. චාරිකා මෙහෙයවන්නන් 200 කට අධික සංඛ්‍යාවක් ඇතුළු සංචාරක නියෝජිතයින් 1000 කට අධික සංඛ්‍යාවක් ද මෙම ලෝක සංචාරක වෙළඳපොළ (WTM) සැණකෙළියට සම්ප්‍රාප්ත වූහ.



ශ්‍රී ලංකා සංචාරක සංචරණය මෙවර සැණකෙළිය සඳහා අද්විතීය ශ්‍රී ලාංකික වනජීවී ආකර්ෂණයක් වන දේශීය අලි ඇත් පවුලේ ආකෘතීන් සහිත වන ජීවී තේමාවක් ශ්‍රී ලාංකික ප්‍රදර්ශන කුටියට ප්‍රවේශ වන දොරටුවේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර තිබුණි. ශ්‍රී ලාංකික අලි ඇතුන් හා තල්මසුන් නිරූපණය කරන දෙපස ගස්වැල්වලින් පිරුණු පුළුල් නාගරික වීදියක් ප්‍රදර්ශනය කළ බැනරය ආසියානු ප්‍රදර්ශන ශාලාව වෙත ප්‍රවේශ වීමේ දොරටුව වෙත සංචාරක ආකර්ෂණය දිනා ගැනීමේ ප්‍රධානම මෙවලමක් විය.

ප්‍රදර්ශන ශාලාව අභ්‍යන්තරයේ මෝස්තර නිර්මාණය කිරීම සඳහා ලබා දී තිබූ උපදෙස්වලට අනුකූලව ශ්‍රී ලාංකික ප්‍රදර්ශන කුටිය පිළියෙළ කර තිබුණි. ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය තුළ පැවැත් වූ මාධ්‍ය සාකච්ඡාව සඳහා සහභාගී වූ පිරිස වෙත ඉතා වටිනා නිල් මැණික් පරිත්‍යාග කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංචරණය කටයුතු කරනු ලැබීය. 'ආසියාවේ ආශ්චර්ය' යන ප්‍රධාන තේමාව යටතේ ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ද, මාධ්‍ය සාකච්ඡාව උපයෝගී කර ගනිමින් ලොව පුරා සංචාරකයන් වෙනුවෙන් සූදානම්ව තිබෙන ඉතා උත්කෘෂ්ට ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ද ඉතා සුවිශේෂී මාධ්‍ය සම්මුඛ සාකච්ඡා ගණනාවක් පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය තුළ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික නර්තන විශේෂාංග ප්‍රදර්ශනය කිරීම මගින් සංස්කෘතික වශයෙන් සාරවත් ශ්‍රී ලාංකික සම්ප්‍රදායන් මොහොතකට හෝ දැක බලා ගැනීමේ මාහැඟි අවස්ථාව නරඹන්නන්ට ලැබුණි. එයට අමතරව, ලංකා තේ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ද ප්‍රදර්ශනය අතරතුර පවත්වනු ලැබූ අතර එහි දී ලංකා තේ කෝප්පයක ඉම්හිරි නැවුම් රසය විඳ ගැනීමේ අතිශය දුර්ලභ අවස්ථාව ද ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියට පැමිණි නරඹන්නන්ට ලැබී තිබුණි.



## ප්‍රචාරණ ව්‍යාපාරය

### (අ) කුලී රථවල සන්නම් නාමය යොදා ගමනාන්තය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රචාරණ ව්‍යාපාරය



එක්සත් රාජධානියේ ප්‍රධාන නගර තුනේ ශ්‍රී ලාංකික වෙළඳ නාමය පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීමේ ක්‍රියාකාරකම් මෙහෙයවීමේ දී සහ අප දිවයින ඉතා අලංකාර සංචාරක ගමනාන්තයක් ලෙස හඳුන්වා දීමට සැලසුම් සකස් කිරීමේ දී, කුලී රථවල ප්‍රචාරණ දැන්වීම් යෙදීම අතිශයින්ම ප්‍රබල මාධ්‍යයක් වශයෙන් උපයෝගි කරගත හැකි බව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ස්ථිර වශයෙන්ම තහවුරු කර ඇත. එළිමහන් ප්‍රචාරක ක්‍රමෝපායක් වශයෙන් කුලී රථ උපයෝගී කර ගනිමින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම තුළින් මෙම උත්කෘෂ්ට ප්‍රචාරණ ව්‍යාපාරය වෙත ආකර්ෂණය කර ගත හැකි ඉතා අගනා ප්‍රේක්ෂකයින් විශාල සංඛ්‍යාවක් වෙත අපගේ පණිවුඩය පහසුවෙන් සහ පැහැදිලිව සන්නිවේදනය කිරීමේ අවස්ථාව සැලසේ. 2014 තුළ කුලී රථ 450 ක් වෙළඳ සලකුණ යොදා මැන්චෙස්ටර්, බර්මින්හැම් සහ ලන්ඩන් යන එක්සත් රාජධානියේ විශාලතම නගර තුන වෙත යවා මෙම ප්‍රචාරණ ව්‍යාපාරය දියත් කරනු ලැබීය.

මෙම ව්‍යාපාරයේ පළමු අදියර වශයෙන් කුලී රථ 300 ක් ලන්ඩන් නගරයට පිටත් කර හරිමින් මෙම ව්‍යාපෘතිය අගෝස්තු 4 වනදා ලන්ඩනයේ දී ආරම්භ කරනු ලැබීය. 'ශ්‍රී ලංකාව ඔබගේ පැමිණීම අපේක්ෂා කරයි' යන පාඨය සමඟ ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන සංචාරක ආකර්ෂණ ප්‍රවර්ධනය කරමින් ඒවායේ චමත්කාරජනක දෘශ්‍ය ප්‍රතිමූර්ති කුලී කැබ් රථවල විශාල පැති, පිටුපස ආසන ආවරණ හා කුලී රථ කුවිතාන්සිවල ප්‍රදර්ශනය කරමින් කැබ්රථ අතිවිශාල සංඛ්‍යාවක් එක් එක් නගරවල ප්‍රදර්ශනය කිරීම සඳහා යොදවන ලදී.

මෙම ව්‍යාපාරය සම්පූර්ණ සති 12 ක කාලයක් එක්සත් රාජධානියේ දී පවත්වනු ලැබීය. ආසියාවට ප්‍රවිශ්ට වීමේ දොරටුව ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳ සන්නම් නාමය පැහැදිලිව සලකුණු කරන ලද ඒ ඒ නගරයේ කුලී කැබ් රථ උපයෝගී කර ගනිමින් පහසුවෙන් හා වඩාත් සුමට ලෙස මෙම ව්‍යාපාරය දියත් කිරීමට හැකි විය. ඵලදායි අලෙවිකරණයක් සඳහා ඉහළ බලපෑමක් සිදුකළ හැකි ප්‍රවේශයක් වන කුලී රථ ප්‍රචාරණය, ඉලක්ක කර ගත් නගරයක් තුළ ව්‍යාපාරයක් ප්‍රවර්ධනය කිරීමේ හෝ පණිවුඩයක් සන්නිවේදනය කිරීමේ උත්කෘෂ්ට මාර්ගයක් වශයෙන් යොදා ගත හැකි වේ.

ප්‍රචාරක කටයුතු, රට අභ්‍යන්තරයට රැගෙන යාම තුළින් සහ මගී ජනතාව මෙන්ම පදිකයන් ද වෙනත් වාහනවල ගමන් කරන පුද්ගලයන් ද ඉලක්ක කිරිම තුළින් වඩාත් පුළුල් ජන කණ්ඩායමක් වෙත සමීප වීම තහවුරු කරමින් මෙම ව්‍යාපාරය තවදුරටත් ශක්තිමත් කිරීමට සැලසුම් කරන ලදී. එක්සත් රාජධානියේ තෝරාගත් ස්ථානවල ක්‍රියාත්මක කරන ලද ප්‍රචාරණ ව්‍යාපාරය මගින් එක්සත් රාජධානියේ විශාලතම හා ධනවත්ම ප්‍රේක්ෂකයින් සමූහය වෙත අතිවිශාල සාධනීය බලපෑමක් සිදු කළ හැකි විය.



### (ආ) උමං මාර්ගවල සිදු කළ ප්‍රචාරක ව්‍යාපාරය

එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර පැවැත් වූ සංචාරක හා ව්‍යාපාරික සැණකෙළිය වූ ලෝක සංචාරක වෙළඳපොළ (WTM) සංචාරක සැණකෙළිය හා සමගාමීව උමං මාර්ගවල පිහිටි ස්ථාන 25 ක් ආවරණය කරමින් මධ්‍යම ලන්ඩනයේ දී මාස 3 ක (සති දොළහක) කාල පරිච්ඡේදයක් සඳහා සුවිශේෂ ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීමට ශ්‍රී ලංකා සංචරණය කටයුතු කරන ලදී. එක්සත් රාජධානියේ පැවැත් වූ ලෝක සංචාරක වෙළඳපොළ (WTM) සංචාරක සැණකෙළියට සමගාමීව 2014 ඔක්තෝබර් 29 දිනෙන් ආරම්භ වී 2015 ජනවාරි 29 වන දා දක්වා මෙම ව්‍යාපාරය පවත්වනු ලැබීය.

විශේෂයෙන්ම, ග්‍රීන් පාර්ක්, කෝවෙන්ට් ගාර්ඩන්, හොල්බර්න්, බැංක්, ලෙස්චර් චතුරස්‍රය, ඔක්ස්ෆර්ඩ් සර්කස්, පිකඩලී සර්කස් හා ටෝර්ටන්හැම් කෝර්ට් ආදී මධ්‍යම ලන්ඩනයේ ප්‍රධාන නැවතුම්පළවල මෙම උමං මාර්ග ප්‍රචාරක ව්‍යාපාරය ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාවේ සංචාරය කළ හැකි එක්සත් රාජධානියේ සංචාරකයන් ඉලක්ක කරමින් මෙම ව්‍යාපාරය මගින් ශ්‍රී ලංකාවේ වෙරළතීරවල වඩාත් ආකර්ෂණීය පිළි රූ ද, අලි ඇතුන්, දිවියන්, තල්මසුන්, ඩොල්පින්, ආදී සතුන්ගේ පිළි රූ ද නිරූපණය කරනු ලැබීය.

## 3.1.3 චීනය




රූපය 5 මාසික සංචාරක පැමිණීම් 2013 සහ 2014 (SLIDAසංඛ්‍යාන වාර්තාව 2014)

ශ්‍රී ලංකාවේ තෙවන විශාලතම ප්‍රභවස්ථාන වෙළඳපොළ ලෙස සැලකෙන චීනයෙන් සංචාරකයන් 1,28,166 ක් 2014 වසර තුළ ශ්‍රී ලංකාවේ සංචාරය කර තිබුණි. 2013 සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 68% ක වර්ධනයක් වශයෙන් වාර්තා ගත වී ඇති අතර අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා කාලසීමාව තුළ වැඩිම සංචාරක පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කර තිබුණි.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 3,328 | 10,779 |
| පෙබරවාරි | 6,296 | 10,319 |
| මාර්තු | 3,018 | 7,700 |
| අප්‍රේල් | 2,959 | 8,005 |
| මැයි | 2,715 | 7,082 |
| ජූනි | 3,707 | 8,345 |
| ජූලි | 5,576 | 15,178 |
| අගෝස්තු | 5,951 | 14,274 |
| සැප්තැම්බර් | 5,804 | 13,312 |
| ඔක්තෝබර් | 5,388 | 11,894 |
| නොවැම්බර් | 4,828 | 10,878 |
| දෙසැම්බර් | 4,718 | 10,400 |
| එකතුව | 54,288 | 128,166 |

4 වන වගුව 2014 වසරේ මාසික සංචාරක පැමිණීම් චීනය (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

### පාරිභෝගික හා සංචාරක සැණකෙළි සඳහා සහභාගිත්වය

### බීජිං අන්තර්ජාතික සංචාරක එක්ස්පෝ (BITE) සැණකෙළිය, 2014 ජුනි 22 29 දක්වා බීජිං නගරය

බීජිං අන්තර්ජාතික සංචාරක එක්ස්පෝ (BITE) සැණකෙළිය සංචාරක කර්මාන්තය පිළිබඳ බීජිං මහ නගර සභා කොමිසම සහ සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන කළමනාකරණ සේවා ආයතනය ඒකාබද්ධව සංවිධානය කරන ලද වාර්ෂික සැණකෙළියකි. මෙය 2014 ජුනි 27 29 දක්වා බීජිං හි චීන ජාතික සම්මුති මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සමඟ සංචාරක ව්‍යාපාරික සමාගම් 40 ක් මෙම සැණකෙළියට සහභාගී වූහ

### ග්වොන්ජෝවු නගරයේ අන්තර්ජාතික සංචාරක සැණකෙළිය (GITF) චීනය පෙබරවාරි 28 මාර්තු 01 දක්වා, චීනය



ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) දේශීය සංචාරක ව්‍යාපාරික සමාගම් 20 ක් හා ශ්‍රී ලංකන් ගුවන් සමාගම සමඟ එක්ව පෙබරවාරි 28 සිට මාර්තු 01 වනදා දක්වා ග්වොන්ජෝවු නගරයේ පැවැති (GITF) අන්තර්ජාතික සංචාරක සැණකෙළිය සඳහා ද සහභාගී විය. තවද, දේශීය සංචාරක සමාගම් හා චීන සංචාරක නියෝජිතයන් 150 කට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් ෂෙන්ජෑන් හා ග්වොන්ජෝවු නගරවල දී පෙබරවාරි 24 හා 26 දිනවල මාර්ග දක්ම සංචාරක ප්‍රදර්ශන ද පවත්වනු ලැබීය.

මෙම වර්ෂය තුළ, 2014 (GITF) සැණකෙළියට අතිරේක වශයෙන්, ශ්‍රී ලංකාවේ සංචාරක ගමනාන්ත කෙරෙහි විශේෂ අවධානය යොමු කරවමින් ශ්‍රී ලංකාවට සංචාරකයන් වැඩි වැඩියෙන් ආකර්ෂණය කර ගැනීම සඳහා ද, රටේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ද, චීනයේ දකුණු කොටසේ පිහිටි ග්වොන්ජෝවු හා ෂෙන්ජෑන් නගරවල දී ප්‍රධාන පෙළේ සංචාරක ප්‍රවර්ධන මාර්ග දක්ම ප්‍රදර්ශන දෙකක් ශ්‍රී ලංකාව මගින් සංවිධානය කරන ලදී.

ග්වොන්ජොවු නගරයේ පෙබරවාරි 26 වනදා පැවැත් වූ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මාර්ග දැක්ම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ශ්‍රී ලාංකික සංචාරක නියෝජිතයෝ19 දෙනෙක් සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම ද, චීනයේ සංචාරක නියෝජිතයෝ 80 දෙනෙක් ද සහභාගී වූහ.

පෙබරවාරි 24 වන දින පැවැත්වූ ග්වොන්ජොවු මාර්ග දැක්ම ප්‍රදර්ශනය හා සමගාමීව පැවැත් වූ ෂෙන්ජෑන් මාර්ග දැක්ම ප්‍රදර්ශනයට ශ්‍රී ලාංකික සංචාරක නියෝජිතයෝ 16 දෙනෙක් හා චීන සංචාරක නියෝජිතයෝ 50 දෙනෙක් සහභාගී වූහ.

## චීනයේ ෂෙන්ජෑන් හා ග්වොන්ජොවු නගරවල පැවැත් වූ සංචාරක මාර්ග දැක්ම ප්‍රදර්ශනය



ෂෙන්ජෑන් නගරයේ පැවති මෙම මාර්ග දැක්ම ප්‍රදර්ශනය සඳහා තානාපතිතුමාගේ සහභාගිත්වයට අමතරව, ෂෙන්ජෑන් නගරයේ සංස්කෘතික, ක්‍රීඩා හා සංචාරක කර්මාන්ත පිළිබඳ නාගරික කාර්යාංශයේ කොට්ඨාශ ප්‍රධානි, චෙන් බී මහතා ද ෂෙන්ජෑන් නගරයේ සංචාරක නියෝජිතායතනවල සහ සංචාරක මාධ්‍ය ආයතනවල නියෝජිතයෝ 90 දෙනෙක් ද සහභාගී වූහ.





ග්වොන්ජොවු නගරයේ පැවති මාර්ග දැක්ම ප්‍රදර්ශන වැඩසටහන් ෂෙන්ජෑන් නගරයේ පැවති වැඩසටහන්වලට බොහෝ දුරට සමාන විය. කෙසේවුවද, ග්වොන්ජොවු නගරයේ පැවති මාර්ග දැක්ම සංචාරක ප්‍රදර්ශන වැඩසටහන් සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පැවති බව නිරීක්ෂණය කළ හැකි විය.

ශ්‍රී ලාංකික චාරිකා මෙහෙයුම්කරුවන් 19 දෙනෙකු හා සාකච්ඡා පැවැත්වීම සඳහා ග්වොන්ජොවු නගරයේ හි සංචාරක මෙහෙයුම්කරුවන් 80 දෙනෙක් සහ සංචාරක මාධ්‍ය සමාගම් 10 ක් නියෝජනය කරමින් නියෝජිතයෝ 128 දෙනෙක් මෙම මාර්ග දැක්ම සංචාරක ප්‍රදර්ශනයට සහභාගී වූහ. චීනයේ පැවති ශ්‍රී ලංකා සංචාරක මාර්ග දැක්ම ප්‍රදර්ශනය සඳහා සංචාරක නියෝජිතයන් 80 දෙනෙකු නියෝජනය කරමින් නියෝජිතයන් 100 දෙනෙකුට අධික සංඛ්‍යාවක් සහභාගී වීමේ ඓතිහාසික වාර්තාව ඉහත වාර්තාගත සහභාගීත්වය හේතුවෙන් බිඳී යාම විශේෂයෙන් කැපී පෙනුණි.



## ලෝක සංචාරක සැණකෙළිය, ශැංහයි නගරය 2014 මැයි 09 11 දක්වා

ශැංහයි නාගරික සංචාරක පරිපාලනය සමඟ එක්ව සංවිධානය කරන ලද වාර්ෂික උත්සවය වන ලෝක සංචාරක සැණකෙළිය 2014 මැයි 9 11 දක්වා කාල සීමාව තුළ ශැංහයි නගරයේ දී පවත්වනු ලැබීය. සංචාරය කිරීමේ හැකියාවෙන් යුත් මහජනතාව සමඟ චීන සංචාරක ගැණුම්කරුවන් 750 කට අධික සංඛ්‍යාවක් හා විදේශීය අමුත්තන් හා මාධ්‍යවේදීන් ද මෙම සැණකෙළියට සහභාගී වූ අතර ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සංචාරක ව්‍යාපාර සමාගම් 07 ක් සමඟ මෙම සැණකෙළියට සහභාගී විය.

## අතිදැවැන්ත ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ශැංහයි නගරයේ දී ශ්‍රී ලංකාව විශිෂ්ටත්වයට පත්වෙයි

### (අ) මාධ්‍ය සාකච්ඡාව හා ශ්‍රී ලාංකික රාත්‍රිය

අති දැවැන්ත ප්‍රවර්ධන ව්‍යාපාරය 'ශැංහයි නගරයේ දී ශ්‍රී ලංකාව විශිෂ්ඨත්වයට පත්වෙයි' යන තේමාවෙන් අතිදැවැන්ත ප්‍රවර්ධන ව්‍යාපාරයක් ශැංහයි නගරයේ පීඩොංග් ප්‍රදේශයේ පිහිටි ෂැංග්‍රිලා හෝටලයේ දී ආරම්භ කරනු ලැබීය. 2014 ජූලි 01 වන දින මේ සම්බන්ධයෙන් අති විශාල මාධ්‍ය සාකච්ඡාවක් පවත්වනු ලැබූ අතර චීන ජනමාධ්‍ය නියෝජනය කරමින් 120 කට අධික මාධ්‍යවේදීන් සංඛ්‍යාවක් මෙම මාධ්‍ය සාකච්ඡාවට සහභාගී වී තිබුණි. ශ්‍රී ලාංකික නර්තන සංදර්ශන මගින් මෙම මාධ්‍ය සාකච්ඡාවට වර්ණවත් බවක් හා ජීවයක් ලබාදීමට හැකි විය. මෙම අවස්ථාව තවදුරටත් ප්‍රබෝධමත් කරමින් ජයග්‍රාහකයන් තිදෙනෙකු තෝරා ගැනීම සඳහා ලොතරැයි දිනුම් ඇදීමක් පවත්වන ලද අතර ඔවුන්ට ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට හැකිවන පරිදි සංචාරක පැකේජයන් ප්‍රදානය කරනු ලැබීය.

මෙම මාධ්‍ය සාකච්ඡාවේ දී, 'ශ්‍රී ලංකාව ශැංහයි නගරයේ දී විශිෂ්ඨත්වයට පත්වීමේ' අභිප්‍රාය ඉතා සවිස්තරාත්මක හා පැහැදිලි වීඩියෝ ප්‍රදර්ශනයක් තුළින් චීන මාධ්‍ය වෙත එළිදරව් කරනු ලැබිණි. මෙම අති දැවැන්ත ඒකාබද්ධ ප්‍රවර්ධන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ එකමුතුවෙන් දෙවන වරටත් සංවිධානය කරන ලද මාහැඟි ප්‍රචාරක ව්‍යාපාරයකි. ශැංහයි නගරයේ පීඩොංග් ප්‍රදේශයේ ෂැංග්‍රිලා හෝටලයේ දී 2014 ජූලි 4 වනදා සවස පවත්වන ලද අතිඋත්කර්ෂවත් 'ශ්‍රී ලාංකික රාත්‍රිය' සමඟින් 'ශ්‍රී ලංකාව ශැංහයි නගරයේ දී විශිෂ්ඨත්වයට පත් වීමේ' අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා චීනයේ පවත්වන ලද තෙදින අතිදැවැන්ත ප්‍රවර්ධන ව්‍යාපාරය එහි ඉහළම ස්ථානයට ඔසවා තැබීමට අපට හැකියාව ලැබුණි. ප්‍රධාන අමුත්තා වශයෙන් මෙම අතිඋත්කර්ෂවත් සන්ධ්‍යාවට සහභාගී වූ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන අමාත්‍ය, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ සම්භාවනීය සහභාගීත්වය තුළින් මෙම උත්සව අවස්ථාව තවදුරටත් අලංකාර විය.

ශ්‍රී ලංකාවේ අද්විතීය අනන්‍යතාව පිළිඹිබු කරන දිවයිනේ සංස්කෘතිය හා සම්ප්‍රදායන් විශේෂයෙන් ඉස්මතුකොට දැක් වූ ක්‍රියාකාරකම් මාලාවක් ද මෙම අතිඋත්කර්ෂවත් ශ්‍රී ලාංකික රාත්‍රියේ දී ප්‍රදර්ශනය කරන ලදී. ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින නර්ථන ශිල්පීන් විසින් ඉතා ජනප්‍රිය සම්ප්‍රදායික ශ්‍රී ලාංකික නර්තන ප්‍රසංග සහ මධුර ශබ්ද සංකලනයෙන් යුත් බෙර වාදන ද වේදිකාව මත ඉදිරිපත් කරන ලද අතර ප්‍රේක්ෂකයන් අතර විශාල රසාස්වාදයක් ජනිත කිරීමට ද, ශ්‍රී ලාංකික සංස්කෘතිය හා සම්ප්‍රදායන් පිළිබඳව සදානුස්මරණීය අත්දැකීමක් ලබා දීමට ද එමඟින් හැකි විය.

මෙම උත්සවය අතරතුර දෙරටේ සංස්කෘතිවල සංකලනයේ මධුර මනෝහර බව විශේෂයෙන් ඉස්මතු කොට දක්වමින් ශ්‍රී ලාංකික නර්ථන විශේෂාංග ද සමඟ චීනයේ ජනප්‍රිය නර්ථන විශේෂාංග ද මෙම වේදිකාව මත රඟ දැක්වෙනු නැරඹිය හැකි විය.

මෙම ශ්‍රී ලාංකික රාත්‍රියට චීන අවිවාහක රූ රැජින වැනි ඉමහත් කීර්තියට පත් වූ සම්භාවනීය පිරිස් ද සම්ප්‍රාප්ත වූ අතර අතිශයින් ම චමත්කාරජනක මෙම උළෙල ඔවුන්ගේ සහභාගීත්වය තුළින් තව තවත් ප්‍රබෝධමත් කිරීමට ඔවුන්ට හැකි විය.

මෙම අවස්ථාව තවදුරටත් රස ගන්වමින් මෙම රාත්‍රියට සපැමිණි අමුත්තන්ට ප්‍රධාන පෙළේ ශ්‍රී ලාංකික සූපවේදීන් විසින් පිළියෙළ කරන ලද ශ්‍රී ලාංකික ආහාරපානවලින් සංග්‍රහ කරන ලදී. මෙම උත්සවය පවත්වන අතරවාරයේ අමුත්තන් ඔවුනොවුන් අතර වැදගත් සම්බන්ධතා වර්ධනය කරගනිමින් සම්බන්ධතා ජාලයක් ගොඩ නඟා ගන්නා ලද අතර එවැනි සම්බන්ධතා සංචාරක කර්මාන්තයේ ප්‍රගමනයට සත්‍ය වශයෙන් ම විශාල දායකත්වයක් ලබා දෙනු ඇත.

## සංචාර සහ සංචාරක ව්‍යාපාරික ද්වි පාර්ශ්වික සාකච්ඡා



අතිදැවැන්ත සංචාරක ව්‍යාපාරයේ කොටසක් ලෙස, ශැංහයි නගරයේ පීඩොංග් ප්‍රදේශයේ පිහිටි ෂැංග්‍රිලා හෝටලයේ ජූලි 04 වන දා පැවැත් වූ සංචාර හා සංචාරක ව්‍යාපාරික සංසදයේ ව්‍යාපාරික ද්වි පාර්ශ්වික සාකච්ඡා සඳහා චීනයේ චාරිකා මෙහෙයුම්කරුවෝ 170 කට අධික සංඛ්‍යාවක් ද, සංචාරක ව්‍යාපාරික නියෝජිතයන් 161 දෙනෙක් ද සහභාගී වූහ. චීනයේ ප්‍රධාන පෙළේ සමාගම්වල ශ්‍රී ලංකා ශාඛා සමඟ ඉතා ඵලදායක සාකච්ඡා පැවැත්වීමට ඔවුන්ට අවකාශ සැලසිණි. එමඟින්, දෙරටේම දැනට පවත්නා ව්‍යාපාර තවදුරටත් ශක්තිමත් කර ගැනීමට ද, නව

ව්‍යාපාරික අවස්ථා ඇති කර ගැනීමට ද හැකියාව ලබා දෙන වේදිකාවක් ලෙස මෙම ව්‍යාපාරය උපයෝගී කර ගැනීමට හැකියාව ලැබුණි. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික නියෝජිතයන් 80 කට අධික සංඛ්‍යාවක් චීන ව්‍යාපාර නියෝජිතයන් සමඟ වෙන් වෙන් වශයෙන් ව්‍යාපාරික සාකච්ඡාවල නිරත වූහ. සමාගම් ඒකාබද්ධ කිරීම සඳහා අවස්ථා ලබා ගැනීමේ අභිප්‍රායෙන් කළු තේ, මැණික්, රෙදිපිළි, බතික් ඇඳුම් පැළඳුම් හා අත්කම් භාණ්ඩ සම්බන්ධයෙන් ඔවුනොවුන් අතර ගැඹුරින් අදහස් හුවමාරු විය.

මෙම සාකච්ඡා පැවැත්වෙන අතරවාරයේ, ශ්‍රී ලාංකික කලා ශිල්පීන් විසින් ඉදිරිපත් කළ සම්ප්‍රදායික නර්තන විශේෂාංග නැරඹීමේ හා බෙරවාදන ශ්‍රවණය කිරීමේ අවස්ථාව ද ප්‍රේක්ෂකයින්ට උදා විය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) රට අභ්‍යන්තරයේ චාරිකා මෙහෙයුම්කරුවන්ගේ ශ්‍රී ලංකා සංගමය සමඟ සහයෝගීතාවෙන් ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට කැමැත්තක් දක්වන චීන සංචාරකයන්ට විශේෂ නිවාඩු පැකේජයන් හඳුන්වාදීමට ද පියවර ගෙන තිබුණි. දිවයිනේ ජාතික ගුවන් සමාගම වන ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් මගින් මෙම විශේෂ චාරිකා පැකේජ සඳහා අවශ්‍ය වන ගුවන් ටිකට්පත් සඳහා විශේෂ වට්ටම් පිරිනමනු ලැබීය. ලොතරැයි දිනුම් ඇදීමක් තුළින් වාසනාවන්ත ජයග්‍රාහකයන් තෝරා ගන්නා ලද අතර ඔවුන්ට ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සඳහා ප්‍රවර්ධනාත්මක චාරිකා පැකේජ පිරිනමනු ලැබීය.

**අතිවිශාල සාප්පු සංකීර්ණවල සංචාරක ප්‍රචාරක කටයුතු ක්‍රියාත්මක කිරීම**

**අතිවිශාල සාප්පු සංකීර්ණවල සංචාරක ප්‍රචාරක කටයුතු ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපාරය චීනයේ ශැංහයි නගරයේ දී 2014 ජූලි 4 6 දක්වා**

නැන්ජින් පාරේ සෙන්චරි ප්ලාසා හි දී පැවැත් වූ ශ්‍රී ලංකාව ශැංහයි නගරයේ දී විශිෂ්ටත්වයට පත් වේ' යන ප්‍රවර්ධන ව්‍යාපාරය යටතේ අති විශාල සාප්පු සංකීර්ණවල සංචාරක ප්‍රවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපාරය චීනයේ ශැංහයි නගරයේ දී 2014 ජූලි 4 6 දක්වා පවත්වනු ලැබීය. සංචාරක කර්මාන්තය පිළිබඳ ඉහළ උනන්දුවක් දක්වන පිරිස් හා නාගරික මහජනතාව අතරින් විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව ශැංහයි නගරයේ දී විශිෂ්ටත්වයට පත් වේ' යන තේමාව යටතේ පැවැත් වූ තෙදින ව්‍යාපාරය වෙත ආකර්ෂණය වූහ.

පෞරාණික යාපහුව දොරටුවේ ජීවමාන ප්‍රමාණයේ ආකෘතියක් උපයෝගී කර ගනිමින් නැන්ජින් ලූ සෙන්චරි චතුරස්‍රයේ ප්‍රවේශ මාර්ගය ප්‍රතිනිර්මාණය කර තිබූ අතර නැන්ජින් ලූ චතුරස්‍රයේ අති විශාල සාප්පු සංකීර්ණවල සංචාරක ප්‍රචාරක කටයුතු ක්‍රියාත්මක කිරීම උදෙසා පැවැත් වූ මෙම උළෙල වෙත විශාල පිරිස් ආකර්ෂණය කර ගැනීමට සමත් වූ ප්‍රධානම ආකර්ෂණීය අංගය වූයේ මෙම උත්සව භූමියේ නිර්මාණය කර තිබූ අලි ඇතුන් හා වන ජීවී ආකෘතීන්ය. ලෝක ප්‍රසිද්ධියට පත්ව ඇති ශ්‍රී ලාංකික ස්වර්ණාභරණ, රෙදිපිළි, මුහුදු ආහාර, කළු තේ හා වෙනත් විශේෂ පාරිභෝගික භාණ්ඩ මෙම අවස්ථාවේ ප්‍රදර්ශනය කිරීම සඳහා රැගෙන විත් තිබූ බැවින් ඒවා නැරඹීම සඳහා ද සෙන්චරි චතුරස්‍රයේ විශාල පිරිස් රැස්ව සිටියහ.

ශ්‍රී ලාංකික ජනවර්ගවලට අනන්‍ය වූ ගති ලක්ෂණ ප්‍රදර්ශනය කරන අත්කම් භාණ්ඩවල අති විශිෂ්ඨ කලා කෞශල්‍යය පිළිබඳව නාගරික අමුත්තන් විශාල සංඛ්‍යාවක් අමන්දානන්දයට පත්ව සිටි අතර සංචාරක කර්මාන්තය පිළිබඳව උනන්දුවක් දක්වන පුද්ගලයන් දේශීය සංස්කෘතික රඟ දැක්වීම් හා ශ්‍රී ලංකාවේ ස්වභාවික සෞන්දර්ය පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වමින් මෙම පරිශ්‍රයේ පැවති ක්‍රීඩාවලට සක්‍රීයව සහභාගී වූහ.

මෙම උළෙල පැවැත් වූ තෙදින තුළ, අතිදැවැන්ත සාප්පු සංකීර්ණවල සංචාරක ප්‍රචාරක කටයුතු ක්‍රියාත්මක කිරීමේ මෙම අවස්ථාව නැරඹීම සඳහා දහස් සංඛ්‍යාත ජනතාව මෙම පරිශ්‍රයට රැස් වූ අතර 'ශ්‍රී ලංකාව ශන්හායි හි දී විශිෂ්ටත්වයට පත්වේ' ප්‍රවර්ධන ව්‍යාපාරය තුළින් ශ්‍රී ලංකාවේ ආශ්චර්යමත්බව අත් වින්දනය කළහ. රට අභ්‍යන්තරයේ චාරිකා මෙහෙයුම්කරුවන්ගේ ශ්‍රී ලංකා සංගමය සහ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ සමායෝජනයෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) මගින් සාප්පු සංකීර්ණය තුළ පැවැත් වූ තරගවලින් ජයග්‍රහණ ලබා ගත් ජයග්‍රාහකයන් වෙත විශේෂ චාරිකා පැකේජ සහ ගුවන් ප්‍රවේශ පත්‍ර නොමිලේ පිරිනමනු ලැබීය. ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සඳහා ප්‍රවර්ධනාත්මක චාරිකා පැකේජ ලබාදීමේ අරමුණින් ශ්‍රී ලංකාව පිළිබඳ විවිධ මාතෘකා ඔස්සේ පැවැත් වූ ක්‍රීඩා හා තරගවලින් ජයග්‍රහණ ලබා ගත් වාසනාවන්තයන් තෝරා ගනු ලැබීය. අතිදැවැන්ත සාප්පු සංකීර්ණවල ප්‍රචාරක කටයුතු ක්‍රියාත්මක කිරීමේ මෙම උත්කර්ෂවත් අවස්ථාවට සහභාගී වීම සඳහා සෑම දිනකම අති විශාල පිරිස් නැන්ජින් ලූ චතුරස්‍රය වෙත රැස් වූ අතර ශ්‍රී ලංකාව පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට ජනතාව වෙත විශාල උනන්දුවක් හා ආශාවක් පැවැති බව පැහැදිලි ව දක්නට ලැබුණි. සියළුම සංචාරක හා වෙළඳ ප්‍රදර්ශන කුටි නැරඹීමට පැමිණි සියළු නරඹන්නන්ට සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන තොරතුරු ප්‍රවර්ධනාත්මක ද්‍රව්‍ය හා නිරූපණය කිරීම් උපයෝගී කර ගනිමින් ලබා දී තිබුණි.

## ප්‍රචාරණ ව්‍යාපාරය

### (අ) බස් රථවල සන්නාම නාම යෙදීමෙන් ගමනාන්තය ප්‍රචාරණය කිරීමේ ව්‍යාපාරය

2013 වසරේ චීනයේ දී ආරම්භ කරන ලද බස්රථවල සන්නාම නාම යොදමින් ගමනාන්තය ප්‍රවර්ධනය කිරීමේ අති දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරය 2014 වසර තුළ ද අඛණ්ඩව සිදු කරනු ලැබීය. මෙහි දී බීජිං, චෙන්ඩු, ග්වොන්ජොවු නගරවල බස් රථ 200 ක ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණ යොදනු ලැබූ අතර එම බස්රථවල සන්නාම නාම යෙදීමේ ව්‍යාපාරයේ විස්තර පහත දක්වා ඇත.

බීජිං / තේමා 14 / බස්රථ 50 / මාර්ග 11
ශැංහයි / තේමා 14 / බස්රථ 50 / මාර්ග 43
ග්වොන්ජොවු /තේමා 14 / බස්රථ 50 / මාර්ග 25
චෙන්ඩු/ තේමා 14 / බස්රථ 50 / මාර්ග 27

මෙම බස් රථවල සන්නාම නාම යෙදීම මගින් ගමනාන්තය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපාරය මාස 6 ක කාලයක් ඉහත නගරවල අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර 2014 වසර තුළ කැබිනට් අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව තවත් මාස 3 ක් සඳහා මෙම ව්‍යාපාරය දීර්ඝ කරනු ලැබීය.

### (ආ) එළිමහන් ප්‍රචාරක ව්‍යාපාරය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මගින් 2014 ජනවාරි 31 සිට පෙබරවාරි 10 දක්වා පැවැත්වෙන චීන නව වසර සැමරීමේ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාව වෙත සංචාරකයන් ආකර්ෂණය කරගැනීම සඳහා විශාල එළිමහන් දැන්වීම් පුවරු, ගුවන් විදුලිය, මුද්‍රිත මාධ්‍ය හා වෙබ් අඩවි උපයෝගී කර ගනිමින් සුවිශේෂී ප්‍රචාරණ ව්‍යාපාරයක් ආරම්භ කරනු ලැබීය.

චීනයේ අතිවිශාල සංචාරක ප්‍රවර්ධන ව්‍යාපාරය හා සමගාමීව ආලෝක පෙට්ටි සහ මුද්‍රිත මාධ්‍ය උපයෝගී කර ගනිමින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම මෙන්ම කෙටි සංගීතමය ප්‍රචාරක දැන්වීම් ගුවන් විදුලිය තුළින් විකාශනය කිරීම මගින් අග්‍රගන්‍ය සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම වැනි වෙනත් ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මාලාවක් ක්‍රියාත්මක වන අතරතුර බීජිං නගරයේ යෝධ එළිමහන් වෙළඳ දැන්වීම් පුවරු උපයෝගී කරගෙන ප්‍රචාරක කටයුතු සිදුකිරීමේ ව්‍යාපාරයක් ද ශ්‍රී ලංකා සංවර්ධන මගින් ක්‍රියාත්මක කරන ලදී.

යෝධ එළිමහන් වෙළඳ දැන්වීම් පුවරු උපයෝගී කර ගනිමින් ගමනාන්තය ප්‍රවර්ධනය කිරීමේ මෙම ව්‍යාපාරය චීන වෙළඳපොළේ මේ ආකාරයෙන් සහ මෙම පරිමාණයෙන් ක්‍රියාත්මක කරන ලද ප්‍රථම ප්‍රවර්ධන ව්‍යාපාරයයි. පසුතලය ආලෝකමත් කළ අතිවිශාල LED දැන්වීම් තිර බීජිං නගරයේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථාන 21 කට අධික සංඛ්‍යාවක් තුළ ප්‍රදර්ශනය කරන ලදී.

යෝධ එළිමහන් වෙළඳ දැන්වීම් පුවරු තුනක් මගින් චීන සංචාරකයන්ගේ සැලකිල්ල යොමු වී ඇති ශ්‍රී ලංකාවේ ඉතිහාසය හා සංස්කෘතිය, වෙරළ තීර, වන සතුන්, උත්සව, ආයුර්වේද සහ ස්පා, මැණික් හා ස්වර්ණාභරණ ඇතුළු ප්‍රධාන සංචාරක ආකර්ෂණ ප්‍රදර්ශනය කරනු ලැබීය. බීජිං ව්‍යාපාරය තුළින් ඇති කරන ලද බලපෑම තවදුරටත් තීව්‍ර කරමින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මගින් ශැංහයි නගරයේ දී එළිමහන් දැන්වීම් පුවරු, ගුවන් විදුලිය, මුද්‍රිත මාධ්‍ය හා ශැංහයි නගරයේ දැනට ක්‍රියාත්මක වන වෙබ් අඩවි උපයෝගි කරගනිමින් ප්‍රධාන පෙළේ ප්‍රචාරක ව්‍යාපාරයක් ද ක්‍රියාත්මක කරන ලදී.

## මාධ්‍ය සහ ව්‍යාපාරික සම්බන්ධතා



රටින් බැහැරව යාම සඳහා වූ දැනට පවතින අවසර පත් ඉවත් කිරීම, ශ්‍රී ලංකාවට සංචාරකයන් 100,000 ක් ගෙන්වා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා ගිවිසුම්වලට ඇතුළත් වීම ආදී චීන රජයේ සහයෝගය ඇතිව ගන්නා ලද ඇතැම් ප්‍රතිපත්තිමය තීරණ මගින් ශ්‍රී ලංකාව වෙත සංචාරය කරන චීන සංචාරකයන් සංඛ්‍යාව ඉහළ නැංවීමට හැකියාව ලැබී ඇත.

තවද, ප්‍රධාන පෙළේ චීන සංචාරක මාධ්‍ය හරහා ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් දෙරට අතර ගිවිසුම් අත්සන් කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් චයිනා ට්‍රැවල් චැනල්, අවුට්ලුක් ට්‍රැවලර් චයිනා, සීසීටීවී 6 යන ප්‍රමුඛ පෙළේ චීන රූපවාහිනී නාලිකා සහ මුද්‍රිත මාධ්‍ය නියෝජනය කරමින් මාධ්‍යවේදීන් 56 දෙනෙක් 2014 වසර තුළ ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

චීනයේ විවිධ නගරවල සංචාරක නියෝජිතයන් හා චාරිකා මෙහෙයුම්කරුවන් මෙරට සංචාරය කිරීමට සැලසුම් කර ගමනාන්තය පිළිබඳ දැනුවත්බව ඇති කිරීම තුළින් සංචාරය කිරීමේ විභවයෙන් යුත් සංචාරකයන් මෙරටට ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කටයුතු කර තිබේ.

**2013 වසර තුළ චීනය සඳහා නව සංචාරක ක්‍රමෝපායක් නිර්මාණය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක සංචරණය විශිෂ්ටතා සම්මානයෙන් පිදුම් ලැබීම.**




2014 වසර තුළ චීනය සඳහා නව සංචාරක ක්‍රමෝපායක් නිර්මාණය කිරීම වෙනුවෙන් සහ චීන වෙළඳපොළ තුළ ක්‍රමෝපායන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා චීන බලධාරීන්ගේ උපරිම දායකත්වය ලබාගැනීමේ අරමුණින් ඔවුන් සමඟ හවුල්කරුවන් ලෙස සම්බන්ධ වී කටයුතු කිරීම හා සහයෝගීතාවයෙන් ක්‍රියා කිරීම වෙනුවෙන් විශිෂ්ඨත්වයේ සම්මානයෙන් පිදුම් ලැබීමට ශ්‍රී ලංකා සංචරණය සමත් විය.

## '2013 වර්ෂයේ දී චීනය සමඟ ඉතාම මිත්‍රශීලීව කටයුතු කරන ලද රාජ්‍ය ආයතනය' යන ගෞරවනීය සම්මානයෙන් පිදුම් ලැබීම.

'2013 වර්ෂයේ දී චීනය සමඟ ඉතා මිත්‍රශීලීව කටයුතු කළ රාජ්‍ය ආයතනය' යන ගෞරවනීය සම්මානය ශ්‍රී ලංකා සංචරණය වෙත පිරිනමන බව ප්‍රකාශයට පත් කිරීම තුළින් චීන මහජන සමූහාණ්ඩුවේ තානාපති කාර්යාලය ශ්‍රී ලංකා සංචරණය ඉමහත් ගෞරවයට පාත්‍ර කර ඇත. චීන නව වසර සැමරුම්වලට සමගාමීව කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත් වූ අති උත්කර්ෂවත් උළෙලක දී චීන තානාපති වූ පීහායි මැතිතුමා විසින් ශ්‍රී ලංකා සංචාරක සංචරණයේ සභාපති භාෂ්වර ගුණරත්න මහතාට මෙම සම්මානය පිරිනමනු ලැබීය. චීනය නැඟී එන ප්‍රධාන පෙළේ වෙළඳපොළක් ලෙස හඳුනා ගැනීමට සමත් වූ ශ්‍රී ලංකා සංචරණය ප්‍රධාන පෙළේ ප්‍රවර්ධන ව්‍යාපාර කීපයක් ම චීනයේ දී ක්‍රියාත්මක කිරීමට සමත් විය.

## ශ්‍රී ලංකා සංචාරක සංචරණය හා චීනයේ ග්වන්ෂාන් නාගරික සංචාරක කාර්යාංශය අතර මිත්‍රශිලී සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම

ශ්‍රී ලංකාව හා චීනයේ ග්වන්ෂාන් නගරය අතර මිත්‍රශීලී හුවමාරු කිරීම් හා සහයෝගීතාව තුළින් සංචාරක කටයුතු තවදුරටත් ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම හඳුනා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා චීනයේ ග්වන්ෂාන් නාගරික සංචාරක කාර්යාංශය සංචාරක ප්‍රවර්ධනයේ සමාරම්භක පියවර සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් 2014 ඔක්තෝබර් මාසයේ දී අත්සන් තබනු ලැබූහ.

අන්‍යෝන්‍ය අවබෝධය වැඩිදියුණු කිරීම, තොරතුරු ක්‍රමවත් ලෙස හුවමාරු කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම තුළින් මිත්‍රත්වය ඇති කිරීම, සංචාරක ගමනාන්තවල ජනප්‍රියත්වය වැඩි කිරීම සඳහා දෙරටේ සංචාරක ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා සහාය දැක්වීම, දෙරටේ නගරවල සංචාරය කිරීම සඳහා දේශීය සංචාරකයන් ප්‍රවර්ධනය කිරීම සහ සංවිධානය කිරීම, කටුනායක හා මත්තල ගුවන් තොටුපළවලට දෛනික/කුලී ගුවන් සේවා ආරම්භ කිරීම, රැස්වීම් පැවැත්වීම සහ දෙරටේ වෙබ් අඩවි හා සඟරා තුළින් සංචාරක තොරතුරු ප්‍රකාශයට පත් කිරීම සඳහා ද මෙම අවබෝධතා ගිවිසුම තුළින් මෙම දෙපාර්ශ්වය එකඟත්වය පළ කර තිබේ.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපතිතුමා වන භාෂ්වර ගුණරත්න මහතා සහ ග්වන්ෂාන් නාගරික සංචාරක කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ඩොන් සූවේ මහතා විසින් කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ දී පැවැත් වූ මාධ්‍ය සාකච්ඡාවක් අතරතුර දී මෙම අවබෝධතා ගිවිසුමට අත්සන් තබනු ලැබූහ. චීන ශ්‍රී ලංකා මිත්‍රත්ව සංගමය අවබෝධතා ගිවිසුම අත්සන් තැබීමේ මෙම උත්සාහය සාර්ථක කිරීමේ අරමුණින් දෙරට අතර අවබෝධතා ගිවිසුම අත්සන් තබනු ලැබූ මෙම අවස්ථාව මනාව සම්බන්ධීකරණය කළහ.

## මාධ්‍ය වෙත පිරිනැමූ ගමනාන්තය හුරු කරවීමේ චාරිකා





## චීන මධ්‍යම රූපවාහිනී මාධ්‍ය කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරය, 2014 ජූලි 8 සිට අගෝස්තු 6 දක්වා

චීන මධ්‍යම රූපවාහිනි මාධ්‍ය සමාගමේ සාමාජිකයින් 11 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් 'මන පිනවන ශ්‍රී ලංකාව' යන තේමාවෙන් පැය දෙකක වාර්තා චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම සඳහා 2014 ජූලි 8 සිට අගෝස්තු 6 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර ඔවුහු කොළඹ, බෙන්තොට, ගාල්ල, මහනුවර හා නුවරඑළිය යන ප්‍රදේශ ආවරණය කළෝය.

## ප්‍රමුඛ පෙළේ චීන සංචාරක පුවත්පත් චීනයේ පවත්වන ලද ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන ව්‍යාපාරය අනුමත කරයි.

'චයිනා ටුවරිසම් නිව්ස්' සහ 'ඔරියන්ටල් මෝර්නිං පෝස්ට්' යන ප්‍රමුඛ පෙළේ චීන පුවත්පත් මගින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන ක්‍රමෝපාය හා 2013 වසර තුළ බීජිං හා ශැංහයි නගරවල ආරම්භ කර මාස කීපයක් මුළුල්ලේ ක්‍රියාත්මක කරන ලද ප්‍රචාරක ව්‍යාපාර ඉතාම ඉහළින් අනුමත කර තිබේ. 'චයිනා ටුවරිස්ට් නිවුස්' පුවත්පතේ ආවරණ ප්‍රවෘත්තියේ "ශ්‍රී ලංකාවේ සංචාරය කරන චීන සංචාරකයන්ගේ සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වන බව ශ්‍රී ලංකාව නිරීක්ෂණය කරයි" යනුවෙන් සඳහන් කරන අතර 'ඔරියන්ටල් මෝර්නිං පෝස්ට් පුවත්පතේ' විශේෂාංග ලිපියක 'මන බඳනා ශ්‍රී ලංකාව ශැංහයි නගරයේ දී විශිෂ්ටත්වයට පත් වෙයි' යනුවෙන් සඳහන් කර ඇත.

තවත් ප්‍රමුඛ පෙළේ චීන පුවත්පතක් වන 'චයිනා ඩේලි ඒෂියා වීක්ලි' විශේෂාංග ලිපියක් පළකරමින් 'සංචාරක කර්මාන්තයේ මහා පරිවර්තනයක් සිදු කිරීමට ද, 2016 වසර වන විට සංචාරකයන් මිලියන 2.5 ක් ආකර්ෂණය කර ගනිමින් සංචාරක කර්මාන්තය විශාලතම විදේශ විනිමය උපයන්නා බවට පත් කිරීමට ද ශ්‍රී ලංකාව සූදානම්' බව ප්‍රකාශ කරයි.

සංචාරක කර්මාන්තය පුළුල් කිරීමේ කර්තව්‍යයේ දී චීන සංචාරකයන් හා ආයෝජකයන් සමබර ලෙස ආකර්ෂණය කර ගැනීමට විශේෂ අවධානයක් යොමු කර තිබේ. විවිධාකාර ශ්‍රී ලාංකික භූ දර්ශනවල සශ්‍රීකත්වය පිළිබඳව චයිනා ඩේලි පුවත්පත මෙසේ සඳහන් කරයි. 'රන්වන් වෙරළ තීර, ඉතා උස්ව නැගී කඳු, පෞරාණික ස්මාරක හා ඉතා අනර්ඝ වනජීවී එකතුවක් මනාව සංයුක්ත වී මුහුදින් වට වූ දිවයිනක ඇඟිරී තිබේ. 'ශ්‍රී ලංකාව සුන්දර මෙන්ම පරිපූර්ණ නිවාඩු ගමනාන්තයකි'. විවිධ ශ්‍රී ලාංකික සංචාරක කර්මාන්ත බලධාරීන් හා වෙනත් පාර්ශ්වකරුවන් විසින් චීන වෙළඳපොළේ සංචාරක ප්‍රවර්ධන හා ආයෝජන කටයුතු පිළිබඳව ප්‍රකාශයට පත් කරන ලද අදහස් ද මෙම පුවතින් අනාවරණය කර තිබේ.




● 世界旅游会客厅

为游客量身定制
"公主礼遇"

——访公主邮轮中国区总经理王萍

中国赴斯里兰卡游客人数增长迅猛

'මන බඳනා ශ්‍රී ලංකාව ශැංහයි නගරයේ දී විශිෂ්ටත්වයට පත් වෙයි' ඔරියන්ටල් මෝර්නිං පෝස්ට් චීනය 2014 මාර්තු 7 (සිකුරාදා)

### 3.1.4 ජර්මනිය




රූපය 7 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (**SLTDA** සංඛ්‍යාන වාර්තාව 2014)

ශ්‍රී ලංකාවේ හතරවන විශාලතම ප්‍රභවස්ථාන වෙළඳපොළ ලෙස ජර්මනියේ සිට සංචාරකයන් 102,437 ක් 2014 වසරේ දී ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත. 2013 වසරේ සංචාරක පැමිණීම් හා සැසඳීමේ දී මෙය 12% ක වර්ධනයකි. දෙසැම්බර් මාර්තු දක්වා කාලය ද, අගෝස්තු මාසය ද ජර්මන් සංචාරකයන් වැඩි වශයෙන් මෙරට සංචාරය කරන කාල පරිච්ඡේද බව වාර්තා වී තිබේ. වර්ෂයේ ඒ ඒ මාසය තුළ ජර්මනියේ සිට ශ්‍රී ලංකාවට සංචාරකයන්ගේ පැමිණීම පහත වගුවේ දක්වා තිබේ.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 7,893 | 9,211 |
| පෙබරවාරි | 9,828 | 11,305 |
| මාර්තු | 10,384 | 12,448 |
| අප්‍රේල් | 5,099 | 8,137 |
| මැයි | 3,929 | 4,423 |
| ජූනි | 3,407 | 4,328 |
| ජූලි | 7,027 | 7,921 |
| අගෝස්තු | 8,012 | 10,364 |
| සැප්තැම්බර් | 6,070 | 6,996 |
| ඔක්තෝබර් | 6,436 | 7,966 |
| නොවැම්බර් | 7,715 | 9,049 |
| දෙසැම්බර් | 9,670 | 10,289 |
| එකතුව | 85,470 | 102,437 |

වගුව 5 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (**SLTDA** සංඛ්‍යාන වාර්තාව 2014)

## පාරිභෝගික සහ සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

### ITB 2014, ජර්මනිය, 2014 මාර්තු 5 9 දක්වා



48 වන වරට පවත්වනු ලබන ලෝකයේ විශාලතම සංචාරක ව්‍යාපාරික සැණකෙළිය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB)සහභාගී විය. මෙම අන්තර්ජාතික සංචාරක ප්‍රචාරක සැණකෙළිය (ITB) - 2014 ජර්මනියේ බර්ලින් නගරයේ දී 2014 මාර්තු 03 09 දක්වා මෙස බර්ලින් ෆෙයාර්ගුවුන්ඩ් හි දී පවත්වනු ලැබීය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් වැඩිම පිරිසක් සහභාගී වූ ප්‍රථම අවස්ථාව වාර්තා කරමින් ප්‍රධාන පෙළේ සංචාර හා සංචාරක නියෝජිතායතන 60 ක නියෝජිතයන් ද, හෝටල් අංශයේ නියෝජිතයන් ද ඇතුළු නියෝජිතයන් 120 දෙනෙකු ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මෙම අවස්ථාවට සහභාගි විය.

වර්ග මීටර් 160,000 ක ප්‍රදේශයක් ආවරණය කරන ලද ප්‍රදර්ශන පරිශ්‍රය තුළ දී රටවල් 189 ක් නියෝජනය කරමින් සංචාරක සමාගම් 10,147 ක නියෝජිතයෝ අන්තර්ජාතික සංචාරක ප්‍රචාරක සැණකෙළියට(ITB)–2014සහභාගී වූහ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී.එස්. ජයවීර මැතිතුමා හා ජර්මනියේ ශ්‍රී ලංකා තානාපති සරත් කෝන්ගහගේ මැතිතුමාගේ නායකත්වය යටතේ එම ආයතන දෙකේ නිලධාරීන් විසින් බර්ලින් නගරයේ සංචාරය කරන ලද ශ්‍රී ලංකා දූත පිරිස සඳහා මඟ පෙන්වන ලදී.

ආර්ථික සංවර්ධන අමාත්‍ය, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික සංචාරක වෙළඳපොළ අතර ජර්මානු වෙළඳපොළ ප්‍රධානම වෙළඳපොළක් ලෙස හඳුනා ගත් අතර මෙම අන්තර්ජාතික සංචාරක ප්‍රචාරක සැණකෙළියේ දී (ITB) - 2014 ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය ඉතා ආකර්ෂණීය ලෙස ඉදිකර ජර්මානු වෙළඳපොළට අදාළ වන සංචාරක

නිෂ්පාදන සියල්ල එහි ඇතුළත් කිරීමට සියලු කටයුතු සිදු කරනු ලැබීය.

ජර්මානු සංචාරකයන්ගේ ප්‍රසාදය දිනා ගැනීමට සමත් වන ප්‍රධාන පෙළේ සංචාරක ආකර්ෂණ ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම වසරේ ශ්‍රී ලංකා සංචාරක සංචරණ ප්‍රදර්ශන කුටිය සුවිශේෂී අන්දමින් නිර්මාණය කරනු ලැබීය. ශ්‍රී ලාංකික ආයුර්වේද නිෂ්පාදන, වන ජීවීන්, වෙරළ තීර හා උරුමය ජර්මානු සංචාරකයන් වෙත ප්‍රවර්ධනය කිරීමට වැඩි අවධානයක් යොමු කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් මාර්තු 5 වනදා ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.



අප රටේ ඓතිහාසික වටිනාකමකින් යුත් විස්මයජනක පෞරාණික නිර්මාණ විශේෂයෙන් ඉස්මතු කර දැක්වීම සඳහා පෞරාණික යාපහුව රාජධානියේ අනුරුවක් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියට ඇතුළු වන දොරටුවේ නිරූපණය කර තිබුණි.

ශ්‍රී ලංකාවේ දී දක්නට ලැබෙන වන ජීවී ආකර්ෂණය පිළිබඳ හැඟීමක් ලබාදීමේ අරමුණින් ජීවමාන ප්‍රමාණයේ අලින් දෙදෙනෙකුගේ අනුරුවක් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියේ ස්ථානගත කර තිබුණි.

ශ්‍රී ලංකාවේ වෙරළ තීරවල සජීවී ව කාලය ගත කරන බවට හැඟීමක් සංචාරකයන් අතර ඇති කිරීම සඳහා වෙරළ තීරවල සංකල්ප රූප හා වීඩියෝ ප්‍රදර්ශනය කිරීම සඳහා පුළුල් තිරයක් සහිත බිත්ති වීඩියෝවක් ද ප්‍රදර්ශන කුටියේ ඉදි කර තිබුණි. අන්තර්ජාතික සංචාරක ප්‍රචාරක සැණකෙළියේ දී (ITB) - 2014 ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වෙත සංචාරකයන් ආකර්ෂණය කර ගත් ප්‍රධානම ක්ෂේත්‍රය වූයේ ආයුර්වේද හා දේශීය වෛද්‍ය විද්‍යාව බැවින් නරඹන්නන්ට ස්පා ප්‍රතිකාර හා ආයුර්වේද හා දේශීය වෛද්‍ය විද්‍යාවට අදාළ විවිධ ප්‍රතිකාර ලබාගැනීම සඳහා අවස්ථාව සලසමින් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියේ වෙනම කොටසක් මේ වෙනුවෙන් වෙන් කර තිබුණි.

අළුත්ගම සිට පැමිණි සාම්ප්‍රදායික වෙස් මුහුණු තනන්නෙක් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය තුළ වෙස් මුහුණු කැටයම් කිරීමේ කලාව නිරූපණය කළ අතර මෙම ප්‍රදර්ශනය කුටියට පැමිණි අමුත්තන්ට වෙස් මුහුණු වර්ණ ගැන්වීම පිළිබඳව දැනුවත් කිරීමේ ප්‍රායෝගික සැසි ද පවත්වනු ලැබීය. අන්තර්ජාතික සංචාරක ප්‍රචාරක සැණකෙළිය (ITB) - 2014 මුළුල්ලේම ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය තුළ ස්ථානගත කර තිබූ තේ කවුන්ටරය මගින් අමුත්තන් සඳහා ලංකා තේ පිළිගන්වනු ලැබීය.

අන්තර්ජාතික සංචාරක ප්‍රචාරක සැණකෙළියේ දී (ITB) – 2014 ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වන සියළුම සම සහභාගීවන්නන් සඳහා ශ්‍රී ලංකා සංචරණය මගින් සන්නම් නාමය යොදා විශේෂයෙන් නිර්මාණය කරන ලද ඇඳුම් කට්ටල ද, එම සැණකෙළියට සහභාගී වීම සඳහා මාර්ගෝපදේශනය ලබා දෙන ප්‍රචාරක පත්‍රිකා ද, ලිපි බහාලුම් කවර/සටහන් පොත්, පෑන් සහ බෑග්, ටී ෂර්ට් හා කැප් ආදිය ද පිරි නමනු ලැබීය.

මෙම සියලු අයිතම ස්ථානගත කරන ලද ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියේ අද්විතීය නිර්මාණකරණය හා එමගින් නරඹන්නන්ට ලබාදුන් අත්දැකීම් හේතුකොටගෙන සංචාරකයන් විශාල පිරිසක් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වෙත ආකර්ෂණය විය.

2014 මාර්තු 5 වනදා පවත්වනු ලැබූ ශ්‍රී ලාංකික පුවත්පත් සාකච්ඡාව සඳහා සහභාගී වීමේ අරමුණින් ප්‍රධාන පෙළේ සංචාර හා සංචාරක ප්‍රකාශන නියෝජනය කරන අන්තර්ජාතික පුවත්පත් කලාවේදීහු මෙම සැණකෙළියට පැමිණියහ.




මෙම වසරේ බර්ලින් නගරයේ දී පැවැත්වූ අන්තර්ජාතික සංචාරක ප්‍රචාරක සැණකෙළියේ (ITB) – 2014 විවිධ අවස්ථාවලට රටවල් 81 නියෝජනය කරන පිළිගත් පුවත්පත් කලාවේදීන් 5700 ක් පමණ ද, රටවල් 25 ක බ්ලොග් අඩවි පවත්වාගෙන යන පුද්ගලයන් 300 ක් පමණ ද සහභාගී වී තිබුණි. ආර්ථික සහ බලශක්ති පිළිබඳ ෆෙඩරල් අමාත්‍ය, උපකුලපති සිග්මා ගාබ්‍රියෙල් මැතිතුමා ද, පාරිභෝගික ආරක්ෂණ හා නීතිය පිළිබඳ ෆෙඩරල් අමාත්‍ය හයිකෝ මාස් මැතිතුමා හා බර්ලිනයෙහි පාලක නගරාධිපති ක්ලෝවිස් වෝවරෙයිට් මැතිතුමා ද, ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය

වෙත පැමිණ ශ්‍රී ලාංකික සංචාරක කර්මාන්තයෙන් ඔවුන් වෙත පිරි නැමීමට ඇති නිෂ්පාදන පිළිබඳව විමසීම් සිදු කළහ.

## කුලී රථවල වෙළඳ සලකුණු යොදා ගමනාන්තය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපාරය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) ජර්මනියේ කුලී රථ උපයෝගී කර ගනිමින් 2014 වර්ෂයේ දී දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයක් ආරම්භ කරනු ලැබීය. අන්තර්ජාතික සංචාරක ප්‍රචාරක සැණකෙළිය (ITB) – 2014 පැවැත්වෙන අතරතුර, 2014 මාර්තු 07 වනදා මෙම ව්‍යාපාරය මහත් උත්සව ශ්‍රීයෙන් ආරම්භ කරනු ලැබීය.



මෙම ව්‍යාපාරය යටතේ 'ශ්‍රී ලංකාව ඔබේ පැමිණීම අපේක්ෂාවෙන් සිටියි' යන පාඨය ප්‍රදර්ශනය කරමින් ආයුර්වේද වෛද්‍ය කර්මය, වන සතුන්, වෙරළ තීර, අපගේ උරුමය සහ සංස්කෘතිය ආදී ජර්මානු වෙළඳපොළේ විශේෂ ආකර්ෂණයට ලක් වන සංචාරක ආකර්ෂණ කුලී රථ 300 ක යොදවනු ලැබීය. ජර්මනියේ බර්ලින්, හැම්බර්ග්, මියුනික් හා ෆ්‍රැන්ක්ෆ(ර්)ට් යන ප්‍රධාන නගර හතර ආවරණය කරනු ලැබූ මෙම ව්‍යාපාරය මාස 6 ක කාලයක් අඛණ්ඩව පවත්වනු ලැබීය.

මෙම ව්‍යාපාරයට ජර්මනියේ ඉලක්කගත ප්‍රේක්ෂකයන් හා ශ්‍රී ලංකා සංචාරක කර්මාන්ත පාර්ශ්වකරුවන් වෙතින් ඉතා ඉහළ ප්‍රතිචාර ලැබී තිබුණි. මෙම ප්‍රධාන නගර හතරේ එම ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, පසුගිය වර්ෂයේ මෙම කාල පරිච්ඡේදයට සාපේක්ෂව මේ වසරේ ජර්මානු සංචාරක පැමිණීම් 24% කින් ඉහළ ගොස් ඇති බව පර්යේෂණවලින් අනාවරණය වේ. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ආසන වෙන් කිරීමේ යාන්ත්‍රණය භාවිත කර ජර්මනියේ සිට කලින් ආසන වෙන්කිරීමේ ක්‍රියාකාරකම් ක්ෂණිකව ඉහළ ගොස් ඇති අතර ශ්‍රී ලංකා සංචාරක පැකේජය පිළිබඳව කරනු ලබන විමසීම් ද සැලකිය යුතු මට්ටමින් ඉහළ ගොස් ඇති බව සංචාරක නියෝජිතයන් හා චාරිකා මෙහෙයවන්නන් ප්‍රකාශ කර තිබුණි. මෙම ප්‍රචාරක ජර්මනියේ ප්‍රධාන නගරවලට පිවිසෙමින් මෙම කුලී රථ ව්‍යාපාරය සිදුකිරීමේ අරමුණ වූයේ දන්වීම් ඇස ගැටෙන වාර ගණන ඉහළ නැංවීම තුළින් සුඛෝපභෝගී සංචාරකයන් අප රට වෙත ආකර්ෂණය කර ගැනීමේ අවස්ථාවැඩි දියුණු කිරීමයි.

ජර්මනියේ තෝරාගත් ස්ථානවල මෙම ප්‍රවර්ධන ව්‍යාපාරය සිදු කර විශාල බලපෑමක් සිදු කිරීම හේතුවෙන් සිසිර නිවාඩුවට විදේශ ගත වීමට සැලසුම් කරන සංචාරකයන් ජර්මනිය හරහා ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීමට අවස්ථාව ලබා ගැනීමට අපට හැකි විය. එබැවින්, ජර්මනියේ පවත්වන ලද කුලී රථවල සංචාරක ආකර්ෂණ යොදා ගමනාන්තය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපාරය තුළින් දිරිගන්වන සුළු සංඥා අප වෙත ලැබී තිබුණි.



### බස්රථවල සන්නම් නාම යොදා ගමනාන්තය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපාරය

ශ්‍රී ලංකා සංචරණය මගින් ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමේ විභවයෙන් යුත් සංචාරකයන් ඉලක්ක කරමින් 2014 සැප්තැම්බර් මාසයේ ආරම්භ කර පුරා මාස තුනක කාලයක් අඛණ්ඩව සිදු කරන ලද බර්ලින් හා ෆ්‍රැන්ක්ෆ(ර්)ට් නගරවල බස්රථ 100 ක ශ්‍රී ලංකා සංචරණයේ සන්නම් නාම යොදවා ගමනාන්තය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපාරය ද සාර්ථකත්වයට පත් වූ ව්‍යාපාරයක් ලෙස හැඳින්විය හැකිය.



### 3.1.5 ප්‍රංශය




රූපය 8 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (**SLTDA** සංඛ්‍යාන වාර්තාව 2014)

2014 වසරේ දී ප්‍රංශ සංචාරකයන් 78,883 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. 2013 වසරේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 23% ක වර්ධනයකි. ජනවාරි සිට මාර්තු දක්වා ද ජූලි සිට අගෝස්තු දක්වා ද කාල සීමාව තුළ සංචාරකයන් බහුලව පැමිණි තිබුණි. ඒ ඒ මාසයට අදාළව ප්‍රංශයේ සිට ශ්‍රී ලංකාව වෙත සංචාරකයන් පැමිණීම පහත වගුවේ දක්වා ඇත.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 6,312 | 8,430 |
| පෙබරවාරි | 8,253 | 10,617 |
| මාර්තු | 7,248 | 9,266 |
| අප්‍රේල් | 4,170 | 5,970 |
| මැයි | 2,318 | 2,875 |
| ජූනි | 2,298 | 2,882 |
| ජූලි | 7,093 | 9,095 |
| අගෝස්තු | 7,607 | 8,746 |
| සැප්තැම්බර් | 3,350 | 3,897 |
| ඔක්තෝබර් | 4,191 | 4,523 |
| නොවැම්බර් | 4,999 | 5,448 |
| දෙසැම්බර් | 6,549 | 7,134 |
| එකතුව | | |
| | 64,388 | 78,883 |

වගුව 6 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (**SLTDA** සංඛ්‍යාන වාර්තාව 2014)

## පාරිභෝගික සහ සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

## IFTM ටොප් රෙසා, ප්‍රංශය 2014 සැප්තැම්බර් 23 26 දක්වා

ප්‍රංශයේ ඩයුවිල් හි පසුගිය කාලයේ පවත්වන ලද විශාලතම වෘත්තීය සංචාරක සැණකෙළිය වන IFTM ටොප් රෙසා ප්‍රදර්ශනය 2009 වසරේ දී නැවත නම් කිරීමෙන් අනතුරුව වර්තමානයේ දී PARIS PORTE DE VERSAILLES හි පැවැත්වෙන අතර මෙම වර්ෂයේ සැණකෙළිය 2015 සැප්තැම්බර් 29 සිට ඔක්තෝබර් 02 දක්වා පවත්වන ලදී. IFTM සංචාරක ව්‍යාපාරික සැණකෙළිය ප්‍රංශයේ පැවැත්වෙන ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන් මුණ ගැසෙන, සංචාර හා සංචාරක ව්‍යාපාර ක්ෂේත්‍රයේ විශාලතම මෙන්ම විශිෂ්ටතම අවස්ථා ශ්‍රී ලංකාව වෙත සලසා දෙන සැණකෙළිය වශයෙන් අවිවාදයෙන් සැලකිය හැකිය. ප්‍රදර්ශකයන්ට ඔවුන්ගේ සම්බන්ධතා වැඩි දියුණු කරගැනීමට හා අලුත් කර ගැනීමට ද, සංචාරක ව්‍යාපාරය සඳහා විවිධාකාර ගමනාන්ත තෝරා ගනිමින් නව ව්‍යාපාරික අවස්ථා ගවේෂණය කිරීමට ද, ප්‍රංශ මාධ්‍ය අතර ඔවුන් පිළිබඳව දැනුවත්බව ඇති කිරීමේ සුවිශේෂී අවස්ථා ද මෙම සැණකෙළිය මගින් සලසා දී තිබුණි. ශ්‍රී ලංකා සංචාරක සංවරණය (SLTPB) සංචාරක ව්‍යාපාරයේ නියෝජිතයන් 18 දෙනෙකු සමඟ IFTM 2014 සැණකෙළියට සහභාගී වී සාර්ථක ප්‍රතිඵල නෙළා ගැනීමට සමත් විය.

පෞරාණික පර්වත බලකොටුවක් වන 'යාපහුව' බලකොටුවේ මහේශාක්‍ය අනුරුවක් උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය අලංකාරව නිර්මාණය කර දිවයිනේ පෞරාණික ශ්‍රී විභූතිය ප්‍රදර්ශනය කිරීම තුළින් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වෙත සිය දහස් ගණන් අමුත්තන් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා සංචාරක සංවරණය සමත් විය. මෙම අවස්ථාවට සම්ප්‍රාප්ත වූ දේශීය සංචාරක හා චාරිකා මෙහෙයුම්කරුවන් සමඟ අන්තර් සම්බන්ධතා ඇති කර ගැනීමට ද අවස්ථාව සැලසී තිබුණි.

අප දිවයිනේ සංස්කෘතිය, උරුමය හා ස්වභාවික සෞන්දර්යය නිරූපණය කරන දෘශ්‍ය ප්‍රදර්ශන උපයෝගී කර ගනිමින් ප්‍රධාන පෙළේ සංචාරක තේමාවන් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය තුළ ප්‍රදර්ශනය කරනු ලැබිය. ප්‍රංශ බසින් පරිවර්තනය කරන ලද පෝස්ටර්, ප්‍රචාරක පත්‍රිකා, මාර්ගෝපදේශ ග්‍රන්ථ සහ වෙනත් ප්‍රවර්ධන ද්‍රව්‍ය අමුත්තන්ට දැක බලා ගැනීමට හා කියවීම පිණිස ලබා දෙනු ලැබිය. ඉම්හිරි නැවුම් ලංකා තේ කෝප්පයක ප්‍රනීත රසය විඳ ගැනීමේ සුවිශේෂී අවස්ථාව නරඹන්නන්ට ලබා දෙමින්, ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියට පැමිණි

අමුත්තන්ට ලංකා තේ කෝප්පය බැගින් පිළිගන්වනු ලැබූ අතර ඉමහත් ප්‍රසාදයට පත් වූ අමුත්තෝ ශ්‍රී ලංකා සංචාරක සංවරණය වෙත ඔවුන්ගේ ප්‍රශංසාව පළ කළහ.

මෙම සැණකෙළියේ සමාරම්භක උත්සවයේ දී ශ්‍රී ලාංකික නර්තන ශිල්පීන් සම්ප්‍රදායක ශෛලීන් අනුගමනය කර අද්විතීය කලා කුසලතා විදහා දක්වමින් සම්ප්‍රදායික ශ්‍රී ලාංකික නර්තනාංග ඉදිරිපත් කරන ලද අතර මෙම නර්තන සංදර්ශන නැරඹීම සඳහා ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වෙත විශාල අමුත්තන් පිරිසක් ආකර්ෂණය වූහ.

ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති, මහාචාර්ය කරුණාරත්න හන්ගවත්ත මැතිතුමා ඇතුළු ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අනෙකුත් නිලධාරීහු ද, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සංචාරක කර්මාන්ත හවුල්කරුවෝ ද, මෙම සමාරම්භක උත්සවයට සහභාගී වූ අනෙකුත් සම්භාවනීය අමුත්තෝ ද ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය උත්සවාකාරයෙන් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වූහ.

මෙහි දී මාධ්‍ය සාකච්ඡාවක් ද පවත්වනු ලැබූ අතර සංචාරක කර්මාන්තයට සම්බන්ධ මාධ්‍ය සංවිධාන නියෝජනය කරමින් ප්‍රමුඛ පෙළේ ප්‍රංශ මාධ්‍ය ආයතන 30 කට අධික සංඛ්‍යාවක නියෝජිතයෝමේ සඳහා සහභාගී වූහ. මෙම මාධ්‍ය සාකච්ඡාවට පැමිණි සිටි අමුත්තන් සමඟ අන්තර් සම්බන්ධතා ඇති කරගැනීම සඳහා ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ඉතා වැදගත් සාකච්ඡා මෙහෙයවනු ලැබූ අතර ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගමේ අනුග්‍රහයෙන් ශ්‍රී ලංකාව වෙත නොමිලේ සංචාරය කිරීමේ අවස්ථාව පිළිගැන්වීම සඳහා ජයග්‍රාහී වාසනාවන්තයකු තෝරා ගැනීමේ අරමුණින් මෙම මාධ්‍ය සාකච්ඡාව අවසානයේ දී ලොතරැයි දිනුම් ඇදීමක්ද පවත්වනු ලැබීය.

## කුලී රථවල සන්නම් නාම යොදා ගමනාන්තය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපාරය.

මෙම ප්‍රචාරක ව්‍යාපාරය සන්නම් නාම යොදන ලද කුලී රථ 100 ක් උපයෝගී කර ගනිමින් 2014 සැප්තැම්බර් මාසයේ ආරම්භ කර 2015 මාර්තු මාසය දක්වා මාස හයක කාලයක් පැරිසියේදී පවත්වනු ලැබීය. මෙම ව්‍යාපාරය මගින් ශ්‍රී ලංකා වෙළඳ නාමයේ දෘශ්‍යතාව වැඩි දියුණු කිරීමට හැකි වූ අතර ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමේ හැකියාවෙන් යුත් සංචාරකයන්ගේ සන්තානයේ ඉහළින්ම රැව් පිළිරැව් දෙන ගමනාන්තයන් බවට ශ්‍රී ලංකාව පත් කිරීමට ද මෙම ව්‍යාපාරය තුළින් හැකියාව ලැබුණි.

## ව්‍යාපාරික අවශ්‍යතා වෙනුවෙන් ගමනාන්තය හුරුකිරීමේ චාරිකා



## මාධ්‍ය ආයතන වෙත පිරිනැමෙන ගමනාන්තය හුරු කිරීමේ චාරිකා

## ‘පීකින් එක්ස්ප්‍රස්’ යථාවාදී සිනමා දර්ශනය ප්‍රංශය, M6 රූපවාහිනී නාලිකාව, පෙබරවාරි 15 28 දක්වා




‘පීකින් එක්ස්ප්‍රස්’ යනු ඕලන්ද/ෆ්ලෙමිශ් වික්‍රමාන්විත සිදුවීම් සහිත යථාරූපී ක්‍රීඩා සිනමා දර්ශනයක් වන අතර බර්ලින් නගරය වෙත හෝ බර්ලින් නගරයෙන් බැහැරව මහ මඟ යානාවලින් නොමිලේ ගමන් කරන යුවලවල් ගණනාවක් පසුපස හඹා යෑම පිළිබඳ කථා ප්‍රවෘත්තියක් මෙමගින් විකාශය කෙරේ. නෙදර්ලන්තයේ හා ස්කැන්ඩිනේවියාවේ දී මෙම චිත්‍රපට මාලාවේ වාර පහක් මේ වන විට විකාශය වී තිබේ.

මෙම වැඩසටහන M6 ප්‍රංශ රූපවාහිනී නාලිකාව වෙනුවෙන් නිෂ්පාදනය කර තිබෙන අතර කථාංග 11 න් 3 ක් ශ්‍රී ලංකාවේ රූගත කර තිබෙන අතර 'සිහිනය හා එක්වන්න' වැඩසටහන වෙනුවෙන් ශ්‍රී ලංකාව පිළිබඳව ප්‍රදර්ශනය කිරීමට විනාඩි 330 ක ගුවන් කාලයක් ලබා දී තිබේ. මෙම කථාංග තුන රූගත කිරීම සඳහා සාමාජිකයන් 48 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

M6 ප්‍රංශ රූපවාහිනී නාලිකාව වෙනුවෙන් 'පීකින් එක්ස්ප්‍රස්' වික්‍රමාන්විත චිත්‍රපට මාලාවේ 10 වන දර්ශනය නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් බෙල්ජියම පාදක කරගත් චිත්‍රපටි නිෂ්පාදන සමාගමක් වන එකෝ ලයින් ලිමිටඩ් (ECL) හා 'ලේබල් ඇඩ්වෙන්චර්' යන ප්‍රංශ සමාගම අතර ගිවිසුමක් අත්සන් තබනු ලැබීය.



මෙම රූපවාහිනී චිත්‍රපට මාලාව ප්‍රදර්ශනය කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට දැවැන්ත ප්‍රචාරයක් ලැබී තිබුණු අතර මෙම වැඩසටහන තුළින් බටහිර යුරෝපීය සංචාරකයන් ශ්‍රී ලංකාව වෙත ආකර්ෂණය කර ගැනීමට ද හැකි විය. 2014 පෙබරවාරි මාසයේ මෙම චිත්‍රපටයේ රූගත කිරීම සඳහා එම මාධ්‍යවේදීන් ශ්‍රී ලංකාවේ රැඳී සිටි මුළු කාලය වෙනුවෙන් පූර්ණ සත්කාරකත්වය පිරිනැමීමට ශ්‍රී ලංකා සංචාරක සංවරණය කටයුතු කරන ලදී.



### 3.1.6රුසියාව




රූපය 9 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

2014 වර්ෂය තුළ සංචාරකයන් 69,718 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත. මෙය 2013 වසරේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව 36% ක වර්ධනයකි. රුසියානු සංචාරකයන් බහුල වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන්නේ ජනවාරි සිට මාර්තු අතර කාල පරිච්ඡේදය තුළය. එක් එක් මාසයට අදාළව රුසියාවේ සිට ශ්‍රී ලංකාව වෙත සංචාරකයන් පැමිණීම පහත වගුවේ දක්වා ඇත.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 5,586 | 10,700 |
| පෙබරවාරි | 5,065 | 9,723 |
| මාර්තු | 4,826 | 8,948 |
| අප්‍රේල් | 3,490 | 4,976 |
| මැයි | 1,693 | 2,308 |
| ජූනි | 1,501 | 2,077 |
| ජූලි | 1,892 | 2,649 |
| අගෝස්තු | 2,379 | 3,246 |
| සැප්තැම්බර් | 3,285 | 3,018 |
| ඔක්තෝබර් | 5,302 | 5,512 |
| නොවැම්බර් | 7,575 | 7,282 |
| දෙසැම්බර් | 8,641 | 9,279 |
| එකතුව | 51,235 | 69,718 |

වගුව 7 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

## 1. MITT සංචාරක සැණකෙළිය, මොස්කව්, 2014 මාර්තු 19 22 දක්වා

MITT සංචාරක සැණකෙළිය රුසියාවේ වාර්ෂිකව පවත්වනු ලබන ප්‍රධාන පෙළේ සංචාර හා සංචාරක සැණකෙළියකි. වෙළඳපොළ පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු ලබාගැනීමේ අරමුණින් ද, එළැඹෙන වසන්ත හා ගිම්හාන ඍතු සඳහා ඒ ඒ ගමනාන්තවල සංචාරක නිෂ්පාදන අලෙවි කිරීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය පිළිබඳව දැනුවත් වීම සඳහා ද, ව්‍යාපාරික නියෝජිතයන්ගෙන් වෘත්තීය මතය පිළිබඳව දැනුවත් වීම සම්බන්ධයෙන් ද, සංචාරක කර්මාන්තය වෙත බලපෑමක් සිදුකළ හැකි පුද්ගලයන් සමඟ පෞද්ගලික මට්ටමින් අන්තර් සම්බන්ධතා ඇති කර ගැනීමට ද MITT සංචාරක සැණකෙළියට සහභාගීවන්නන්ට අවස්ථාව සැලසේ.

මොස්කව් අන්තර්ජාතික සංචාර හා සංචාරක ප්‍රදර්ශනය සඳහා සහභාගී වන ප්‍රදර්ශකයන්ට ඉහළ උනන්දුවක් හා උද්යෝගයක් දක්වන ඉතා අනර්ඝ ප්‍රේක්ෂකයින් පිරිසක් මුණ ගැසීමේ අවස්ථාව ද ලැබී තිබේ.

මධ්‍යම/නැගෙනහිර යුරෝපීය රටවල් ආදී දේශ සීමා මායිම්වල පිහිටි රටවල සංචාරක කර්මාන්තයේ නියැළී සිටින වෘත්තිකයන් ද MITT සංචාරක සැණකෙළිය වෙත ආකර්ෂණය වන අතර මෙම සැණකෙළිය රුසියාවේ සංචාරක කර්මාන්තය වෙනුවෙන් පවත්වනු ලබන ප්‍රධානම සැණකෙළිය බව අවිවාදයෙන් පිළිගත යුතුය.

MITT සංචාරක සැණකෙළිය සඳහා සහභාගී වන අනුගාමී 11 වන වසර ද වාර්තා කරමින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) මෙවර MITTසංචාරක සැණකෙළිය සඳහා සහභාගී විය. මේ වසරේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සංචාරක හා චාරිකා සමාගම් 14 ක් අරමුණු කීපයක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූහ. මෙය සංචාරක කර්මාන්ත පාර්ශ්වකරුවන් මුණ ගැසීමේ ප්‍රධාන රැස්වීම් ශාලාව වූ අතර වෘත්තීය හවුල්කරුවන් හා සේවාදායකයන් හමුවීම සඳහා ද අනගි අවස්ථාවක් මෙම සැණකෙළියට සහභාගී වීම තුළින් උදා කර ගත හැකි විය.

එයට අමතරව, මෙම සැණකෙළිය සඳහා සහභාගිවූවන්ට ඔවුන්ගේ රුචිකත්වය දිනා ගත් හද රැඳි ගමනාන්තය පිළිබඳව දැනුවත් බව තවදුරටත් වැඩි දියුණු කර ගැනීමේ අවස්ථාව සලසා දී තිබුණි. රුසියානු සංචාරක වෙළඳපොළ පිළිබඳව සැබෑ හැඟීමක් ඇති කර ගැනීමට හා සංචාරක කර්මාන්තයට අදාළ සේවා සම්බන්ධ ඔවුන්ගේ ඉල්ලුම නිශ්චය කර ගැනීමට ද මෙමගින් අවස්ථාව උදා කර ගත හැකි විය.




## පාරිභෝගික හා සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

## ලෙෂර්, රුසියාවේ මොස්කව් නුවර දී, 2014 දෙසැම්බර් 16 19 දක්වා

'ලක්ෂරි ලෙෂර්' සැණකෙළිය රුසියාවේ හා ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඬුල්ලට (CIS) අයත් රටවල සංචාරක කර්මාන්තය වෙනුවෙන් පවත්වනු ලබන ප්‍රධාන පෙළේ අන්තර්ජාතික සරත් සෘතු වෙළඳ සැණකෙළිය වන අතර මෙම සැණකෙළිය සරත් සෘතුවේ ආරම්භය සනිටුහන් කරමින් පවත්වනු ලබයි. මෙම සැණකෙළියේ වැදගත්කම රුසියාවෙන් ඔබ්බට ද විහිදී ඇති අතර නැගෙනහිර යුරෝපයට අයත් වෙනත් අසල්වැසි කලාපවල අවධානය ද මෙයට ලැබී තිබේ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB)දේශීය සංචාරක සමාගම් 12 ක නියෝජිතයන් සමඟ මෙම ප්‍රදර්ශනයට සහභාගී විය.

සැප්තැම්බර් මාසයේ මැද භාගයේ මොස්කව් නුවර දී පවත්වනු ලැබූ OTDYKH නිවාඩු සැණකෙළිය සංචාරක කර්මාන්තය වෙනුවෙන් රුසියාවේ පැවැත්වෙන විශාලතම අන්තර්ජාතික ව්‍යාපාරික සැණකෙළියකි.

ව්‍යාපාර පිළිබඳ අවසන් තීන්දු ගැනීමට මෙන් ම ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීමට හා රුසියාව හා ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු මඬුල්ලටඅයත් සියලු රටවලින් පැමිණෙන ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ ව්‍යාපාරික සම්බන්ධතා ස්ථාපනය කර ගැනීමට ද මෙම සැණකෙළිය සඳහා සහභාගී වූවන්ට අනගිභවනීය අවස්ථාවක් ලැබී තිබුණි.

ලෙෂර් 2014, සුඛෝපභෝගී සංචාර සඳහා පවත්වනු ලබන අට වන අන්තර්ජාතික සංචාරක සැණකෙළිය රුසියාව හා ස්වාධීන රාජ්‍යයන් පොදු මඬුල්ලට අයත් රටවල සංචාරකයන්ට විවේක සංචාර අලෙවි කිරීම සඳහා පවත්වනු ලබන ප්‍රමුඛ පෙළේ අන්තර්ජාතික සරත් සෘතු ව්‍යාපාරික සැණකෙළියයි. 1955 සිට පවත්වනු ලබන මෙම ප්‍රදර්ශනය මගින් රුසියානු සංචාරක වෙළඳපොළේ ශීත සෘතුවේ ආරම්භය සනිටුහන් කරයි.

## ලෙෂර් 2014 2014 සැප්තැම්බර් 16 19 දක්වා




ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තයේ සමාගම් 17 ක නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් රුසියාවේ මොස්කව් නුවර දී පැවැත් වූ විවේක සංචාර හා සංචාරක සැණකෙළියට සහභාගී විය. රුසියාවේ පැවැත්වෙන විශාලතම සංචාරක හමුව වන මෙම Otdykh විවේකී සැණකෙළිය 2014 සැප්තැම්බර් 16 19 දක්වා පවත්වනු ලැබීය.

## අතිවිශාල සංචාරක කැරවෑනය



ශ්‍රී ලංකාවේ 'සුන්දරත්වය හා සම්ප්‍රදායයන්' ප්‍රදර්ශනය කරමින් LOTTE ප්ලාසා හි පැවති ශ්‍රී ලාංකික රාත්‍රිය අතිවිශිෂ්ඨ සාර්ථකත්වයක් සනිටුහන් කරන ලද අතර පැවැත්වීමට නියමිත වූ 6 වන අතිවිශාල සංචාරක කැරවෑන් ප්‍රදර්ශනයේ දී, ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් මෙහෙයවීම සඳහා නිවැරදි මාර්ගෝපදේශ මෙමගින් නිරූපණය කරන ලදී.

මෙම අතිවිශාල සංචාරක කැරවෑනය ප්‍රදර්ශනය කිරීම 2014 මැයි 29  ජූනි 14 වනදා දක්වා මොස්කව්, කසහන්, සමාරා, සරාටෝ, වොල්ග්‍රොව්ගාර්ඩ් සහ රොස්ටව් යන රුසියානු නගර හයේ දී පවත්වනු ලැබීය. අතිවිශිෂ්ට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන ප්‍රදර්ශනය වන 6 වන අතිවිශාල සංචාරක කැරවෑනයේ ක්‍රියාකාරකම් සංස්කෘතික සංදර්ශනය හා සමගාමීව ආරම්භ කරන ලද අතර ඉන් අනතුරුව 'ශ්‍රී ලාංකික රාත්‍රිය' ලෙස නම් කරන ලද විශේෂ භෝජන සංග්‍රහයක් ද පවත්වන ලදී.

2014 වර්ෂය තුළ මෙම අතිවිශාල සංචාරක කැරවෑනය බෙලාරූස්, යුක්රේන් හා මෝල්ඩෝවා ඇතුළු රුසියානු නගර 10 ක සංචාරය කරන ලදී.

සංචාරකයන් වඩාත් ප්‍රිය කරන සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කරන අතරතුර අතිවිශාල සංචාරක කැරවෑනය උපයෝගී කර ගැනීමේ අරමුණ වන්නේ සංචාරකයන් වඩාත් ප්‍රිය කරන සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව පිළිබඳ සංකල්පය ව්‍යාප්ත කිරීමේ ප්‍රභවයක් ලෙස හඳුනා ගන්නා ලද සාමාන්‍ය ජනතාවගෙන් වැඩිම පිරිසක් වෙත සමීප වී එම වැදගත් පණිවුඩය ලබා දෙමින් ප්‍රචාරක කටයුතු දියත් කිරීමයි. 2014 වර්ෂයේ දී, මෙම අතිවිශාල කැරවෑන් ව්‍යාපාරය 6 වන හා 7 වන අදියර වශයෙන් අවස්ථා දෙකක දී ක්‍රියාත්මක කරනු ලැබීය.





### 3.1.7 ඕස්ට්‍රේලියාව




රූපය 10 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDAසංඛ්‍යාන වාර්තාව 2014)

2014 වසර තුළ සංචාරකයින් 57,940 ක් ශ්‍රී ලංකාව වෙත සංචාරය කර ඇත. මෙය 2013 වර්ෂයේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව 7% ක වර්ධනයකි. එක් එක් මාසයට අදාළව ඕස්ට්‍රේලියාවේ සිට ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලද සංචාරකයන් සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 4,860 | 5,535 |
| පෙබරවාරි | 3,029 | 3,368 |
| මාර්තු | 4,209 | 3,564 |
| අප්‍රේල් | 3,731 | 5,232 |
| මැයි | 2,665 | 2,840 |
| ජූනි | 4,064 | 4,430 |
| ජූලි | 4,724 | 5,124 |
| අගෝස්තු | 4,454 | 4,371 |
| සැප්තැම්බර් | 4,404 | 4,421 |
| ඔක්තෝබර් | 3,312 | 3,794 |
| නොවැම්බර් | 4,012 | 4,423 |
| දෙසැම්බර් | 10,788 | 10,838 |
| එකතුව | 54,252 | 57,940 |

වගුව 8 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

## පාරිභෝගික සහ සංචාරක සැණකෙළි සඳහා සහභාගී වීම

### සංචාරක කර්මාන්ත ප්‍රදර්ශනය ඕස්ට්‍රේලියාව 2014 ජූලි 18 19 දක්වා




මෙම සංචාරක කර්මාන්ත ප්‍රදර්ශනය විශේෂයෙන්ම ඕස්ට්‍රේලියානු සංචාරක ව්‍යාපාරය සඳහා උපයෝගී කරගත හැකි වන පරිදි ව්‍යාපාරික ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීමේ අරමුණින් ආරම්භ කර ඕස්ට්‍රේලියාවේ දී ප්‍රථම වරට පවත්වනු ලැබූ සැණකෙළියක් වන අතර මෙම වසරේ දී මෙම ප්‍රදර්ශනය 2014 ජූලි 18 19 දක්වා සිඩ්නි නගරයේ මුවර් පාර්ක් හි කර්මාන්ත පිළිබඳ රාජකීය ශාලාවේ දී පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සංචාරක ව්‍යාපාරික සමාගම් 14 ක් සමඟ මෙම සැණකෙළියට සහභාගි විය

## 3.1.8 ඇමෙරිකා එක්සත් ජනපදය




රූපය 11 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

2014 වර්ෂයේ දී සංචාරකයන් 39,371 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත. 2013 සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 13% ක වර්ධනයකි. එක් එක් මාසයට අදාළව ඇමෙරිකා එක්සත් ජනපදයේ සිට ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලද සංචාරකයන් පහත වගුවේ දක්වා ඇත.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 2,920 | 3,839 |
| පෙබරවාරි | 2,892 | 2,880 |
| මාර්තු | 3,260 | 3,401 |
| අප්‍රේල් | 2,323 | 3,097 |
| මැයි | 2,084 | 2,449 |
| ජූනි | 2,769 | 3,130 |
| ජූලි | 2,855 | 3,493 |
| අගෝස්තු | 2,780 | 2,648 |
| සැප්තැම්බර් | 1,789 | 2,191 |
| ඔක්තෝබර් | 2,761 | 3,275 |
| නොවැම්බර් | 2,632 | 2,951 |
| දෙසැම්බර් | 5,625 | 6,017 |
| එකතුව | 34,690 | 39,371 |

වගුව 9 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

## පාරිභෝගික සහ සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

### ද නිව්යෝර්ක් ටයිම්ස් සංචාරක ප්‍රදර්ශනය, ඇමරිකා එක්සත් ජනපදය 2014 පෙබරවාරි 28 මාර්තු 02 දක්වා, ජැකොබ් කේ. ජැවිට්ස් මධ්‍යස්ථානය.

උතුරු ඇමෙරිකාවේ විශාලතම පාරිභෝගික හා ව්‍යාපාරික සංචාරක සැණකෙළිය වන්නේ ද නිව්යෝර්ක් ටයිම්ස් සංචාරක සැණකෙළියයි. මෙම සැණකෙළිය මගින් රටවල් 150 කට අධික සංඛ්‍යාවක ප්‍රදර්ශන භාණ්ඩ 500 කට ආසන්න සංඛ්‍යාවක් ප්‍රදර්ශනය කළ අතර ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සංචාරක ව්‍යාපාරික සමාගම් දෙකක් සමඟ මෙම සැණකෙළියට සහභාගී විය.

### 3.1.9 ජපානය




රූපය 12 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

2014 වර්ෂය තුළ සංචාරකයන් 39,136 ක් ශ්‍රී ලංකාව වෙත සංචාරය කර ඇත. 2013 වර්ෂයේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 24% ක වර්ධනයකි. ජපානයේ සිට ශ්‍රී ලංකාවට සංචාරය කරන ලද සංචාරක සංඛ්‍යාව මාසය අනුව පහත වගුවේ දක්වා ඇත.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 1,872 | 2,859 |
| පෙබරවාරි | 3,142 | 3,350 |
| මාර්තු | 2,472 | 3,800 |
| අප්‍රේල් | 1,963 | 2,368 |
| මැයි | 1,488 | 2,281 |
| ජූනි | 1,866 | 2,666 |
| ජූලි | 2,226 | 3,203 |
| අගෝස්තු | 4,893 | 5,233 |
| සැප්තැම්බර් | 3,408 | 3,943 |
| ඔක්තෝබර් | 2,539 | 2,874 |
| නොවැම්බර් | 2,213 | 2,518 |
| දෙසැම්බර් | 3,423 | 4,041 |
| එකතුව | 31,505 | 39,136 |

වගුව 10 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

## පාරිභෝගික හා සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

### JATA සංචාරක ප්‍රදර්ශනය, ජපානය, 2014 සැප්තැම්බර් 25 28 වන දා දක්වා.

ජපාන වෙළඳපොළ සඳහා චාරිකා පැකේජයන් ප්‍රවර්ධනය කිරීමේ නිරත වුණු ශ්‍රී ලංකා සංචාරක කර්මාන්ත සමාගම් 18 ක නියෝජිතයන්ගේ සහාය ඇතිව මෙවර ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වර්ග මීටර් 108 ක භූමි ප්‍රමාණයක ඉදිකරනු ලැබීය. ප්‍රධාන සංචාරක නිෂ්පාදන අට ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියේ තේමාව වූ අතර සංචාරකයන් සඳහා නව්‍ය අත්දැකීමක් ලබාදීමේ අරමුණින් වෙස් මුහුණු නිරූපණය කිරීම සඳහා නිර්මාණය කළවිශේෂ පවුරක් ද ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියේ ඉදිකර තිබුණි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සංචාරක ව්‍යාපාරයේ නිරතව සිටින දේශීය සමාගම් 14 ක් සමඟ 2014 සැප්තැම්බර් 25 28 දක්වා පවත්වන ලද මෙම වසරේ සැණකෙළියට සහභාගී විය.





ජපාන භාෂාවෙන් පිළියෙළ කරන ලද ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ වීඩියෝ දර්ශන LED තිර තුනක් උපයෝගී කර ගනිමින් ප්‍රදර්ශනය කරන ලදී. ජපානයේ ප්‍රාන්ත 47 ක් හා ලොව පුරා රටවල් 150 ක නියෝජිතයන් මෙම ප්‍රදර්ශන පරිශ්‍රයේ නැගෙනහිර දිශාවේ පිහිටි ශාලා අංක 01 07 දක්වා ප්‍රදර්ශන ශාලාවල තම ගමනාන්තය ප්‍රදර්ශනය කරනු ලැබූහ. ඉඩම්, යටිතල පහසුකම්, ප්‍රවාහන හා සංචාරක කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වන ඔට්සුකා ටකාෂි මහතා හා සංචාරක නියෝජිතයන්ගේ ජපාන සංගමයේ විධායක කමිටුව ද ශ්‍රී ලංකා සංචාරක කර්මාන්ත ප්‍රදර්ශනය කුටිය නැරඹීමට පැමිණියහ.

බස්නාහිර පළාතේ කලා හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නර්තන කණ්ඩායමක් කැඳවා ගනිමින් මෙම සංචාරක සැණකෙළි භූමියේ දී නර්තන සංදර්ශනයක් පැවැත්වීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) කටයුතු කරන ලද අතර මෙම නර්තන සංදර්ශනය නැරඹීමේ අරමුණින් නරඹන්නන් විශාල පිරිසක් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියට පැමිණියහ. නර්තන කණ්ඩායම ඉදිරිපත් කරන ලද සම්ප්‍රදායික සංස්කෘතික නර්තන විශේෂාංග බොහෝ දෙනෙකුගේ ඇගයීමට ලක් විය. මෙම ප්‍රදර්ශනය පැවැත් වූ තෙදින පුරා නැවුම් ලංකා තේ රස විඳීමේ අරමුණින් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය තුළ පිළියෙළ කර තිබූ ලංකා තේ කවුන්ටරය වෙත විශාල නරඹන්නන් පිරිසක් ආකර්ෂණය වූහ. මෙම ප්‍රදර්ශනය පැවැත් වූ තෙදින පුරා ක්‍රියාත්මක වූ ලංකා තේ කවුන්ටරය වෙත පැමිණි ජපාන නරඹන්නන් 5000 කට අධික සංඛ්‍යාවක් ලංකා තේවල ඉම්හිරි රසය අත් දුටහ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) මගින් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය තුළ පාරිභෝගික සමීක්ෂණයක් සිදු කළ අතර ජපාන අමුත්තන් 200 ක් පමණ සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව පිළිබඳව ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කළහ. මෙම සමීක්ෂණයට සහභාගී වීම වෙනුවෙන් ඔවුන් සියලු දෙනාටම සමරු ග්‍රන්ථයක් පිළිගන්වනු ලැබීය.

## මුහුදු හා කිමිදුම් සැණකෙළිය, ජපානයේ ටෝකියෝ නගරයේ දී 2014 අප්‍රේල් 04 06 දක්වා

මෙම මුහුදු හා කිමිදුම් සැණකෙළිය ආසියාවේ විශාලතම කිමිදුම් හා නිවාඩු ප්‍රදර්ශනය ලෙස වර්ගීකරණය කර ඇති අතර මෙවර මෙම ප්‍රදර්ශනය 2014 අප්‍රේල් 4 6 දක්වා ජපානයේ දී පවත්වනු ලැබීය. දශ ලක්ෂ සංඛ්‍යාත ජපාන කිමිදුම්කරුවන් අතරින් මුහුදේ කිමිදීමට විශාල කැමැත්තක් හා උනන්දුවක් දක්වන, නිරන්තරයෙන්ම නව ගමනාන්ත පිළිබඳව ගවේෂණය කරන, අද්විතීය නවමු අත්දැකීම් ලබා ගැනීමට හැකි සෑම විටකම අපේක්ෂා කරන කිමිදුම්කරුවන් රාශියක් මෙම සැණකෙළිය වෙත ආකර්ෂණය කර ගැනීමට හැකි විය.

## ගමනාන්තය හුරු කරවීමේ චාරිකා මාධ්‍යවේදීන් වෙත ලබාදීම්

## ෆූජි රූපවාහිනී ජාලය, ජපානය 2014 ජනවාරි 3 8 දක්වා

ෆූජි රූපවාහිනී නාලිකාව ප්‍රේක්ෂකයින් විශාල සංඛ්‍යාවක් නරඹන ජපානයේ වඩාත්ම ජනප්‍රිය අංක 1 රූපවාහිනී නාලිකාව ලෙස සලකනු ලබයි. 'ෂෝකො නකගාවා ශ්‍රී ලංකාව හඳුන්වා දෙයි' ලෝක උරුමයන් සතු වීම නිසා මහත් සමෘද්ධියට පත් වූ රටක්' යන තේමාවෙන් ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම රූපවාහිනී කණ්ඩායමේ සාමාජිකයන් 12 දෙනෙකු විසින් විශේෂ රූපවාහිනී වැඩසටහනක් ජපානයේ දී රූගත කරනු ලැබීය. මෙය ෆූජි රූපවාහිනී ජාලය හා එක්ව විනාඩි 80 ක වැඩසටහනක් සකස් කිරීමට ශ්‍රී ලංකාවට ලැබුණු අනර්ඝතම අවස්ථාවකි. මෙම වැඩසටහන ෆූජි රූපවාහිනී ජාලය මගින් 2014 මාර්තු 02 වන ඉරිදා වැඩිම ප්‍රේක්ෂක සංඛ්‍යාවක් රූපවාහිනිය නරඹන කාලය තුළ ජාතික වශයෙන් විකාශනය කරනු ලැබීය. මෙම වැඩසටහන මගින් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයට අදාළ ශ්‍රී ලංකාවේ ලෝක උරුමයන්, ඓතිහාසික ස්ථාන, ජනප්‍රිය ශ්‍රී ලාංකික ආහාර හා වෙනත් වැදගත් අවස්ථා පිළිබඳව ප්‍රේක්ෂක අවධානය යොමු කරවා තිබුණි.

## ෂොකෝ නකගාවාගේ හඳුන්වා දීමේ වැඩසටහනේ වාසනාවන්ත ජයග්‍රාහකයෝ සිව් දෙනා, ජපානය, 2014 ජුනි 23 28 දක්වා

ෂොකෝ නකගාවාගේ හඳුන්වාදීමේ වැඩසටහනේ වාසනාවන්ත ජයග්‍රාහකයන් පස් දෙනා 2014 ජුනි 23 28 දක්වා ශ්‍රී ලංකාවේ ගමනාන්තය හුරු කිරීමේ චාරිකාවක නිරතව සිටියහ.

## 3.1.10 කැනඩාව




13 රූපය මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (**SLTDA** සංඛ්‍යා ලේඛන වාර්තාව 2014)

2014 වර්ෂයේ දී සංචාරකයන් 33,282 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත. 2013 වර්ෂයේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 8% ක වැඩිවීමකි. එක් එක් මාසය තුළ කැනඩාවෙන් ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 2,724 | 3,070 |
| පෙබරවාරි | 2,343 | 2,609 |
| මාර්තු | 2,512 | 2,641 |
| අප්‍රේල් | 2,088 | 2,417 |
| මැයි | 2,406 | 2,296 |
| ජූනි | 3,400 | 3,759 |
| ජූලි | 3,608 | 3,741 |
| අගෝස්තු | 2,949 | 3,317 |
| සැප්තැම්බර් | 1,490 | 1,644 |
| ඔක්තෝබර් | 1,954 | 1,931 |
| නොවැම්බර් | 1,807 | 1,990 |
| දෙසැම්බර් | 3,645 | 3,867 |
| එකතුව | 30,926 | 33,282 |

(වගුව 10 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (**SLTDA** සංඛ්‍යාන වාර්තාව 2014)

### පාරිභෝගික හා සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

### මාධ්‍ය කණ්ඩායම, කියුබෙක් පළාත, කැනඩාව, 2014 පෙබරවාරි 1 7 දක්වා

ප්‍රංශ භාෂාව භාවිත කරන කියුබෙක් පළාතේ 80,000 ක පමණ ප්‍රේක්ෂක පිරිසක් නරඹන ඉවේෂන් රූපවාහිනී නාලිකාව සඳහා වැඩසටහනක් නිෂ්පාදනය කිරීමේ අරමුණින් එම රූපවාහිනි නාලිකාව නියෝජනය කරමින් මාධ්‍යවේදීහු පස් දෙනෙක් ශ්‍රී ලංකාවේ සත්කාරකත්වය යටතේ මෙරට සංචාරයක නිරත වූහ. මංගල උත්සව පැවැත්වීම සහ මධුසමය ගත කිරීම සඳහා ඉතා සුදුසු, අග්‍රගන්‍ය සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම පිළිබඳව මෙම වැඩසටහන් තුළින් අවධානය යොමු කරවනු ලැබීය.

## 3.1.11 මැද පෙරදිග රටවල්

### පාරිභෝගික සහ සංචාරක සැණකෙළි සඳහා සහභාගිත්වය

### රියාද් සංචාරක සැණකෙළිය, 2014 අප්‍රේල් 15 18 වනදා දක්වා

අප්‍රේල් 15 18 දක්වා සෞදි අරාබි රාජ්‍යයේ 'ෆෝ සීසන්ස් හොටෙල් කින්ඩම් ටවර්' හි දී රියාද් සංචාරක සැණකෙළිය පවත්වනු ලැබීය. ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම ද ඇතුළු සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන් 12 දෙනෙකු සමඟ ශ්‍රී ලංකාව ප්‍රථම වරට මෙම ප්‍රදර්ශනයට සහභාගී විය.

### අරාබි සංචාරක වෙළඳපොළ (ATM) 2014, 2014 මැයි 5 8 දක්වා



මැදපෙරදිග සහ පෑන් අරාබි කලාපය තුළ සංචාරක කර්මාන්තය සම්බන්ධ ප්‍රමුඛ පෙළේ සංචාර හා සංචාරක ප්‍රදර්ශනය වන්නේ අරාබි සංචාරක වෙළඳපොළයි (ATM) 2014. මහාද්වීප හයක සංචාරක කර්මාන්තයට අයත් ප්‍රධාන පෙළේ මූල්‍ය ආයතන හා සමාගම් ඒකාබද්ධ වෙමින්,

අරාබි සංචාරක වෙළඳපොළ 2014 මැයි 5 8 දක්වා ඩුබායි අන්තර්ජාතික ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේ දී දින හතරක් පුරා පවත්වනු ලැබීය.

2003 වසරේ සිට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධණය ශ්‍රී ලංකාවේ සංචාර හා සංචරණ කර්මාන්ත සාමාජිකයින් සමඟ මෙම සැණකෙළිය සඳහා සහභාගී වන අතර මෙවර පැවැත් වූ සැණකෙළිය සඳහා අනුගාමී 12 වන වතාවටත් ශ්‍රී ලංකාව සහභාගී විය. ඉහළපෙළේ සංචාර හා සංචාරක නියෝජිතායතනවල නියෝජිතයන් හා හෝටල් අංශය නියෝජනය කරමින් සහභාගීවූවන් ද, ශ්‍රී ලංකා ගුවන් සමාගමේ නියෝජිතයන් ද ඇතුළුව 52 දෙනෙක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

**අන්තර්ජාතික මධ්‍යධරණී සංචාරක සැණකෙළිය (IMTM) – 2014, ඊශ්‍රායලය, 2014 පෙබරවාරි 11 12 දක්වා**

ගෝලීය වශයෙන් සංචාරක ව්‍යාපාරය ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා කටයුතු කරන, සංචාරක කර්මාන්ත අංශය වෙනුවෙන් ව්‍යාපාරික හා සංචාරක අවස්ථා සපයන, අන්තර්ජාතික මධ්‍යධරණී සංචාරක සැණකෙළිය (IMTM) සංචාරක ව්‍යාපාරික වෙළඳපොළ සම්බන්ධයෙන් ඊශ්‍රායලයේ පවත්වනු ලබන විශාලතම වාර්ෂික, වෘත්තීය හා රාජ්‍ය සැණකෙළිය විය. මේ වසරේ සිට මෙම සැණකෙළිය 2014 පෙබරවාරි 11 හා 12 වන දින ඊශ්‍රායලයේ ටෙල් අවිව් නගරයේ ව්‍යාපාරික ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබීය. ORTRA සමාගම හා ඊශ්‍රායල් සංචාරක ප්‍රවෘත්ති සමාගම අන්තර්ජාතික මධ්‍යධරණී සංචාරක සැණකෙළියේ (IMTM) ප්‍රධාන සංවිධායකවරුන් වූ අතර ඊශ්‍රායලයේ සංචාරක අමාත්‍යාංශය මෙම සැණකෙළිය සඳහා අනුග්‍රාහකත්වය සපයනු ලැබීය. යුරෝපය, ආසියා ශාන්තිකර හා ලතින් ඇමෙරිකානු රටවල් 50 කට අධික සංඛ්‍යාවක් මෙම වසරේ පැවැත් වූ මෙම සැණකෙළියට සහභාගී වූහ. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම මෙන්ම ඊශ්‍රායලයේ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා අවස්ථාව සලසා දීම මෙම ප්‍රධාන පෙළේ ව්‍යාපාරික හා සංචාරක සැණකෙළියේ අභිප්‍රාය විය. රටවල් පනහකට අධික සංඛ්‍යාවක් මෙම සැණකෙළියට සහභාගී වූහ. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකත්ව ආයතන (SME) වලට ඊශ්‍රායලය හා වෙනත් යුරෝපීය /ආසියානු / ආසියා පැසිපික් කලාපීය රටවල් සමඟ සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ අවස්ථා ද, ඔවුන්ගේ නිෂ්පාදන හා සේවා ප්‍රදර්ශනය කිරීමේ අනගිභවනීය අවස්ථාව ද මෙම සැණකෙළිය මගින් ලබා දී තිබුණි.

## මාධ්‍යවේදීන් සඳහා ගමනාන්තය හුරු කිරීමේ චාරිකා



2014 මාර්තු 20 27 දක්වා කාල සීමාව තුළ චාරිකා මෙහෙයුම්කරුවන් 19 දෙනෙකු හා පුවත්පත් කලාවේදීන් 4 දෙනෙකු සඳහා ගමනාන්තය හුරු කිරීමේ චාරිකා සූදානම් කර තිබුණි. පලස්තීන ප්‍රවෘත්ති නියෝජිතායතනයේ රූපවාහිනී හා ගුවන් විදුලිය, අල් හයට් පුවත්පත හා පලස්තීනයේ අල් කුඩ්ස් ආදී ආයතන නියෝජනය කරමින් මාධ්‍යවේදීන් පහළොස් දෙනෙකු ඔවුන් වෙත පිරිනැමූ ගමනාන්තය හුරු කරවීමේ චාරිකාවක් මගින් ශ්‍රී ලංකාවට පැමිණියහ.

## 3.1.12 නෙදර්ලන්තය




**14 රූපය: මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDAසංඛ්‍යා ලේඛන වාර්තාව 2014)**

2014 වර්ෂය තුළ සංචාරකයන් 242,734 ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත. 2013 වර්ෂයේ සංචාරක පැමිණීම් හා සැසඳීමේ දී මෙය 9% ක වර්ධනයක් බව සඳහන් කළ යුතුය. නෙදර්ලන්තයේ සිට ශ්‍රී ලංකාවේ සංචාරය කළ සංචාරකයන් ගණන ඒ ඒ මාසයට අනුව පහත වගුවේ දක්වා ඇත.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 2,015 | 1,958 |
| පෙබරවාරි | 1,825 | 2,066 |
| මාර්තු | 1,497 | 1,540 |
| අප්‍රේල් | 1,277 | 1,442 |
| මැයි | 816 | 973 |
| ජූනි | 1,372 | 1,068 |
| ජූලි | 4,884 | 5,582 |
| අගෝස්තු | 2,184 | 2,490 |
| සැප්තැම්බර් | 1,609 | 1,742 |
| ඔක්තෝබර් | 1,482 | 1,509 |
| නොවැම්බර් | 1,276 | 1,498 |
| දෙසැම්බර් | 2,044 | 2,328 |
| එකතුව | 22,281 | 24,196 |

වගුව 12 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

## පාරිභෝගික හා සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

### වකාන්තිබ(ර්)ස්උට්‍රෙක්ට් නෙදර්ලන්තය 2014 ජනවාරි 14 19 දක්වා.



වකාන්තිබ(ර්)ස් උට්‍රෙක්ට් අන්තර්ජාතික සංචාරක හා විනෝද සැණකෙළිය 2014 ජනවාරි 14 19 දිනවල නෙදර්ලන්තයේ උට්‍රෙක්ට් නගරයේ රාජකීය ඕලන්ද ජාර්බස් ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වෙනුවෙන් වර්ග මීටර් 60 ක භූමි ප්‍රදේශයක් ලබා දී තිබුණු අතර ව්‍යාපාරික සහභාගිවන්නන් 06 ක් එම ප්‍රදර්ශන කුටියේ ප්‍රවර්ධන කටයුතුවල නිරතව සිටියහ. සංචාරක කර්මාන්තයේ වෘත්තීය මට්ටමින් නිරතව සිටින නරඹන්නන් විශාල සංඛ්‍යාවක් හා සාමාන්‍ය මහජනතාව ද මෙම සැණකෙළිය නැරඹීමට පැමිණි ප්‍රේක්ෂකයන් අතර වූහ. 2013 වසරට සාපේක්ෂව 13% ක කැපී පෙනෙන වර්ධනයක් සටහන් කරමින් අමුත්තන් 117,520 ක් මෙම ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි අතර ව්‍යාපාරික අමුත්තන් 18,803 ක් සමඟ ප්‍රදර්ශකයෝ 1208 ක් මෙම සැණකෙළිය සඳහා සහභාගී වූහ.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) වෙනුවෙන් නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිලධාරීහු මෙම සැණකෙළියට සහභාගී වූහ. නෙදර්ලන්තයේ තානාපතිතුමා සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවක් ද සහිතව ඉහළ පෙළේ ඕලන්ද රූපවාහිනී වැඩසටහනක් බෙනලක්ස් කලාපයේ දී විකාශනය කළ අතර සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව පිළිබඳව සංචාරක තොරතුරු සැපයූ ප්‍රමුඛ පෙළේ මාධ්‍යගත වෙබ් අඩවියක් වන www.reisbijbel.nl මගින් රූ ගත කරන ලද තත්පර 30 ක ප්‍රවර්ධනාත්මක වීඩියෝ චිත්‍රපටයක් ද තිරගත කරනු ලැබීය.



ශ්‍රී ලංකාවේ සියලුම සංචාරක ආකර්ෂණ විශේෂයෙන් ඉස්මතු වන පරිදි නිර්මාණය කර තිබූ ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වෙත පැමිණි අමුත්තන් ඉතා සාදරයෙන් පිළිගන්නා ලද අතර ශ්‍රී ලංකාවේ සංස්කෘතියේ හා උරුමයේ පරිපූර්ණ සම්මිශ්‍රණයක අසිරිය ද ඔවුන් වෙත පිරිනමනු ලැබීය. නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා තානාපති, බුද්ධි ආතාවුද මැතිතුමා විසින් වකාන්තිබ(ර්)ස් 2014 සැණකෙළියේ ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබීය.

## මාධ්‍ය වෙත පිරිනමන ලද ගමනාන්තය හුරු කිරීමේ චාරිකාව

### ERICA OP REIS (එරිකා'ස් ට්‍රැවල්ස්) සංචාර හා සංචාරක කර්මාන්තය පිළිබඳ රූපවාහිනී චිත්‍රපට මාලාව, NEIHE මාධ්‍ය, 05දෙනෙකු සඳහා අගෝස්තු 08 13 වනදා දක්වා

ඕලන්ද ජාතික රූපවාහිනියේ පළමු හා වඩාත්ම ජනප්‍රිය රූපවාහිනී නාලිකාවේ ප්‍රදර්ශනය වූ ERICA OP REIS යනු නෙදර්ලන්තයේ ඉහළම ජන ප්‍රසාදය දිනාගත් සංචාරක රූපවාහිනී ප්‍රදර්ශනයයි. අනෙකුත් සංස්කෘතීන් පිළිබඳ අවබෝධය හා ගෞරවය වැඩි දියුණු කිරීමේ අරමුණින් ලොව පුරා සිටින සිටින මිනිසුන් ප්‍රබෝධමත් කිරීමේ

හැකියාවෙන් යුත් පුද්ගලයන් හමුවීම පිළිබඳව මෙම වැඩසටහන මගින් අවධානය යොමු කරයි. ජනමාධ්‍ය හා ප්‍රචාරණය පිළිබඳව විවිධ සම්මානවලින් පිදුම් ලද නෙදර්ලන්තයේ හිටපු නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍ය (රාජ්‍ය ලේකම්) සහ දෙවරක්ම ඔලිම්පික් පදක්කම් දිනාගත් එරිකා ටර්ප්ස්ට්‍රා මෙනවිය මෙම වැඩසටහන සඳහා සත්කාරකත්වය ලබා දෙන ලදී. මෙම ERICA OP REIS වැඩසටහන මිලියන 02 ක පමණ ජනකායක් නරඹති. මෙම වැඩසටහන දෙවරක්ම ඕලන්ද මහජන නාලිකාව මගින් විකාශනය කරන ලද අතර එම වැඩසටහන මිනිත්තු 40 කොටස් 6 කින් යුක්ත විය. මෙම නාලිකාවේ ප්‍රධානම ප්‍රේක්ෂක පිරිස අවු. 20 70 අතර වයස් කාණ්ඩවලට අයත් මධ්‍යම හා ඉහළ ආදායම්ලාභී පුද්ගලයන්ගෙන් සමන්විත විය. ඇසළ පෙරහැර, මහියංගන පුදබිම, දඹාන හා නුවරඑළිය ඇතුළත් වූ කොළඹ, මාතලේ අලු විහාරය සහ මහනුවර යන ප්‍රදේශවල මෙම රූපවාහිනී මාලා නාටකය රූ ගත කරනු ලැබීය.







### 3.1.13 මැලේසියාව




15 රූපයː මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDAසංඛ්‍යා ලේඛන වාර්තාව 2014)

2014 වර්ෂය තුළ සංචාරකයන් 23,178 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත. 2013 වසරේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 21% ක වැඩිවීමකි. ඒ ඒ මාසයට අදාළව මැලේසියාවේ සිට ශ්‍රී ලංකාව වෙත සංචාරය කරන ලද සංචාරකයන් සංඛ්‍යාව පහත වගුවේ දක්වා තිබේ.

| | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 1,258 | 2,059 |
| පෙබරවාරි | 2,418 | 1,756 |
| මාර්තු | 1,516 | 2,301 |
| අප්‍රේල් | 965 | 1,322 |
| මැයි | 1,732 | 1,735 |
| ජූනි | 2,169 | 2,807 |
| ජූලි | 1,062 | 1,684 |
| අගෝස්තු | 1,520 | 1,542 |
| සැප්තැම්බර් | 1,233 | 1,509 |
| ඔක්තෝබර් | 1,248 | 1,822 |
| නොවැම්බර් | 1,875 | 2,018 |
| දෙසැම්බර් | 2,185 | 2,623 |
| එකතුව | 19,181 | 23,178 |
| | | |

වගුව 13 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

**මාටා (MATTA) සංචාරක සැණකෙළිය, මැලේසියාව, 2014 සැප්තැම්බර් 05 07 දක්වා**



මැලේසියාව ශීඝ්‍රයෙන් වර්ධනය වන වෙළඳපොළක් ලෙස හඳුනාගෙන ඇති අතර සමාලෝචිත වසරේ පළමු භාගය තුළමැලේසියාව 26% ක වර්ධනයක් වාර්තා කරනු ලැබීය. මාටා සංචාරක සැණකෙළිය දේශීය සංචාරක ව්‍යාපාර සමාගම් 12 ක නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් 2014 සැප්තැම්බර් 05 07 දක්වා පුත්‍ර ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබීය.

### 3.1.14 ඉතාලිය




රූපය 16: මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

2014 වර්ෂය තුළ සංචාරකයන් 21,116 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදී. 2013 වර්ෂයේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 17% ක වර්ධනයකි. ඒ ඒ මාසයට අදාළව ඉතාලියේ සිට ශ්‍රී ලංකාව වෙත සංචාරය කරන ලද සංචාරකයන් සංඛ්‍යාව පහත වගුවේ දක්වා තිබේ.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 2,196 | 2,497 |
| පෙබරවාරි | 1,655 | 2,177 |
| මාර්තු | 1,484 | 1,592 |
| අප්‍රේල් | 948 | 1,511 |
| මැයි | 520 | 732 |
| ජූනි | 830 | 1,068 |
| ජූලි | 1,513 | 1,673 |
| අගෝස්තු | 2,833 | 3,043 |
| සැප්තැම්බර් | 1,059 | 1,125 |
| ඔක්තෝබර් | 1,036 | 1,060 |
| නොවැම්බර් | 1,318 | 1,519 |
| දෙසැම්බර් | 2,590 | 3,119 |
| එකතුව | 17,982 | 21,116 |

වගුව 13 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (**SLTDA** සංඛ්‍යාන වාර්තාව 2014)

## පාරිභෝගික හා සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

## BIT සංචාරක සැණකෙළිය, ඉතාලිය, 2014 පෙබරවාරි 13 15 දක්වා

ඉතාලි සංචාරක නිෂ්පාදන හා රටවල් 120 කට අධික සංඛ්‍යාවක විශිෂ්ටතම අන්තර්ජාතික සැපයුම්වල පරිපූර්ණ එකතුවක් ප්‍රදර්ශනය කරන ලෝකයේ විශාලතම සැණකෙළිය වශයෙන් BIT සංචාරක සැණකෙළිය සැලකිය හැකිය. පසුගිය වසර තුළ මෙම සංචාර සැණකෙළියේ වැදගත්කම ඉතාලිය අභිභවා ව්‍යාප්ත වූ අතර යුරෝපයේ අනෙකුත් අසල්වැසි කලාපවල අවධානය ද මෙම සැණකෙළිය වෙත යොමු වී තිබේ. මෙම BIT සංචාරක සැණකෙළිය සංචාරක කර්මාන්තයේ ප්‍රවීණයන්ගේ හා සංචාරක සේවා සපයන කර්මාන්තවල නියෝජිතයන් හමුවන වැදගත් ම මධ්‍යස්ථානයක් වේ.

ඉතාලියේ රෝම නගරයේ පිහිටා ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිලධාරීන් සංචාරක කර්මාන්ත සාමාජිකයින් සමඟ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් BIT 2014 සංචාරක සැණකෙළියට සහභාගී වූහ. ශ්‍රී ලංකාව BIT සංචාරක සැණකෙළියට නිරන්තරයෙන්ම සහභාගී වූ නිත්‍ය ප්‍රදර්ශකයෙක් වන අතර ශ්‍රී ලංකාව අග්‍රගන්‍ය සංචාරක ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ කර්තව්‍යයේ දී ශ්‍රී ලංකාවට සාර්ථකත්වය ගෙන දුන් ඉතා වැදගත් වූ සැණකෙළියක් බව අවිවාදයෙන් සඳහන් කළ හැකිය. BIT සංචාර සැණකෙළිය 2014 පෙබරවාරි 13 15 දක්වා ඉතාලියේ මිලාන් නගරයේ දී පවත්වනු ලැබූ අතර ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය ඉදිකිරීම සඳහා වර්ගමීටර් 100 ක භූමි ප්‍රදේශයක් ශ්‍රී ලංකාව වෙත ප්‍රදානය කර තිබුණි.

## TTG Incontri – 2014 (අන්තර්ජාතික ව්‍යාපාරික ද්විපාර්ශ්වික සාකච්ඡා සහිත සංචාරක ව්‍යාපාරික සැණකෙළිය) සංචාරක කර්මාන්තයේ වෘත්තිකයන් සඳහා තෙදින වැඩමුළුවක් ද සහිතව ඉතාලියේ රෙමිනි නගරයේ ද රෙමිනි පියෙරා හි දී, ඔක්තෝබර් 09 11 දක්වා.




TTG Incontri යනු සංචාරක කර්මාන්තය වෙනුවෙන් පවත්වනු ලබන ව්‍යාපාරික ද්විපාර්ශ්වික සාකච්ඡා සඳහා අවස්ථාව සලසන අතිශයින්ම වැදගත් සැණකෙළියකි. සංචාරක වෙළඳපොළ වෙත අවධානය යොමු කිරීමේ දී, ව්‍යාපාරික ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීම සඳහා අවස්ථාව සලසා දී තිබීම ප්‍රමුඛතම අවශ්‍යතාවකි. මෙම සැණකෙළිය සඳහා සහභාගී වන ප්‍රදර්ශකයන්/ අමුත්තන්ගේ තරාතිරම, සැණකෙළියේ විශාලත්වය සහ ලබා දී ඇති අවස්ථාවන් තුළින් මෙම ප්‍රදර්ශනයේ වැදගත්කම වසරින් වසර වැඩි දියුණු වෙමින් පවතී.

මෙම TIG Incontri සැණකෙළිය සංචාරක ව්‍යාපාරික සංවර්ධනය සැබවින්ම අරමුණු කරමින් පවත්වනු ලබන සැණකෙළියක් වන අතර අන්තර්ජාතික සැණකෙළියක් ලෙස හඳුන්වා දීමට ද නිල වශයෙන් සුදුසුකම් සපුරා ඇත. අන්තර්ජාතික සංචාරක ව්‍යාපාර සැණකෙළි සංගමයේ (ITTFA) සාමාජිකත්වය පිරිනමනු ලැබූ එකම ඉතාලි සැණකෙළිය වන්නේ ද මෙම සැණකෙළියයි. අන්තර්ජාතික ප්‍රදර්ශකයන් ඔවුන් වෙත පවතින ඉල්ලුම සපුරා ගන්නේ ද මෙම සැණකෙළිය තුළිනි. එමෙන්ම, නව සම්බන්ධතා ගොඩ නඟා ගැනීමට ද, ඉතාලි පාරිභෝගිකයන් වෙත ඉතාලි හා අන්තර්ජාතික සංචාරක නිෂ්පාදන බෙදා හරිනු ලබන සමාගම්වලින් පැමිණෙන අමුත්තන් 70% කට අධික ප්‍රමාණයකින් සමන්විත ඉලක්ක වෙළඳපොළ සඳහා නව නිෂ්පාදන එළි

දැක්වීම ට ද, සමාගම්වල ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සඳහා ද මෙම සැණකෙළිය මගින් අවස්ථාව සලසා දෙනු ලැබිය.



ඉතාලියේ රෝම නගරයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සංචාරක කර්මාන්ත සාමාජිකයන් ද සමග ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) වෙනුවෙන් මෙම TIG Incontri – 2014 සැණකෙළිය සඳහා සහභාගී විය. ශ්‍රී ලංකාව TIG Incontri – 2014 සංචාරක සැණකෙළිය සඳහා පළමුවරට සහභාගී වූ අතර මෙම සැණකෙළිය සඳහා ශ්‍රී ලංකාව සහභාගී වීම තුළින් පරමාදර්ශී සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නය සාර්ථක කර ගැනීමට හැකි විය. මෙම වසරේ TIG Incontri – 2014 සැණකෙළිය 2014 ඔක්තෝබර් 09 11 දක්වා ඉතාලියේ රෙමිනි නගරයේ දී පවත්වන ලද අතර ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වෙනුවෙන් වර්ගමීටර් 48 ක බිම් කොටසක් වෙන් කර දී තිබුණි.

ඉතාලියේ ශ්‍රී ලංකා තානාපති නාවලගේ බෙනට් කුරේ මැතිතුමා විසින් සංචාරක කර්මාන්තයේ නිරතව සිටින අනෙකුත් සාමාජිකයන් සමග එක්ව TIG Incontri – 2014 සැණකෙළියේ පළමු දිනය වූ ඔක්තෝබර් 09 වන දාශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය සාම්ප්‍රදායික පොල්තෙල් පහන දල්වා උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබිය.



## 3.1.15 සිංගප්පූරුව




රූපය 17: මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යා ලේඛන වාර්තාව 2014)

2014 වර්ෂයේ දී සංචාරකයන් 15,702 ක් ශ්‍රී ලංකාව වෙත සංචාරය කරන ලදී. 2013 වර්ෂයේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 1% ක වර්ධනයකි. සිංගප්පූරුවේ සිට ඒ ඒ මාසය තුළ ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 997 | 1,191 |
| පෙබරවාරි | 1,269 | 946 |
| මාර්තු | 1,166 | 1,151 |
| අප්‍රේල් | 909 | 1,075 |
| මැයි | 1,067 | 1,072 |
| ජූනි | 1,644 | 1,609 |
| ජූලි | 1,114 | 1,023 |
| අගෝස්තු | 1,511 | 1,126 |
| සැප්තැම්බර් | 1,058 | 1,019 |
| ඔක්තෝබර් | 975 | 1,241 |
| නොවැම්බර් | 1,357 | 1,638 |
| දෙසැම්බර් | 2,479 | 2,671 |
| එකතුව | | |
| | 15,546 | 15,762 |

වගුව 15 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

## පාරිභෝගික හා සංචාරක සැණකෙළි සඳහා සහභාගිත්වය

### ITB සිංගප්පූරුව, ආසියාව 2014 ඔක්තෝබර් 29 31 දින දක්වා

සංචාරක කර්මාන්තය වෙනුවෙන් ම විශේෂයෙන් සැලසුම් කරන ලද, සිංගප්පූරු නියෝජිතයන් මෙන් ම ඈත යුරෝපීය රටවලින් පැමිණි වෙනත් නියෝජිතයන් ද සමඟ ව්‍යාපාරික සම්බන්ධතා ඇති කර ගැනීම සඳහා ව්‍යාපාරික ද්විපාර්ශ්වික සාකච්ඡාවල නිරත වීම සඳහා අවස්ථාව සලසන සංචාරක සැණකෙළියකි. මේ වසර තුළපවත්වන ලද මෙම සැණකෙළිය 2014 ඔක්තෝබර් 29 31 වනදා දක්වා ශ්‍රී ලංකා ප්‍රදර්ශනය කුටියේ ප්‍රවර්ධන කටයුතුවල නිරත වූ දේශීය සංචාරක සමාගම් 10 ක සහභාගීත්වයෙන් පවත්වනු ලැබිණි.



## 3.1.16 නෝර්වේ




රූපය 18: මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යා ලේඛන වාර්තාව 2014)

2014 වර්ෂය තුළ සංචාරකයන් 9,237 ක් ශ්‍රී ලංකාව වෙත සංචාරය කරන ලද අතර 2013 වර්ෂයේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 8% ක වර්ධනයකි. නෝර්වේ සිට ඒ ඒ මාසය තුළ ශ්‍රී ලංකාවේ සංචාරයේ නිරත වූ සංචාරකයන් සංඛ්‍යාව පහත වගුවේ සඳහන් කර තිබේ.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 633 | 739 |
| පෙබරවාරි | 583 | 811 |
| මාර්තු | 577 | 474 |
| අප්‍රේල් | 314 | 459 |
| මැයි | 215 | 257 |
| ජූනි | 1,530 | 1,509 |
| ජූලි | 1,882 | 1,800 |
| අගෝස්තු | 489 | 403 |
| සැප්තැම්බර් | 427 | 362 |
| ඔක්තෝබර් | 449 | 471 |
| නොවැම්බර් | 530 | 679 |
| දෙසැම්බර් | 944 | 1,273 |
| එකතුව | 8,573 | 9,237 |

වගුව 16 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

## පාරිභෝගික හා සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

### නෝර්වීජියානු සංචාර සැණකෙළිය නෝර්වේ 2014 ජනවාරි 10 12 දක්වා

ඔස්ලෝ නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගීතාව සහිතව ශ්‍රී ලංකා සංචාරක සංචරණය දේශීය සංචාරක නියෝජිතයාතන 2 ක් ද සමඟ 2014 ජනවාරි 1012 දක්වා ටෙලෙන්ඩර් ඇරිනා හි පැවැත් වූ ඉහත සංචාරක සැණකෙළියට සහභාගී විය. සංචාරක ව්‍යාපාරයේ නිරතව සිටින අමුත්තන් 8,200 ක් ද ඇතුළු අමුත්තන් 45,000 ක් මෙම සැණකෙළිය වෙත ආකර්ෂණය කරගත හැකි විය.

මෙම සංචාරක සැණකෙළිය මගින් ශ්‍රී ලංකාවේ චමත්කාරජනක බව ප්‍රදර්ශනය කිරීමේ අවස්ථා ද, විචක්ෂණ සංචාරකයන් සඳහා අප රටේ පවතින විවිධාකාර සංචාරක ආකර්ෂණ පිළිබඳව ප්‍රදර්ශනය කිරීමේ අති උත්කෘෂ්ට අවස්ථා ද සලසා දී තිබුණි. සංචාරකයන් 4,500 කට වඩා අධික පිරිසක් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියෙන් ශ්‍රී ලංකාව පිළිබඳව විමසීම් සිදු කර තොරතුරු ලබා ගෙන තිබුණි.



### 3.1.17 දකුණු කොරියාව




රූපය 19: මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යා ලේඛන වාර්තාව 2014)

2014 වර්ෂයේ දී සංචාරකයන් 13452 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත. 2013 වර්ෂයේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 10% ක වර්ධනයකි. ඒ ඒ මාසයට අදාළව දකුණු කොරියාවෙන් ශ්‍රී ලංකාව වෙත සංචාරය කරන ලද සංචාරකයන් සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 1,429 | 1,807 |
| පෙබරවාරි | 576 | 1,263 |
| මාර්තු | 1,349 | 1,033 |
| අප්‍රේල් | 814 | 761 |
| මැයි | 705 | 720 |
| ජූනි | 745 | 889 |
| ජූලි | 1,149 | 1,247 |
| අගෝස්තු | 1,202 | 1,109 |
| සැප්තැම්බර් | 699 | 770 |
| ඔක්තෝබර් | 1,161 | 1,221 |
| නොවැම්බර් | 1,224 | 1,267 |
| දෙසැම්බර් | 1,154 | 1,325 |
| එකතුව | 12,207 | 13,412 |

වගුව 17 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

## පාරිභෝගික සහ සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

### 27 වන කොරියා ලෝක සංචාරක සැණකෙළිය (KOTFA) 2014




කොරියා ලෝක සංචාර සැණකෙළිය (KOTFA) මැයි 29 සිට ජූනි 01 දක්වා පවත්වනු ලැබීය. එය සියොල් නුවර පවත්වනු ලබන වඩාත්ම වැදගත් සංචාර හා සැණකෙළිය වන අතර චාරිකා මෙහෙයවන්නන් සහ සංචාරක කර්මාන්තයට අදාළ නිලධාරීන් වැඩි ප්‍රමාණයක් මෙම සැණකෙළිය වෙත ආකර්ෂණය වේ. රටවල් 60 කට අධික සංඛ්‍යාවක සංචාර සම්බන්ධ සංවිධාන 500 ක නියෝජිතයෝ මෙවර මෙම සැණකෙළියට සහභාගී වූ අතර මෙම වසරේ ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටියේ ප්‍රවර්ධන කටයුතු සඳහා සංචාර සමාගම් 11 ක නියෝජිතයෝ සහභාගී වූහ.

වෘත්තිකයන් සමග සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා සම්බන්ධතා ජාල ඇති කර ගැනීම, මුහුණට මුහුණලා සම්බන්ධතා පවත්වා ගැනීම, අනාගත ව්‍යාපාරික ගනුදෙනු ඇති කර ගැනීම හා දීර්ඝකාලීන ව්‍යාපාරික සම්බන්ධතා ගොඩ නඟා ගැනීම සඳහා පවතින විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට කොරියා ලෝක සංචාර සැණකෙළිය (KOTFA)පත් වී ඇති අතර රටවල් 60 ක් නියෝජනය කරමින් ප්‍රදර්ශකයන් 4800 ක් හා ව්‍යාපාරික අමුත්තන් 120,600 ක් ද, කොරියානු මහජනතාව ද මෙම ලෝක සංචාර සැණකෙළියට (KOTFA) සහභාගී වූහ.






## BITE 2014

17 වන බූසාන් අන්තර්ජාතික සංචාරක සැණකෙළිය BITE - 2014 සැප්තැම්බර් 12 15 දක්වා බූසාන් නගරයේ දී පවත්වනු ලැබීය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් එක් සමාගමක් මෙම සැණකෙළිය සඳහා සහභාගී විය. ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් මෙම සැණකෙළියට සහභාගී වීම සඳහා පහසුකම් සලසනු ලැබීය.

## කොරියා ශ්‍රී ලංකා සංචාර හා සංචාරක සංගමය ආරම්භ කිරීම

ශ්‍රී ලංකාව හා දකුණු කොරියාව අතර සංස්කෘතික සහ ආර්ථික සම්බන්ධතා වැඩිදියුණු කිරීම සඳහා 2014 පෙබරවාරි 14 වනදා සියොල් නගරයේ මිලේනියම් හිල්ටන් හෝටලයේ දී කොරියා ශ්‍රී ලංකා සංචාර හා සංචාරක සංගමය ස්ථාපනය කරනු ලැබීය. ශ්‍රී ලංකා කොරියානු සම්බන්ධතා තුළින් වැඩිදියුණු කළ හැකි ප්‍රධානම ක්ෂේත්‍රයක් වන සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම මෙම සංගමය ස්ථාපනය කිරීමේ ප්‍රධාන අරමුණක් විය.



මෙම සංගමයේ සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වූ ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මහතාට මෙම සංගමයේ කොරියානු හා ශ්‍රී ලාංකික සාමාජිකයන් 100 කට අධික ප්‍රමාණයක් මුණ ගැසීමේ අවස්ථාව හිමි විය. පාරිසරික හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා ද මෙම අවස්ථාවට සහභාගී විය. වසර මුළුල්ලේ ම ක්‍රියාත්මක කරනු ලැබූ විශේෂ ප්‍රවර්ධන ව්‍යාපාර මාලාවක් තුළින් මේ වනවිටත් ශ්‍රී ලංකාව කොරියානු ප්‍රධාන වෙළඳපොළවල්වල ඉතා ශක්තිමත් ලෙස ප්‍රවර්ධනය කර තිබුණි. මෙම සංගමය මගින් සංචාරක ප්‍රවර්ධන ව්‍යාපාර සඳහා අතිරේක ජවයක් ලබා දෙනු ලැබීය. මෙම අවස්ථාවට සහභාගී වූ සාමාජිකයෝ මෙම සංගමය ආරම්භ කිරීම පිළිබඳව ඉතා උද්යෝගයෙන් පසු වූ අතර මෙම සංගමය සාර්ථක වේවායි ඉත සිතින් සුබ ප්‍රාර්ථනා කළහ. එමෙන්ම, ද්විපාර්ශ්වික සහයෝගීතාව, ශීඝ්‍රයෙන් සංවර්ධනය වන සංචාරක කර්මාන්තය සහ සමාජආර්ථික අනන්‍යතාව හා රටවල් දෙකේ සංස්කෘතීන් පිළිබඳව මනා අවබෝධයක් ලබාගැනීම තුළින් දීර්ඝ කාලීන තිරසාර ප්‍රතිඵල ලබා ගැනීමට ද එම සංගමය තුළින් හැකියාව ලැබෙනු ඇතැයි සාමාජිකයෝ අපේක්ෂා කරති.




## මාධ්‍ය වෙත පිරිනමන ලද ගමනාන්තය හුරු කිරීමේ චාරිකා

### කොරියානු සංචාර සැණකෙළි සංවිධානය

කොරියානු සංචාර සැණකෙළි සංවිධානයේ උප සභාපති, ලී මියුන්ග් හූන් මහතා 2013 දෙසැම්බර් 23 සිට 2014 ජනවාරි 03 වන දා දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. කොරියානු සංචාරකයන් අතර අග්‍රගන්‍ය සංචාරක ගමනාන්තයක් ලෙස සැලකෙන ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සෘජුවම ශ්‍රී ලංකාවෙන් ලබාගැනීම මෙම සංචාරයේ අරමුණ විය. මෙයට අමතරව, ප්‍රධාන පෙළේ සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා වාර්තා චිත්‍රපටයක් නිපදවීමේ අරමුණින් 2014 මැයි 08 11 දක්වා බුද්ධ රූපවාහිනී මාධ්‍යවේදීන් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ.

## 3.1.18 පෝලන්තය, හංගේරියාව, තුර්කිය හා චෙක් ජනරජය



### පෝලන්තය

2014 වර්ෂයේ දී සංචාරකයින් 13,370 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත. මෙය 2013 වර්ෂයේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව 38% ක වර්ධනයකි. පෝලන්තයේ සිට ඒ ඒ මාසය තුළ ශ්‍රී ලංකාවේ සංචාරයේ නිරත වූ සංචාරකයන් සංඛ්‍යාව පහත වගුවේ සඳහන් කර තිබේ.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 1,269 | 2,193 |
| පෙබරවාරි | 1,571 | 2,258 |
| මාර්තු | 1,138 | 1,903 |
| අප්‍රේල් | 766 | 823 |
| මැයි | 366 | 357 |
| ජූනි | 356 | 316 |
| ජූලි | 347 | 609 |
| අගෝස්තු | 461 | 624 |
| සැප්තැම්බර් | 348 | 578 |
| ඔක්තෝබර් | 448 | 520 |
| නොවැම්බර් | 1,263 | 1,565 |
| දෙසැම්බර් | 1,355 | 1,624 |
| එකතුව | 9,688 | 13,370 |

වගුව 18 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (**SLTDA** සංඛ්‍යාන වාර්තාව 2014)

### චෙක් ජනරජය

2014 වර්ෂය තුළ සංචාරකයින් 11,736 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත. මෙය 2013 වර්ෂයේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව 32.1% ක වර්ධනයකි. චෙක් ජනරජයේ සිට ශ්‍රී ලංකාව වෙත ඒ ඒ මාසයට අනුව සංචාරක පැමිණීම් පහත වගුවේ දක්වා ඇත.

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 994 | 1,323 |
| පෙබරවාරි | 1,581 | 1,996 |
| මාර්තු | 1,148 | 1,464 |
| අප්‍රේල් | 629 | 1,083 |
| මැයි | 214 | 268 |
| ජූනි | 230 | 280 |
| ජූලි | 451 | 595 |
| අගෝස්තු | 368 | 614 |
| සැප්තැම්බර් | 331 | 619 |
| ඔක්තෝබර් | 533 | 598 |
| නොවැම්බර් | 1,086 | 1,454 |
| දෙසැම්බර් | 1,316 | 1,442 |
| එකතුව | 8,881 | 11,736 |

වගුව 19 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (**SLTDA** සංඛ්‍යාන වාර්තාව 2014)

### පාරිභෝගික හා සංචාර සැණකෙළි සඳහා සහභාගීත්වය

### 2014 මාර්තු 26 දින පෝලන්තයේ දී පවත්වනු ලැබූ 'ශ්‍රී ලාංකික සන්ධ්‍යාව'

අමුත්තන් 100 කට අධික සංඛ්‍යාවක සහභාගිත්වයෙන් 2014 මාර්තු 26 වන දින වෝර්සෝ නගරයේ බීලානි නාගරික සංස්කෘතික මධ්‍යස්ථානය හා එක්ව පෝලන්ත ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් 'ශ්‍රී ලාංකික සන්ධ්‍යාව' සංවිධානය කරනු ලැබීය. මෙම සන්ධ්‍යාව පැවැත්වීම මගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරන ලදී.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) මගින් ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන සංස්කෘතික විවිධත්වය, ඓතිහාසික සන්ධිස්ථාන හා ශ්‍රී ලංකාවේ පෙර නොදුටු විරූ සමෘද්ධිය ප්‍රදර්ශනය කරනු ලැබූ වීඩියෝ ප්‍රදර්ශන ඉදිරිපත් කිරීම තුළින් 'ඉන්දියන් සාගරයේ මුතු ඇටය' යන විරුදාවලිය ලද ශ්‍රී ලංකාව මොහොතකට හෝ දැක බලා ගැනීමේ අවස්ථාව සංචාරකයන්ට ලබා දෙනු ලැබිණි.

### TT වෝර්සෝ සැණකෙළිය, පෝලන්තය 2014 නොවැම්බර් 27 29 දක්වා

TT වෝර්සෝ සංචාර සැණකෙළිය සඳහා ශ්‍රී ලංකාව සහභාගි වී ඇති අතර මෙම සැණකෙළියට සහභාගී වීම තුළින් ශ්‍රී ලංකාව පරමාදර්ශී සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් සාර්ථක කර

ගැනීමට අවස්ථාව සැලසුණි. TT වෝර්සෝ 2014 සැණකෙළිය 2014 නොවැම්බර් 27 29 දක්වා පෝලන්තයේ වෝර්සෝ නගරයේ දී පවත්වනු ලැබීය.




ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය ඉදි කිරීම සඳහා වර්ගමීටර් 42 ක භූමි ප්‍රදේශයක් ලැබී තිබූ අතර ශ්‍රී ලංකාවේ සියලුම සංචාරක ආකර්ෂණ විශේෂයෙන් ඉස්මතු වන පරිදි නිර්මාණය කර තිබූ ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වෙත පැමිණි අමුත්තන් ඉතා සාදරයෙන් පිළිගන්නා ලද අතර ශ්‍රී ලංකාවේ සංස්කෘතියේ හා උරුමයේ පරිපූර්ණ සම්මිශ්‍රණයක අසිරිය ද ඔවුන් වෙත පිරිනමනු ලැබීය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) වෙනුවෙන් පෝලන්ත ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සංචාරක කර්මාන්තයේ හවුල්කරුවන් සමඟ TT වෝර්සෝ 2014 සැණකෙළියට සහභාගී විය.

පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති, ඩී.එස්. ද සිල්වා මැතිතුමා TT වෝර්සෝ 2014 ප්‍රදර්ශනයේ පළමු දිනය වූ නොවැම්බර් 27 වනදා සංචාරක කර්මාන්තයේ හවුල්කරුවන් සමඟ එක්ව පොල්තෙල් පහන දල්වා මෙම සැණකෙළියේ සමාරම්භය සනිටුහන් කරනු ලැබීය.



**සංචාරක කර්මාන්තය පිළිබඳ අන්තර්ජාතික ප්‍රදර්ශනය, සෞඛ්‍යය/ස්පා පිළිබඳ විශේෂ ප්‍රදර්ශන, ව්‍යාපාරික සංචාරක කර්මාන්තය ( MICE අංශය) සක්‍රිය සංචාරක කර්මාන්තය, ගුවන් තොටුපොළ හා ගුවන් සමාගම්, පෝලන්තයේ පොස්නාන් අන්තර්ජාතික සැණකෙළි භූමියේ දී**

සංචාරක කර්මාන්තය පිළිබඳ අන්තර්ජාතික ප්‍රදර්ශනය ඔක්තෝබර් 23 25 දින දක්වා පෝලන්තයේ පොස්නාන් අන්තර්ජාතික සැණකෙළි භූමියේ දී පවත්වනු ලැබීය. පෝලන්තයේ සංචාරක අංශය හා සම්බන්ධ විශාලතම ව්‍යාපාරික ප්‍රදර්ශනය යන අභිමානවත් පිළි ගැනීම මෙම Tour Salon සැණකෙළියට හිමි වී ඇත. චාරිකා මෙහෙයුම්කරුවන්, සංචාරක නියෝජිතයන් සහ ගුවන්සමාගම් මෙන්ම නවාතැන් සේවා සපයන්නන් යනාදී වශයෙන් පුළුල් පරාසයක පැතිරුණු සංචාරක අංශයේ විවිධ ක්‍රියාකාරකම්වල නිරත ව සිටින සියළුම වෘත්තිකයන් මෙම ප්‍රදර්ශනය මගින් එකට මුණ ගැසීමට සලස්වනු ලැබීය.

## TOUR SALON 2014



පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සංචාරක කර්මාන්ත සාමාජිකයින් සමඟ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් Tour Salon 2014 ප්‍රදර්ශනයට සහභාගී විය.

Tour Salon 2014 පෝලන්තයේ පොස්නාන් හි දී 2014 ඔක්තෝබර් 23 25 දක්වා පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය ඉදි කිරීම සඳහා වර්ගමීටර් 40 ක භූමි ප්‍රදේශයක් ලබාදී තිබුණි.ශ්‍රී ලංකාවේ සියලුම සංචාරක ආකර්ෂණ විශේෂයෙන් ඉස්මතු වන පරිදි නිර්මාණය කර තිබූ ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වෙත පැමිණි අමුත්තන් ඉතා සාදරයෙන් පිළිගන්නා ලද අතර ශ්‍රී ලංකාවේ සංස්කෘතියේ හා උරුමයේ පරිපූර්ණ සම්මිශ්‍රණයක අසිරිය ද ඔවුන් වෙත පිරිනමනු ලැබීය.



## ශ්‍රී ලාංකික සන්ධ්‍යාව පෝලන්තය 2014 මාර්තු 26 වන දා

අමුත්තන් 100 කට අධික සංඛ්‍යාවක සහභාගිත්වයෙන් 2014 මාර්තු 26 වන දින වෝර්සෝ නගරයේ බෙයිලානි නාගරික සංස්කෘතික මධ්‍යස්ථානය හා එක්ව පෝලන්ත ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් 'ශ්‍රී ලාංකික සන්ධ්‍යාව' සංවිධානය කරනු ලැබීය. මෙම සන්ධ්‍යාව පැවැත්වීම මගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ප්‍රධාන වශයෙන් ම අවධානය යොමු කරන ලදී.







## ඩිල්මා තේ සමඟ සංචාරක ප්‍රවර්ධනාත්මක උදෑසන 2014 ඔක්තෝබර් 9 වනදා වෝර්සෝ නගරයේ දී

පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති ඩී.එස්. ද සිල්වා මැතිතුමාගේ සත්කාරත්වය යටතේ වෝර්සෝ නගරයේ රාජ්‍යතාන්ත්‍රිකයන් උදෙසාදිල්මා තේ සමඟ සංචාරක ප්‍රවර්ධනාත්මක උදෑසනක් පවත්වනු ලැබීය. ශ්‍රී ලංකාව සුවිශේෂී රටක් වශයෙන් සැලකිය හැකි සියල්ල අනාවරණය කරමින් අප රටේ සියලුම ආශ්චර්ය එකට කැටි කොට ශ්‍රී ලංකාව පිළිබඳ ඉතා චමත්කාරජනක නිරූපණය කිරීමක් ද ඩිල්මා තේ සමඟ සංචාරක ප්‍රවර්ධනාත්මක උදෑසන සඳහා සහභාගී වූ අමුත්තන් වෙනුවෙන් පවත්වනු ලැබීය. එයින් අනතුරුව, තේ වගාවක දර්ශන සමඟ තේ කොළය තේ කෝප්පය දක්වා ගමන් කරන ආකාරය පිළිබඳව ඩිල්මා සමාගමේ නියෝජිතයකු විසින් විස්තර කර දෙනු ලැබීය. විවිධ තේ වර්ග හතරකින් ද, තේවලට ගැළපෙන කෙටි කෑම වර්ගවලින් ද මෙම අවස්ථාවට පැමිණ සිටි අමුත්තන්ට සංග්‍රහ කරනු ලැබීය.



## හොලිඩේ වර්ල්ඩ් මධ්‍යම යුරෝපීය සංචාරක ව්‍යාපාරික සැණකෙළිය 2014 පෙබරවාරි 20 23 ප්‍රාග් ප්‍රදර්ශන පිටිය

එකම ස්ථානයක සිට ලොව පුරා සංචාරය කර මුළු ලොවේම අසිරිය දක ගැනීමේ දුර්ලභ අවස්ථාව සියලු අමුත්තන්ට හිමි විය. රටවල් 50 ක් නියෝජනය කරමින් ප්‍රදර්ශකයන් 800 කට වඩා අධික සංඛ්‍යාවක් ද, අමුත්තන් 35,000 ක් පමණ ද මෙම සැණකෙළිය නැරඹීමට පැමිණ සිටියහ.

වික්‍රමාන්විත චාරිකා හා අත්දැකීම්වලින් සපිරි උත්සවයක්! සංචාරක සැණකෙළියේ එක් කොටසක් ලෙස ක්‍රිගික්'ස් පැවිලියන් Eහි සති අන්තයේ දී සාම්ප්‍රදායික ලෝක චිත්‍රපට සංචාරය පවත්වනු ලැබීය. සංචාරකයන් සමඟ සිදු කරන ලද සාකච්ඡා හා අද්විතීය තිරගත කිරීම් මෙන්ම ප්‍රදර්ශන ද ඇතුළත් වූ සිනමා උළෙල මෙම වර්ෂයේ ද පවත්වනු ලැබීය.

## නිවාඩු දින ලෝක සංචාරක සහ විවේක සැණකෙළිය 2014 පෙබරවාරි 20 23 දක්වා චෙක් ජනරජයේ දී.



ඕස්ට්‍රියාවේ වියනා හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සංචාරක ව්‍යාපාරික සමාගම් දෙකක් සමඟ මෙම අන්තර්ජාතික සංචාර හා විවේක සැණකෙළියට සහභාගී විය. ශ්‍රී ලංකාව පිළිබඳ දැනුවත් බව වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම විශිෂ්ට සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ අවස්ථාවද සැලසෙන මෙම සංචාර හා විවේක සැණකෙළියට ශ්‍රී ලංකාව සහභාගී වූ හතරවන අවස්ථාව මෙයයි. ව්‍යාපාරික පදනමක් සහිත දේශීය ව්‍යාපාරික සමාගම්වලට ඔවුන්ගේ නිෂ්පාදන ඉදිරිපත් කිරීමට හා නව ව්‍යාපාරික ගිවිසුම්වලට එළැඹීමට අවශ්‍ය පහසුකම් මෙම සැණකෙළිය මගින් සපයා තිබුණි.




## 3.1.19 ඕස්ට්‍රියාව




රූපය 20: මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යා ලේඛන වාර්තාව 2014)

2014 වර්ෂය තුළ සංචාරකයින් 12,664 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත' මෙය 2013 වර්ෂයේ සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව 12% ක වර්ධනයකි.

## පාරිභෝගික හා සංචාර සැණකෙළි සඳහා සහභාගීත්වය ෆේරියන් 2014 ඔස්ට්‍රියාව 2014 ජනවාරි 16 19 දක්වා

ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා දූත මණ්ඩලය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නිවාඩු, සංචාර හා විවේක අන්තර්ජාතික සැණකෙළියක් වන ෆේරියන් 2014 සැණකෙළිය සඳහා සහභාගි විය. රටවල් 70 කට අධික සංඛ්‍යාවක් නියෝජනය කරමින් ප්‍රදර්ශකයන් 750 ක ට අධික සංඛ්‍යාවක් ඔවුන්ගේ සංචාරක ගමනාන්ත නියෝජනය කරමින් මෙම සැණකෙළියට සහභාගී වූ අතර නරඹන්නන් 150,367 ක් ද මෙයට සහභාගී වූ බව වාර්තා විය.

## හොලිඩේ වර්ල්ඩ් 2014



ඕස්ට්‍රියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සංචාරක කර්මාන්තයේ සාමාජිකයන් සමඟ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් හොලිඩේ වර්ල්ඩ් 2014 සැණකෙළිය සඳහා සහභාගී විය. මේ වසරේ හොලිඩේ වර්ල්ඩ් සැණකෙළිය 2014 පෙබරවාරි 20 23 දක්වා චෙක් ජනරජයේ ප්‍රාග් නුවර දී පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය නිර්මාණය කිරීම සඳහා වර්ගමීටර් 20 ක භූමි ප්‍රමාණයක් වෙන් කර දී තිබුණි. ශ්‍රී ලංකාවේ සියලුම සංචාරක ආකර්ෂණ විශේෂයෙන් ඉස්මතු වන පරිදි නිර්මාණය කර තිබූ ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය වෙත පැමිණි අමුත්තන් ඉතා සාදරයෙන් පිළිගන්නා ලද අතර ශ්‍රී ලංකාවේ සංස්කෘතියේ හා උරුමයේ පරිපූර්ණ සම්මිශ්‍රණයක අසිරිය ද ඔවුන් වෙත පිරිනමනු ලැබීය.

මෙම ප්‍රදර්ශනයට සහභාගී වූ මහජනතාව හා ව්‍යාපාරික අමුත්තන් සංචාරක ගමනාන්තයක්

ලෙස ශ්‍රී ලංකාව පිළිබඳව විශේෂ උනන්දුවක් දක් වූ අතර ඔවුන්ගේ ප්‍රතිචාර ද ඉතාම සුබවාදී විය. දේශීය සංචාරක කර්මාන්තය සඳහා කලාපයේ වැදගත් වෙළඳපොළ මෙවලමක් ලෙස ශ්‍රී ලංකාවේ තත්ත්වය තහවුරු කර ගැනීමට හොලිඩේ වර්ල්ඩ් 2014 ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකාව ලබාගත් ධනාත්මක ප්‍රගතිය ඉවහල් විය.



### පිලිපීනයේ පත්‍රකලාවේදියකු හා ඡායාරූප ශිල්පියෙකු ගමනාන්තය හුරු කරවීමේ චාරිකාවක නිරත වීම 2014 පෙබරවාරි 27 සිට මාර්තු 7 දක්වා.

ජීපල්ස් ඒෂියා, ව්‍යාපාරික ප්‍රවෘත්ති සඟරාව හා රෝග් සඟරාව වැනි සඟරා සඳහා තොරතුරු රැස් කිරීම සඳහා නෙල්සන් නවාරෝ හා ගේබ්‍රියල් වැලෙන්සෙයිලා මහත්මිය ශ්‍රී ලංකාවේ සංචාරය කළහ.

2014 වර්ෂය තුළ, සංචාරකයින් 9,915 ක් ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත. 2013 සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව මෙය 9% ක වර්ධනයකි. බෙල්ජියමේ සිට ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව ඒ ඒ මාසයට අදාළව පහත වගුවේ දක්වා ඇත.

## 3.1.20 බෙල්ජියම




රූපය 21: මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDAසංඛ්‍යාන වාර්තාව 2014)

| වසර | 2013 | 2014 |
|---|---|---|
| ජනවාරි | 652 | 723 |
| පෙබරවාරි | 959 | 1,027 |
| මාර්තු | 917 | 817 |
| අප්‍රේල් | 536 | 867 |
| මැයි | 293 | 286 |
| ජූනි | 494 | 538 |
| ජූලි | 1,682 | 1,866 |
| අගෝස්තු | 889 | 968 |
| සැප්තැම්බර් | 688 | 684 |
| ඔක්තෝබර් | 502 | 479 |
| නොවැම්බර් | 640 | 629 |
| දෙසැම්බර් | 886 | 1,031 |
| එකතුව | 9,138 | 9,915 |

වගුව 20 මාසික සංචාරක පැමිණීම් 2013 හා 2014 (SLTDA සංඛ්‍යාන වාර්තාව 2014)

### පාරිභෝගික හා සංචාරක සැණකෙළි සඳහා සහභාගීත්වය

### බ්‍රසල්ස් නිවාඩු සැණකෙළිය, බෙල්ජියම. 2014 පෙබරවාරි 06 10 දක්වා

අමුත්තන් 100,576 ක් පමණ ආකර්ෂණය කරගැනීමට සමත් වූ මෙම සැණකෙළියට අනුගාමී හතරවන වසර සඳහා ද ශ්‍රී ලංකාව සහභාගී විය. බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය දේශීය සංචාරක ව්‍යාපාරයේ එක් නියෝජිතයකු සමඟ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් 'ආසියානු ගම්මානය' සැණකෙළියට සහභාගී විය. බෙල්ජියමේ සංචාරක ව්‍යාපාරයේ හවුල් කරුවන් හා පාරිභෝගිකයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක නිෂ්පාදන පිළිබඳ දැනුවත් බව වැඩි දියුණු කිරීමසහ දේශීය සංචාරක කර්මාන්තය තුළ ව්‍යාපාරික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම මෙම නිවාඩු සැණකෙළිය සඳහා ශ්‍රී ලංකාව සහභාගි වීමේ අභිප්‍රාය විය.



බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සංචාරක කර්මාන්තයේ නියැළී සිටින සාමාජිකයන් සමඟ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් බ්‍රසල්ස් නිවාඩු සැණකෙළිය 2014 සඳහා සහභාගී විය.

ශ්‍රී ලංකාව බ්‍රසල්ස් නිවාඩු සැණකෙළිය සඳහා ක්‍රමවත්ව සහභාගී වන දේශයකි. ශ්‍රී ලංකා සංචාරක ගමනාන්තයේ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ අරමුණු සාර්ථක අන්දමින් සාක්ෂාත් කර ගැනීමට මෙවර සහභාගීත්වය ඉවහල් විය. බ්‍රසල්ස් නිවාඩු සැණකෙළිය 2014 පෙබරවාරි 06 10 දක්වා බෙල්ජියමේ බ්‍රසල්ස් නගරයේ දී පවත්වනු ලැබීය. 'ආසියානු ගම්මානයේ' ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය ඉදිකිරීම සඳහා වර්ග මීටර් 48 ක භූමි ප්‍රදේශයක් වෙන් කර දී තිබුණි.




## මාධ්‍ය වෙත ලබාදුන් ගමනාන්තය හුරු කරවීමේ චාරිකාව

### බෙල්ජියම් රූපවාහිනී කණ්ඩායමේ සංචාරය මාර්තු 02 12 දක්වා



'බෙල්ජියම් ජාතිකයන් ශ්‍රී ලංකාවේ "La Une" බෙල්ජියමේ ප්‍රංශ භාෂා මාධ්‍යයෙන් කටයුතු කරන රූපවාහිනී නාලිකාව/සාමාජිකයන් හතර දෙනෙක් මාර්තු 03 12 දක්වා කොළඹ, පින්නවල, සීගිරිය, පොළොන්නරුව, මහනුවර, නුවරඑළිය, වැලිගම, ගාල්ල හා මීගමුවේ දී පැවති රූ ගත කිරීම්වල නිරත වූහ.

බෙල්ජියම, ප්‍රංශය හා ලක්ෂම්බර්ග් යන නගරවල ප්‍රේක්ෂකයන් 500,000 ක් නරඹන බෙල්ජියමේ ජාතික රූපවාහිනී නාලිකාව සඳහා වාර්තා චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම සඳහා "La Une" නම් බෙල්ජියම් ප්‍රංශ භාෂා මාධ්‍යයෙන් කටයුතු කරන ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකාවේ සාමාජිකයන් හතර දෙනෙකුගෙන් සමන්විත මාධ්‍යවේදීන් පිරිසක් 2014 මාර්තු 02 12 දක්වා ශ්‍රී ලංකාවේ ගමනාන්තය හුරු කිරීමේ චාරිකාවක නිරත වූහ. ගිම්හාන නිවාඩුව ගත කිරීම සඳහා සංචාරය කිරීමට කැමති ගමනාන්ත පිළිබඳව බෙල්ජියම් සංචාරකයන්ට තීරණය කළ හැකි වන පරිදි පාස්කු නිවාඩු කාලය තුළ ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම වාර්තා චිත්‍රපටය මිනිත්තු 26 ක වැඩසටහන් ලෙස වැඩිම පිරිසක් රූපවාහිනය නරඹන කාලය තුළ දෙවරක්ම විකාශනය කිරීමට පියවර ගෙන තිබුණි.





ජෝර්ජ් ගීලන්ස් මහතා කර්තෘ හා ඡායාරූප ශිල්පියා වශයෙන් කටයුතු කරන 'ටුවරින් එක්ස්ප්ලෝරාර්' නම් සඟරාව 2014 මාර්තු මාසයේ පින්තූර සමඟ ශ්‍රී ලංකාව පිළිබඳ ලිපියක් පළ කර තිබුණි. ආවරණ ලිපියක් මගින් සහ පිටු අටකින් යුත් කතු වැකියක් තුළින් ශ්‍රී ලංකාව පිළිබඳව එම සඟරාවේ ප්‍රචාරය කර තිබුණි.

බ්‍රසල්ස් නගරයේ වාසය කරන විවිධ සංස්කෘතීන් හා ප්‍රජාවන් පිළිබඳ 'සියලු දෙනා පිළිබඳව තොරතුරු ස්වල්පයක්' යන තේමාව යටතේ වාර්තා චිත්‍රපටයක් 2014 මාර්තු මාසයේ දී විකාශනය කරන ලදී.ප්‍රංශ රූපවාහිනී නාලිකාවක්

වන "Tele Bruxelles" මගින් බ්‍රසල්ස් නගරයේ එරාස්මුස් රෝහලේ හෙදියක ලෙස සේවය කරන බෙල්ජියමේ පදිංචි ශ්‍රී ලාංකික කාන්තාවක් මෙම වාර්තා චිත්‍රපටය නිෂ්පාදනය කිරිම සඳහා තෝරා ගන්නා ලදී. මෙම වාර්තා චිත්‍රපටය මගින් ශ්‍රී ලාංකිකයන්ගේ ආගන්තුක සත්කාරය, දෛනික ජීවිතය හා ලංකා තේ ආදිය පිළිබඳව ප්‍රදර්ශනය කරන ලදී.

## 3.2 ගෝලීය ප්‍රචාරණය

### සීඑන්එන් හා අල් ජසීරා නාලිකාව තුළින් ගෝලීය රූපවාහිනි ව්‍යාපාරය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සීඑන්එන් හා අල්ජසීරා නාලිකාව හා එක්ව ප්‍රචාරක හා ප්‍රවර්ධන ව්‍යාපාරයක් ආරම්භ කරනු ලැබිණි. සීඑන්එන් මාධ්‍ය ආයතනය මගින් විකාශනය කරන "CNN GO" සංචාර වැඩසටහනේ ශ්‍රී ලංකාව පිළිබඳව මිනිත්තු 30 ක වැඩසටහනක් ඇතුළත් කරනු ලැබූ අතර එය "CNN International" නාලිකාව ඔස්සේ 2014 මාර්තු 12 වන දින දේශීය වේලාවෙන් ප.ව. 3.00 ට විකාශනය විය. ශ්‍රී ලංකාව පිළිබඳව නිෂ්පාදනය කරන ලද වෙළඳ දැන්වීම තුනක් ද "CNN International" නාලිකාව ඔස්සේ විකාශනය විය. ශ්‍රී ලංකාවේ ගාල්ල, වෙරළතීර, ස්වභාවික සෞන්දර්ය ආවරණය කරමින් නිෂ්පාදනය කරන ලද වෙළඳ දැන්වීම් හතරක් අල් ජසීරා නාලිකාවේ ද විකාශනය කරනු ලැබීය.

## 3.3 අනෙකුත් ප්‍රවර්ධන ක්‍රියාකාරකම් නැව් මගින් විනෝද චාරිකාවල යෙදෙන පුද්ගලයන් හරසරින් පිළිගැනීම

MV ADONIA යන මගී නැව 2014 පෙබරවාරි 05 වනදා මගීන් 600ක් සමඟ කොළඹ වරායෙන් මෙරටට සම්ප්‍රාප්ත විය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) මගින් එම විනෝද චාරිකාවේ නිරත වූ මගීන් සඳහා වරාය ජැටියේ දී පිළිගැනීමේ නර්තනාංගයක් සූදානම් කරන ලදී. නැවේ ගමන් කළ මගීන් වෙත තොරතුරු ලබා දීම සඳහා නැව් තට්ටුව තුළ තොරතුරු කවුන්ටරයක් ද ස්ථාපිත කරනු ලැබීය. මගීන් 600 න් 400 ක්ම කොළඹ නගරය නැරඹීමේ චාරිකාවට හා පින්නවල අලි අනාථාගාරය නැරඹීමේ චාරිකාවට එක් වූහ.

## 3.4 දේශීය උත්සව අවස්ථා

ශ්‍රී ලංකාව තුළවසර පුරා පවත්වනු ලබන උත්සව හා විශේෂ ක්‍රියාකාරකම් හඳුනාගෙන අප රට පිළිබඳව මාහැඟි අත්දැකීම් ලබාගැනීමේ අවස්ථාව ගෝලීය මෙන්ම දේශීය සංචාරකයන්ට උදා කරමින් පුළුල් පරාසයක පැතිරුණු සංචාරකයන් අප රට වෙත ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් පෞද්ගලික පාර්ශ්වයන්ගේ මැදිහත්වීම තුළින් දේශීය උත්සව අවස්ථා සංවිධානය කිරීම ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) තීරණය කරන ලදී. පෞද්ගලික පාර්ශවයන් මගින් දේශීය උත්සව අවස්ථා සංවිධානය කිරීම සංචාරක කර්මාන්තයේ වඩාත් ඵලදායි ලෙස නිරතවීම සඳහා ප්‍රජාව දිරිමත් කිරීමට මහත් පිටුවහලක් විය.

### සියවසක සිංහල අධ්‍යාපනික ප්‍රදර්ශනය 2014 ජනවාරි 28 සිට පෙබරවාරි 02 වන දා දක්වා

අතිගරු ජනාධිපතිතුමා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගී වූ අධ්‍යාපනික ප්‍රදර්ශනය 2014 ජනවාරි 23 සිට පෙබරවාරි 02 දක්වා මාතර මාකුන්දර මධ්‍ය මහා විද්‍යාලයේ දීපවත්වනු ලැබීය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සංචාරක ප්‍රවර්ධනාත්මක ද්‍රව්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර බෙදා දෙනු ලැබූ අතර ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙන්ම එම ප්‍රදර්ශනයට සහභාගි වූ අමුත්තන්ට ද ලබා දෙනු ලැබීය.

### සංචාරක උදාව



ශ්‍රී ලංකාව තුළ චාරිකා මෙහෙයවන්නන්ගේ සංගමය මගින් හතරවන අනුගාමී වසර වෙනුවෙන් සංවිධානය කරනු ලබන 'සංචාරක උදාව' ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සහාය දක්වනු ලැබූ අතර මෙම ප්‍රදර්ශනය ජුනි 27 28 දක්වා ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබීය. චාරිකා මෙහෙයවන්නන් සමඟ සම්බන්ධතා ජාලයක් ඇති කර ගැනීම මගින් අගනා සම්බන්ධතා ගොඩනගා ගැනීමට සැලසුම් කරමින් කුඩා හා මධ්‍යම සේවා සපයන්නන් වෙත වඩාත් පුළුල් පරාසයක විහිදෙන සංචාරක කර්මාන්තයේ හවුල්කරුවකු වීම සඳහා වේදිකාවක් නිර්මාණය කිරීම සහ එමඟින් ප්‍රධාන සංචාරක කර්මාන්තයේ නිරත වීමේ අවස්ථා නොලැබෙන එබඳු පුද්ගලයන් සඳහා අනගිභවනීය අවස්ථා උදා කර දීම ද 'සංචාරක උදාව' ප්‍රදර්ශනය පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වේ.

## කොළඹ නගරය තුළ චාරිකා ආරම්භ කිරීම.




ආරක්ෂක අමාත්‍යාංශය හා නාගරික සංවර්ධන අධිකාරිය කොළඹ නගර චාරිකාව සමඟ ඒකාබද්ධව කටයුතු කරයි. විවෘත බස්රථවල චාරිකා කරමින් කොළඹ නගරයේ ආශ්චර්ය ගවේෂණ කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන් හා ලොව වටා සංචාරකයන්ට කොළඹ නගරයේ දර්ශන නැරඹීමේ ප්‍රවාහණ සේවා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) හා ඊබට් සිල්වා හොලිඩේ සමාගම මගින් ලබාදී තිබේ.

දෙසැම්බර් 18 වන දින කොළඹ නගර චාරිකා ආරම්භ කිරීමත් සමඟ කොළඹ නගර මධ්‍යයේ පිහිටි 'රන් වෙළඳපොළ' ලෙස එදා හැඳින් වූ වත්මන්'රන් මධ්‍යස්ථානය' පිහිටා ඇති ස්ථානයේ දී සංස්කෘතික සංදර්ශන ආරම්භ කරනු ලැබීය.

කොළඹ නගරයේ වාතාවරණය හා විවිධ වර්ණවත් දර්ශන නැරඹීමෙන් අනතුරුව බස්රථ තුළ සිටින සංචාරකයන් වෙත කොළඹ නගරය වෙතින් හා ශ්‍රී ලංකාව වෙතින් පිරිනැමිය හැකි දේ පිළිබඳ අත්දැකීම් ලබා දීමේ හා ඔවුන් තුළ විවිධ හැඟීම් ඇති කිරීමේ අරමුණින් මෙම චාරිකා අතරතුර සංස්කෘතික නර්තන සංදර්ශන දපවත්වනු ලබයි. තට්ටු දෙකේ බස්රථවල විවෘත ඉහළ තට්ටුව මත සිට නගර වටා චාරිකාවේ නිරතවන අතරතුර වෘත්තීය සංචාරක මඟ පෙන්වන්නන් විසින් ඉංග්‍රීසි භාෂාවෙන් සජීවී විස්තර ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන අතර විවිධ කෙටි ආහාර වර්ග හා වෙනත් විවිධ ත්‍යාග ද සංචාරකයන් වෙත පිරිනමනු ලබයි. කොටුව ප්‍රදේශයේ පවතින පෞරාණික උරුමයක් වන පැරණි ඕලන්ද රෝහලින් ආරම්භ වී කොළඹ නගරය හා උප ප්‍රධාන නගරවල සංචාරක ආකර්ෂණයන් ද නැරඹීමට අවස්ථාව සලසන කොළඹ නගරය නැරඹීමේ දෛනික සංචාරවලදී කොළඹ නගරයේ ආශ්චර්ය ද විශේෂයෙන් ප්‍රදර්ශනය කරනු ලබයි.

## 3.5 සුවිශේෂී ජයග්‍රහණ

### ශ්‍රී ලංකා සංචරණය 2014 වසරේ මෙරටට සම්ප්‍රාප්ත වූ 1,000,000 වන සංචාරකයාව ඉමහත් හරසරින් පිළිගනියි



සමෘද්ධියට පත් වෙමින් පවතින ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ තවත් සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2014 අගෝස්තු 28 සන්ධ්‍යාවේ බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළින් මෙරටට සම්ප්‍රාප්ත වූ 1,000,000 වන සංචාරකයාව ශ්‍රී ලංකා සංචරණය ඉමහත් හරසරින් පිළිගන්නා ලදී.

පැය 12.45 ට ලන්ඩනයෙන් පිටත්ව UL 504 දරන ශ්‍රී ලංකන් ගුවන් සමාගමට අයත් ගුවන් යානයකින් 2014 වසරේ ශ්‍රී ලංකාවට සපැමිණි දශ ලක්ෂ වන සංචාරකයා ලෙස මෙරටට සම්ප්‍රාප්ත වූ ජොෂුවා ග්ලඩ්ස්ටයින් මහතා හා සෝෆි නේතන් මහත්මිය යන අඹුසැමි යුවළ ශ්‍රී ලංකා සංචරණයේ නිලධාරීන් විසින් මහත් හරසරින් පිළිගනු ලැබිණි. මෙම යුවළ ඔවුන්ගේ පළමු විවාහ සංවත්සරය යෙදීතිබූ දින ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්ත වූ අතර දශ ලක්ෂ වන සංචාරකයා ලෙස ශ්‍රී ලංකාවේ සංචාරක කිරීමට ලැබීම පිළිබඳ සැබැවින්ම ප්‍රීතියට පත්වන බව ඔවුහු ප්‍රකාශ කළහ. මෙම යුවළ පිළිගැනීම සඳහා බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළේ දී විශේෂ සංස්කෘතික නර්තන සංදර්ශනයක් ද පවත්වනු ලැබූ අතර ශ්‍රී ලංකා සංචාරක සංචරණය මගින් මෙම යුවළට විශේෂ ත්‍යාගයන් ද පිරිනමන ලද අතර දිවයිනේ ඉතා ජනප්‍රිය සංචාරක ආකර්ෂණ නැරඹීම සඳහා සංචාරක පැකේජයන් ද මෙම භාග්‍යවත් සංචාරක යුවළට නොමිලේ පිරිනමනු ලැබීය.

### ශ්‍රී ලංකා සංචාරක සංචරණය මගින් 2014 වසර තුළ දී ම 100,000 වන චීන සංචාරකයා පිළිගැනීම



වඩාත් සමෘද්ධියට පත්වෙමින් පවතින සංචාරක කර්මාන්තයේ තවත් සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, 2014 වර්ෂයේ මෙරට සංචාරය කරන ලද 100,000 වන චීන සංචාරකයාව ඉමහත් හරසරින් පිළිගැනීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධණය කටයුතු කරනු ලැබීය. සංචාර හා සංචාරක කර්මාන්තයේ නියෝජිතයන් සමඟ ශ්‍රී ලංකා සංචාරක සංවරණයේ නිලධාරීහු 2014 වසරේ චීනයේ ශැංහයි නගරයේ සිට යූඑල් 807 දරණ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ගුවන් යානයක් මගින් පෙරවරු 5.30 ට ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්ත වූ හෙයි යන්ග් හා චෙන් හුයි හුවා යුවළ ඉමහත් හරසරින් පිළිගනු ලැබූහ.

මෙම යුවළ පිළිගැනීම සඳහා සංස්කෘතික නර්තන සංදර්ශනයක් ද පවත්වනු ලැබූ අතර ඉහළ පෙළේ හෝටලයක දින 5 ක නවාතැන් පහසුකම් ද ඇතුළත්ව විශේෂ ත්‍යාගයක් ද, ශ්‍රී ලංකාවේ ඉතා ජනප්‍රිය සංචාරක ආකර්ෂණ නැරඹීම සඳහා ගුවන් ටිකට්පත් ද ශ්‍රී ලංකා සංචාරක සංවරණය මගින් මෙම භාග්‍යවත් සංචාරක යුවළට පිරිනමනු ලැබීය. ශ්‍රී ලංකා සංචාරක සංවරණය ශැංහයි නගරයේ දී පවත්වන ලද ප්‍රචාරක වැඩසටහන් සහ බස්රථවල සන්නම් නාම යොදවමින් ගමනාන්තය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපාර නැරඹීමට ලැබීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වීමට ඔවුන් තීරණය කළ බව මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඔවුහු ප්‍රකාශ කර සිටියහ.





## 2014 වසරේ දී අන්තර්ජාතික මාධ්‍ය වෙතින් ශ්‍රී ලංකාව ලැබූ සුවිශේෂී ඇගයීම්

1. “ශ්‍රී ලංකාව 2012 වසර ලොව අග්‍රගණ්‍ය විදේශීය සංචාරක ගමනාන්ත පහ අතරට එක් වේ’. 'හෙලෝ’ සඟරාව එක්සත් රාජධානිය.

2. “2012 වසර සඳහා ලොව අග්‍රගන්‍ය සංචාරක ගමනාන්ත පහ අතරට ශ්‍රී ලංකාව එක් වේ. / කොන්ඩෙනාස්ට් ට්‍රැවලර්’ සඟරාව

3. “ අට වන ලෝක උරුමයක නිවහන’ / යුනෙස්කෝ

4. '2012 අග්‍රගන්‍ය සංචාරක ගමනාන්ත 20 ලැයිස්තුවේ අංක 02 ස්ථානයට ශ්‍රී ලංකාව පත්වේ’ / නැෂනල් ජියෝග්‍රැෆික් නාලිකාව

5. '2012 සංචාරය සඳහා අග්‍රගන්‍ය ගමනාන්ත 6 අතරට ශ්‍රී ලංකාව එක් වේ’ / නැෂනල් ජියෝග්‍රැෆික් ට්‍රැවල්ස් සඟරාව.

6. එක්සත් රාජධානියේ පාරිභෝගිකයන් නිවාඩුව ගත කිරීමට කැමැත්තක් දක්වන අග්‍රගන්‍ය සංචාරක ගමනාන්ත අතරට ශ්‍රී ලංකාව එක් වේ.

7. වැය කරන මුදල සඳහා ඉහළම වටිනාකමක් සහිත සංචාරක ගමනාන්තය 2011 / ද සන්ඩේ ටයිම්ස් සංචාරක සඟරාව.

8. '2010 වසරේ අංක 1 දරන සංචාරක ගමනාන්තය’ / නිව් යෝර්ක් ටයිම්ස්

9. 'වැය කරන මුදලට අංක එකේ වටිනාකමක් ලබා දෙන සංචාරක ගමනාන්තය ශ්‍රී ලංකාවයි / පෝස්ට් ඔෆ් සේ ට්‍රැවල් මනීස් 2012 / ලෝන්ග් හෝල් හොලිඩේ වාර්තාව එක්සත් රාජධානිය.

10. '2013 වසරේ අංක 1 සංචාරක ගමනාන්තය/ ලෝන්ලි ප්ලැනට් (ලොව අග්‍රගන්‍ය රටවල ලැයිස්තුව)

# 4. මූල්‍ය ප්‍රකාශන 2014

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2014 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2014<br>රු. | 2013 වසර සඳහා යළි උපලේඛණ ගත කරන ලද (රු.) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සාමානතා | 3 | 1,475,570,317.04 | 1,279,773,078.32 |
| ලැබිය යුතු මුදල් | 4 | 632,983,239.97 | 1,068,610,349.63 |
| අත්තිකාරම් | 5 | 1,720,477.00 | 2,098,619.89 |
| කලින් කරන ලද ගෙවීම් | 6 | 2,973,020.01 | 105,101.31 |
| සේවක ණය | 7 | 2,045,021.60 | 1,956,393.00 |
| ණය ගැතියෝ | 8 | 46,905.74 | 46,905.74 |
| තොග | | 12,683,911.64 | 15,555,831.93 |
| | | 2,128,022,893.00 | 2,368,146,279.82 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 9 | 40,201,166.74 | 15,324,595.30 |
| | | 40,201,166.74 | 15,324,595.30 |
| **මුළු වත්කම්** | | **2,168,224,059.74** | **2,383,470,875.12** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| කලින් ලැබුණු ආදායම් | 10 | 14,016,458.58 | 13,107,856.20 |
| ගෙවිය යුතු තැන්පතු | 11 | 710,215.59 | 578,996.59 |
| සේවක ප්‍රතිලාභ | 12 | 5,429,335.50 | 5,089,957.58 |
| උපචිත වියදම් | | 184,086,444.99 | 408,000,125.96 |
| ණය හිමියන් | 13 | 8,187,104.72 | 26,136,236.94 |
| | | 212,429,559.38 | 450,913,173.27 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| දීර්ඝ කාලීන ණය ගැනීම් | | | |
| **මුළු වගකීම්** | | **212,429,559.38** | **450,913,173.27** |
| **ශුද්ධ වත්කම්** | | **1,955,794,500.38** | **1,932,557,701.85** |
| **ශුද්ධ වත්කම් / කොටස් හිමිකම්** | | | |
| ප්‍රාග්ධන දායක මුදල් | | 33,069,156.52 | 33,069,156.52 |
| සමුච්චිත අතිරික්ත /(හිඟය) | | 1,922,725,343.84 | 1,899,488,545.33 |
| **මුළු ශුද්ධ වත්කම් / කොටස්** | | **1,955,794,500.38** | **1,932,557,701.85** |

ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවල දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලවද, 1971, අංක 38 දරණ මූල්‍ය පනත හා 2005 අංක 38 දරණ ශ්‍රී ලංකා සංචාරක පනතට අනුකූලව ද, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අධ්‍යක්ෂ (මූල්‍ය) සහතික කරයි.

එන්.පී. දයාරත්න
අධ්‍යක්ෂ මුදල්
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව වගකීම දරයි.
2015 දෙසැම්බර් 21 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 13/13/2015 මගින් මෙම මූල්‍ය වාර්තා සඳහා අනුමැතිය ලබා දී ඇත.

පී.එම්. විතාන
සභාපති
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | | | | |
|---|---|---|---|---|
| මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය | | | | |
| 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලදී) | | | | |
| | සටහන | 2014<br>රු. | | 2013 වසර සඳහා යළි උපලේඛණ ගත කරන ලද (රු.) |
| ආදායම | | | | |
| උපගමන බදු | | 1,245,836,302.72 | | 1,121,826,951.37 |
| සංචාරක සංවර්ධන බදු | | 736,719,357.73 | | 667,871,914.00 |
| වෙනත් ආදායම් | 14 | 174,751,716.58 | | 196,759,874.73 |
| | | | | - |
| **මුළු ආදායම** | | **2,157,307,377.03** | | **1,986,458,740.10** |
| | | | | |
| **වියදම** | | | | |
| | | | | |
| වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ | 15 | 39,850,129.03 | | 30,985,628.95 |
| සැපයුම් හා භාවිතා කරන ලද පාරිභෝගික ද්‍රව්‍ය | 16 | 31,520,141.86 | | 35,249,321.76 |
| ප්‍රවර්ධනයට අදාළ වියදම් | 17 | 1,562,525,679.24 | | 1,795,768,684.39 |
| | | 2,416,064.53 | | 3,187,777.45 |
| වෙනත් වියදම් | 18 | 2,951,965.94 | | 2,295,044.98 |
| මූල්‍ය පිරිවැය | 19 | 500,106,597.92 | | 58,362.28 |
| | | | | - |
| **මුළු වියදම** | | **2,139,370,578.52** | | **1,867,544,819.81** |
| | | | | |
| අදාළ කාලය සඳහා අතිරික්තය/(හිඟය) | | 17,936,798.51 | | 118,913,920.29 |
| | | | | |
| ඉදිරියට ගෙන ආ අතිරික්තය/(හිඟය) | | 1,899,488,545.33 | | 1,780,574,625.04 |
| ප්‍රත්‍යාගණන ලාභය/අලාභය | | 5,300,000.00 | | |
| ඉදිරියට ගෙන ගිය අතිරික්තය/(හිඟය) | | **1,922,725,343.84** | | **1,899,488,545.33** |

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලදී)

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඇති වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| අතිරික්තය/(හිඟය) | 17,936,798.51 | 6,238,009.44 |
| **මූල්‍ය නොවන සංචලන** | | |
| ක්ෂය වීම | 2,416,064.53 | 3,601,521.66 |
| කාර්ය මණ්ඩල ණය සඳහා පොළි | - | (68,589.78) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 339,377.92 | (77,346.75) |
| ලැබිය යුතු මුදල්වල (වැඩිවීම)/අඩුවීම | 435,627,109.66 | (621,637,147.42) |
| (අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | 378,142.89 | 111,203.24 |
| පූර්ව ගෙවීම්වල (වැඩිවීම)/අඩුවීම | (2,867,918.70) | 2,703,826.25 |
| ණය මුදල්වල (වැඩිවීම)/අඩුවීම | (88,628.60) | 467,589.15 |
| තොග ලැයිස්තුවල (වැඩිවීම)/අඩුවීම | 2,871,920.29 | (5,922,877.65) |
| අතිරික්ත අරමුදලේ (වැඩිවීම)/අඩුවීම | | |
| කෙටිකාලීන ආයෝජනවල වැඩිවීම/(අඩුවීම) | | (1,000,000,000.00) |
| පූර්ව ආදායම්වල වැඩිවීම/(අඩුවීම) | 908,602.38 | 1,651,062.95 |
| ගෙවිය යුතු තැන්පතුවල වැඩිවීම/(අඩුවීම) | 131,219.00 | (78,191.00) |
| උපචිත වියදම්වල වැඩිවීම/(අඩුවීම) | (221,913,680.97) | 362,543,769.05 |
| ණය හිමියන්ගේ වැඩිවීම/(අඩුවීම) | (17,949,132.22) | 1,711,015.14 |
| කාර්ය මණ්ඩල ණයවලින් ලද පොළිය | - | 68,589.78 |
| මෙහෙයුම් ක්‍රියාකාකරකම්වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහ | **217,789,874.69** | **(1,248,687,565.94)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ඇති වූ මූල්‍ය ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම | (21,992,635.97) | (4,389,572.50) |
| **ආයෝජන ක්‍රියාකාකරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(21,992,635.97)** | **(4,389,572.50)** |
| **මූල්‍ය ක්‍රියාකාකරකම්වලින් ඇති වූ මූල්‍ය ප්‍රවාහ** | | |
| ණය මුදල් නිරවුල් කිරීම | - | - |
| **මූල්‍ය ක්‍රියාකාකරකම්වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | **-** | **-** |
| **මුදල් හා මුදල් සමානවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | **195,797,238.72** | **(1,253,077,138.44)** |
| **කාලසීමාව ආරම්භයේ දී මුදල් හා මුදල් සමානවල** | **1,279,773,078.32** | **1,528,741,158.65** |
| **කාලසීමාව අවසානයේ දී මුදල් හා මුදල් සමානවල** | **1,475,570,317.04** | **275,664,020.21** |

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
ශුද්ධ වත්කම්/හිමිකම්වල වෙනස පිළිබඳ ප්‍රකාශය
2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලදී)

| | දායක ප්‍රාග්ධනය | සමුච්චිත අතිරික්තය/(හිඟ) | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2014.01.01 දිනට ශේෂය | 33,069,156.52 | 1,780,574,625.04 | 1,813,643,781.56 |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්ත/(හිඟය) | | 118,913,920.29 | 118,913,920.29 |
| යළි උපලේඛණ ගත කිරීම | | | - |
| 2014.12.31 දිනට යළි උපලේඛණ ගත කරන ලද ශේෂය | 33,069,156.52 | 1,899,488,545.33 | 1,932,557,701.85 |
| අදාළ කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය) | | 23,236,798.51 | 23,236,798.51 |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 33,069,156.52 | 1,922,725,343.84 | 1,955,794,500.36 |
| පූර්ව වර්ෂයේ ආදායම (6003 2013 වසර) | 10,000,000.00 | | |
| පූර්ව වර්ෂයේ වියදම් හා රඳවා ගත් ආදායම 2013 වසර | 114,470,054.71 | | |
| වෙනස | 124,470,054.71 | | |

# 2014 වසරේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1 වාර්තාකරණ ආයතනය

**1.1 සංස්ථාපනය කිරීම**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2005 අංක 28 දරණ සංචාරක පනත ප්‍රකාරව 2007 ඔක්තෝම්බර් මස 1 වනදා සිට ක්‍රියාත්මක වන පරිදි සංස්ථාපනය කර තිබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට **(SLPSAS)** අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර තිබේ.

1.3 අරමුණු

මෙම කාර්යාංශයේ අරමුණු වන්නේ,

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම 2014 අනුව, මෙම කාර්යාංශයේ අරමුණු පහත දක්වා ඇත.

1.ගුවන් මාර්ග සම්බන්ධතා වැඩි දියුණු කිරීම සඳහා කුලී ගුවන් ගමන් මෙහෙයුම් කටයුතු දිරි ගැන්වීම.

2. සංචාරකයන්, ආයෝජකයන් සහ අන්තර්ජාතික ව්‍යාපාරික ප්‍රජාව සඳහා ශ්‍රී ලංකාව සාමකාමී සංචාරක ගමනාන්තයක් ලෙස හඳුන්වා දීම.

3. සංචාරක පැමිණීම් ඉහළ නැංවීම සඳහා සම්ප්‍රදායික සංචාරක වෙළඳපොළවෙනුවෙන් ඉහළ මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් හඳුන්වා දීම.

4. වර්තමාන සංචාරක කර්මාන්ත වර්ධනය තිරසාරව පවත්වා ගැනීම සඳහා නැගී එන වෙළඳපොළවල ද සංචාරක ප්‍රවර්ධන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

5. සංචාරක කර්මාන්තයේ විවිධ පාර්ශ්වකරුවන් ට ප්‍රතිලාභ ලබා දීම සඳහා දැනට පවතින සංචාරක නිෂ්පාදන වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම නව සංචාරක නිෂ්පාදන ද වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

6. නොදියුණු සංචාරක සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කර සංචාරක කර්මාන්තය තිරසාර අන්දමින් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රමෝපායක් වශයෙන් කුඩා සහ මධ්‍යම ව්‍යවසායකත්ව අංශය සංචාරක ආර්ථිකයේ වඩාත් ප්‍රබල අංශයක් බවට පත් කිරීම සඳහා එම අංශය දිරි ගැන්වීම.

7. ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජා පාදක සංචාරක කර්මාන්තයේ දායකත්වය ලබා ගැනීම සඳහා සමාජීය වගකීමෙන් යුත් සංචාරක කර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම.

### 1.4 සේවක සංඛ්‍යාව

එක් එක් කාර්ය මණ්ඩල ප්‍රවර්ගය සඳහා අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පහත දක්වා ඇත.

| | කාර්ය මණ්ඩල ප්‍රවර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | 2014/12/31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨ කළමනාකරණය | 17 | 6 |
| 02 | මධ්‍ය කළමනාකරණය | 33 | 16 |
| 03 | අනෙකුත් කාර්ය මණ්ඩලය | 29 | 19 |
| 04 | ප්‍රාථමික කාර්ය මණ්ඩලය | 6 | 4 |
| | එකතුව | 88 | 42 |

### 1.5 අනුකූලතා ප්‍රකාශය

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ද සමග මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධන පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් / කොටස් හිමිකම්වල වෙනස්වීම් දක්වෙන ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ද ඇතුළත් වන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් පිළියෙළ කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව පිළියෙළ කරනු ලැබේ.

### 1.6 <u>තක්සේරු කිරීමේ පදනම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතියට අනුව පිළියෙළ කරනු ලැබේ.

### 1.7 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල් වර්ගය

ශ්‍රී ලංකාවේ ප්‍රායෝගිකව භාවිත කරනු ලබන ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් සියලුම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර තිබේ.

### 1.8 ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇති වූ සිදුවීම්

ශේෂ පත්‍ර දිනෙන් පසු සිදු වූ සියලුම වැදගත් සිදුවීම් පිළිබඳව සලකා බලනු ලැබූ අතර අවශ්‍ය පරිදි, මූල්‍ය ප්‍රකාශනවල යෝග්‍ය ගැළපීම්/අනාවරණය කිරීම් සිදු කර තිබේ.

# 2 වැදගත් මූල්‍යකරණ ප්‍රතිපත්ති

## 2.1 භාණ්ඩ තොග

පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකම යන දෙකෙන් වඩා අඩු වටිනාකම මත අගය තක්සේරු කරනු ලැබේ.

## 2.2 ක්ෂය වීම

ක්ෂය වීම ප්‍රතිපාදනය ගණනය කොට ඇත්තේ තථ්‍ය පිරිවැය හෝ තක්සේරු වටිනාකම් ඍජු රේඛීය ලෙස පදනම් කර ගනිමිනි. දේපළ, යන්ත්‍ර හා උපකරණවල පිරිවැය තක්සේරුව, කපා හැරීම සිදු කරන්නේ අත්පත් කර ගත් දින සිට ගෙවුනු ඵලදායි ජීව කාලය ඇස්තමේන්තු කර ගනිමින් පහත සඳහන් පරිදිය.

| විස්තරය | අනුපාතිකය |
|---|---|
| ලී බඩු හා සවිකිරීම් | 7.5% |
| පරිගණක හා උපකරණ | 25% |
| මෝටර් රථ | 25% |
| වායු සමීකරණ යන්ත්‍ර | 7.5% |
| කාර්යාල උපකරණ | 7.5% |
| දූරකථනය | 7.5% |
| විවිධ උපරකරණ | 7.5% |

අත්පත් කර ගැනීමේ පිරිවැය සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති බැවින් වත්කම් වර්ගයක් වන මෝටර් වාහනය ප්‍රත්‍යාගණනය කර ඇත.

## 2.3 කාර්යාල ගොඩනැගිල්ල

කාර්යාංශයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් බදු කුලී පදනම මත ලබා ගෙන ඇත.

## 2.4 විදේශ විනිමය ගණුදෙනු

මෙම ගණුදෙනු පහත දක්වා ඇති අනුපාතික වලින් ශ්‍රී ලංකාවේ ප්‍රායෝගිකව භාවිත කරනු ලබන ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

- ලැබීම් හා ගෙවීම් — තථ්‍ය අනුපාතිකය
- ජංගම වත්කම් හා වගකීම් — අවසාන අනුපාතිකය
- ස්ථාවර වත්කම් — තථ්‍ය අනුපාතිකය
- ප්‍රේෂණ — තථ්‍ය අනුපාතිකය

## 2.5 අදාළ පාර්ශව අතර ගනුදෙනු

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව, අදාළ පාර්ශ්ව අතර අනාවරණය කළ යුතු ගනුදෙනු සිදු වී නොමැත.

## 2.6 පාරිතෝෂිත දීමනා සඳහා ප්‍රතිපාදන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වසරක සේවාකාලයක් සම්පූර්ණ කරන ලද සියලුම සේවකයන් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය මෙම කාර්යාංශය මගින් වෙන් කර තිබේ. පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන රාජ්‍ය බැංකුවේ ආයෝජනය කර තිබේ.

## 2.7 සමුච්චිත වියදම්

මේ දක්වා ගෙවා නොමැති, ඉන්වොයිස්පත් නොලද හෝ සැපයුම්කරු සමග විධිමත් එකඟතාවකට පැමිණියද, මේ වන විට ආයතනය වෙත ලැබී ඇති හෝ සපයනු ලැබූ භාණ්ඩ හෝ සේවාවලට ගෙවීම් සඳහා පවතින වගකීම් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සමුච්චිත වියදම් ලෙස අර්ථ දක්වා තිබේ.

## 2.8 අසම්භාව්‍ය ගෙවීම්

මේ වන විටද නඩු විභාග වෙමින් පවතින බැවින් ද, ඉන්දියානු අන්තර්ජාතික චිත්‍රපටි ඇකඩමි සම්මාන උළෙල (IIFA) 2010 සඳහා ද, ගෝලීය රූපවාහිනී ව්‍යාපාරය සඳහා ගෙවිය යුතු මුදල් ලබා දීමට අනුමතිය ලබා නොදීම හේතුවෙන් ද එම මුදල් ප්‍රමාණ අසම්භාව්‍ය ගෙවීම් ලෙස සලකනු ලබන අතර මණ්ඩල තීරණ අංක 12/28/2015 අනුව මූල්‍ය ප්‍රකාශන සඳහා සටහනක් ලෙස මෙය අනාවරණය කරනු ලැබීය.

| අනුක්‍රමික අංකය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|
| 01 | ගෝලීය රූපවාහිනී ව්‍යාපාරය | 310,762,704.25 |
| 02 | ඉන්දියානු අන්තර්ජාතික චිත්‍රපටි ඇකඩමි සම්මාන උළෙල (ඇමුණුම 01) | 120,694.485.99 |
| | **එකතුව** | **431,457,190.24** |

අධ්‍යක්ෂ මණ්ඩලය අනාගතයේ දී ගනු ලැබිය හැකි තීරණවලට අනුව ඉහත දක්වා ඇති අසම්භාව්‍ය ගෙවීම් ගෙවීමට සිදු වුවහොත් අදාළ විෂය නිලධාරියා විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ යුතු අතර මණ්ඩල තීරණයට අනුකූලව පූර්ව වර්ෂයේ ගැළපීමක් ලෙස එම මුදල ගෙවිය යුතුය.

**2.9 බදුකරණය**

එකතු කළ අගය මත බදු නැවත ලබාගැනීම සම්බන්ධයෙන් හිමිකම් ඉල්ලා සිටීමේ අයිතියක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය *(SLTPB)* සතුව නොපවතින බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් තහවුරු කර ඇත.

2014/04/01 දිනැති උපයන විට ගෙවීමේ බදු චක්‍රලේඛඅංක 01 ප්‍රකාරව,ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) උපයන විට ගෙවීමේ බදු අය කර ගත යුතු සේවකයන්ගෙන් අදාළ බදු මුදල් අඩු කර ඇති අතර එම මුදල් වසර පුරා මාසිකව ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර ඇත.

**2.10 අනෙකුත් ආදායම්**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සංවිධානය කර පවත්වනු ලබන විදේශීය වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගීවන තනි පුද්ගලයන්ගෙන් අයකරගන්නා සහභාගී ගාස්තු අනෙකුත් ආදායම් යටතේ සටහන් කර ඇත.

**2.11 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන පිළියෙළ කිරීමේ ''වක්‍ර ක්‍රමය'' භාවිත කරමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. නිශ්චිත මුදල් ප්‍රමාණ බවට ක්ෂණිකව පරිවර්තනය කිරීමේ හැකියාවෙන් යුත් සුළු වශයෙන් වටිනාකමේ වෙනස්වීම් වලට භාජනය වන ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් කෙටි කාලීන ආයෝජන මුදල් හා මුදල් සාමාන්‍යතාවලට ඇතුළත් වේ. එසේම මුදල් හා මුදල් සාමාන්‍යතාවලට අත ඇති මුදල් හා බැංකු ශේෂය ද ඇතුළත් වේ.

**2.12 අත්තිකාරම්**

පහත සඳහන් කර ඇති අත්තිකාරම් ජංගම වත්කම් යටතේ දක්වා තිබේ.

| | |
|---|---|
| දේශීය අත්තිකාරම් | රු.1,720,477.00 |

**ඇමුණුම 1 IIFA (අසම්භාව්‍ය) බැරකම් ලෙස විවිධ පාර්ශ්වයන් විසින් හිමිකම් කියා සිටින මුදල් ප්‍රමාණ**

| | ආදායකයාගේ නම | මුදල් ප්‍රමාණය (රු) |
|---|---|---|
| 1 | මවුන්ට් ලැවිනියා හෝටලය | 6,362,945 |
| 2 | ජේසන්ස් හොස්පිටැලිටි සර්විසස් | 162,247 |
| 3 | ටාජ් සමුද්‍රා | 1,570,398 |
| 4 | ද බොල්වුඩ් ලෙෂර් | 259,500 |
| 5 | එලයිට් ඉන්ඩියන් රෙස්ටුරන්ට් | 2,131,940 |
| 6 | ඒටිකන් ස්පෙන්ස් කාර්ගෝ | 1,149,613 |
| 7 | සීමාසහිත ඒෂියන් ෆැබ්රික්ස් සමාගම | 5,278,111 |
| 8 | ත්‍රී සික්ස්ටි ෆයිව් | 47,725 |
| 9 | ජේ.ජබ්. පර්කසන් හවුස් | 193,000 |
| 10 | සෝල් සවුන්ඩ්ස් ඇකඩමි කොයාර් | 139,000 |
| 11 | ලංකා ස්පෝර්ට්‍රීසන් | 390,200 |
| 12 | දර්ශන ස්ටේෂනර්ස් | 36,478 |
| 13 | හීරෝ ස්ටේෂනර්ස් | 118,460 |
| 14 | කොම්ට්‍රෝනික්ස් ලංකා (පුද්) සමාගම | 25,000 |
| 15 | සුපර් නීට් ටෙක්නොලොජි (පුද්) සමාගම | 188,160 |
| 16 | ක්ලීන් ටෙක් (පුද්) සමාගම | 1,274,497 |
| 17 | ලක්ෆොයිල් (පුද්) සමාගම | 49,684 |
| 18 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | 30,455 |
| 19 | ඉනොවටෙක් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් | 66,690 |
| 20 | මොබිටෙල් (පුද්) සමාගම | 139,200 |
| 21 | පීසිහවුස් (පුද්) සමාගම | 1,116,000 |
| 22 | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් | 203,840 |
| 23 | ශ්‍රී මාල් ඇඩ්වර්ටයිසින් | 14,676,201 |
| 24 | කොළඹ මහ නගර සභාව | 624,520 |
| 25 | ගලදාරි හෝටලය | 972,622 |
| 26 | ද නිලෙල්සේ සමාගම | 317,218 |
| 27 | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් (පුද්) සමාගම | 5,082,337 |
| 28 | අමායා හිල්ස් මහනුවර | 22,484 |
| 29 | ඒස් ඉන්ටර්නැෂනල් එක්ස්ප්‍රස් | 489,642 |
| 30 | ඉමැජින් එන්ටටේන්මන්ට් | 1,789,690 |
| 31 | ඒෂියන් හොටෙල් ප්‍රොපර්ටීස් | 23,288,005 |
| 32 | පීනික්ස් ඕ ඇන්ඩ් එම් (පුද්) සමාගම | 6,822,859 |
| 33 | ද ග්‍රේට් කලම්බු පැෂන් | 153,000 |
| 34 | රාමඩා කොළඹ | 65,179 |
| 35 | සීමාසහිත හොටෙල් ගුඩ් ප්ලාසා සමාගම | 496,906 |

| | | |
|---|---|---|
| 36 | ද සවරින් කෝපරේට් හොටෙල් | 23,165 |
| 37 | ග්‍රෑන්ඩ් ඔරියෙන්ටල් හොටෙල් | 314,406 |
| 38 | රන්මුතු හොටෙල් | 150,000 |
| 39 | එක්සෙල් කැබ්ස් (පුද්) සමාගම | 952,110 |
| 40 | ශ්‍රී ලංකන් ට්‍රැවල්ස් (USD 15728.28) | 1,808,752 |
| 41 | බීහයිව් කොමියුනිකේෂන්ස් (INR 17133) | 73,933 |
| 42 | සමුද්‍රා හෝටෙල් | 2,721,980 |
| 43 | සිලෝන් කොන්ටිනෙන්ටල් | 3,407,340 |
| 44 | දර්ශන් හෙන්නැදිගේ | 8,400 |
| 45 | මාස් | 15,150 |
| 46 | වෝකර්ස් ටුවර්ස් සමාගම | 2,165,958 |
| 47 | ජෙට්වින් ට්‍රැවල්ස් | 150,000 |
| 48 | අබාන්ස් ටුවර්ස් | 1,508,500 |
| 49 | පෙලිකන් ටුවර්ස් | 102,400 |
| 50 | ඒට්කෙන් ස්පෙන්ස් ට්‍රැවල්ස් | 52,808 |
| 51 | සරත් විජේසූරිය | 98,000 |
| 52 | ලංකා ට්‍රැවල්ස් සර්විසස් | 16,400 |
| 53 | රිඩ්ජ් ක්‍රෙස්ට් | 88,000 |
| 54 | අමිරු ට්‍රැවල්ස් | 153,900 |
| 55 | විසිට් ලංකා | 841,487 |
| 56 | වීස් ක්‍රාෆ්ට් (USD 195000) | 23,400,000 |
| 57 | ඩඅර්ග් (පුද්) සමාගම | 27,500 |
| 58 | සීමාසහිත කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්) සමාගම | 55,421 |
| 59 | සයින් ටෙක් ඇඩ්වර්ටයිසින් සර්විසස් | 60,564 |
| 60 | මීඩියා වොච් | 69,216 |
| 61 | සිනමන් ලේක්සයිඩ් | 1,247,809 |
| 62 | එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු සහ නෛතික ගාස්තු | 5,447,481 |
| | **එකතුව** | **120,694,486** |

2014 දෙසැම්බර් 31 දින වන විට ඉහත ආයතන සම්බන්ධයෙන් විභාග වෙමින් පවතින නඩු පිළිබඳ විස්තර පහත දක්වේ.

1. ඒෂියන් හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපර්ටීස් පීඑල්සී සමාගමට එරෙහිව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය බස්නාහිර පළාතේ මහාධිකාරණය
2. පී.සී. හවුස් පීඑල්සී සමාගමට එදිරිව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය කොළඹ දිස්ත්‍රික් උසාවිය.

3. පී.සී හවුස් පීඑල්සී සමාගමට එදිරිව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය කොළඹ දිස්ත්‍රික් උසාවිය
4. වෝකර්ස් ටුවර්ස් සමාගමට එදිරිව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය කොළඹ දිස්ත්‍රික් උසාවිය.
5. ට්‍රාන්ස් ඒෂියා හොටෙල්ස් සමාගම එදිරිව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය කොළඹ දිස්ත්‍රික් උසාවිය.
6. ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට එදිරිව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ පීනික්ස් ඕ ඇන්ඩ් එම් (පුද්) සමාගම කොළඹ දිස්ත්‍රික් උසාවිය.
7. කූල් ටෙම්පෝ (පුද්) සමාගම හා ශ්‍රීලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය අතර බේරුම්කරුණ කටයුතු සිදු කෙරේ **ICLP** බේරුම්කරුණ මධ්‍යස්ථානය
8. පීනික්ස් ඕ ඇන්ඩ් එම් (පුද්) සමාගම හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය අතර බේරුම්කරණ කටයුතු සිදුකෙරේ **ICLP** බේරුම්කරුණ මධ්‍යස්ථානය

2014 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කරනු ලැබූ දිනය වන විට අධිකරණයේ නියෝගය අනුව පහත දැක්වෙන නඩු සඳහා දණ්ඩන මුදල් සහිතව/රහිතව ගාස්තු ගෙවීමට තීරණය කරනු ලදී.

01. පී.සී. හවුස් පීඑල්සී සමාගමට එදිරිව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය කොළඹ දිස්ත්‍රික් උසාවිය රු.840,000/

02. වෝකර්ස් ටුවර්ස් සමාගමට එදිරිව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය කොළඹ දිස්ත්‍රික් උසාවිය රු.2,134,886.32

### 3. ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ඉහළ කළමනාකාරීත්වයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්වීම් සිදුවීම හේතුකොටගෙන සහ සමාලෝචිත වසර තුළ එම තනතුරු සඳහා පත් කිරීම් සිදු කිරීම ප්‍රමාද වීම හේතුකොටගෙන 2014 වර්ෂයේ වාර්ෂික ගිණුම් ප්‍රකාශ පිළියෙළ කර අවසන් කිරීමට සහ නියමිත දිනට විගණකාධිකාරීට ඉදිරිපත් කිරීමට නොහැකි විය. (2015 පෙබරවාරි 28)

ඇතැම් ගනුදෙනු සහ වියදම් පිළිබඳව ඇති වූ අස්ථිරතාව හේතුවෙන් වසරේ ගිණුම් කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව ගෙවීම් සිදු කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ සියලු වියදම් පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ (SLTPB) කළමනාකරණය විසින් පූර්වයෙන් පැවති සංචාරක කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත් කරනු ලැබූ කමිටුවට ඉදිරිපත් කරන ලද අතර බැරකම් ප්‍රතිපාදන පිළිබඳව මෙම කමිටුවේ නියෝගය ලැබෙන තුරු යහපාලන චක්‍රලේඛයේ 651 ඡේදය ප්‍රකාරව වාර්ෂික ගිණුම් පිළියෙළ කර අවසන් කළ නොහැකිය.

03. මුදල් හා මුදල් සාමානා

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| බැංකුවේ ඇති මුදල් ප්‍රධාන කාර්යාලය ප්‍රධාන ගිණුම | (81,485,839.35) | (8,751,758.59) |
| බැංකුවේ ඇති මුදල් ප්‍රධාන කාර්යාලය පුද්ගලික අංශය | 6,147,716.42 | 255,904,967.32 |
| බැංකුවේ ඇති මුදල් මහනුවර/(ටී.අයි.සී) | 142,466.11 | 187,536.71 |
| විදේශ කාර්යාලය එක්සත් රාජධානිය | - | 10,135.64 |
| විදේශ කාර්යාලය ඉන්දියාව | 78,700.36 | 78,700.36 |
| මාර්ගස්ථ මුදල් | 38,565,609.90 | 32,343,496.88 |
| සුළු මුදල් | 28,000.00 | - |
| කෙටි කාලීන ආයෝජන | 1,512,093,663.60 | 1,000,000,000.00 |
| මුදල් හා මුදල් සාමානා එකතුව | **1,475,570,317.04** | **1,279,773,078.32** |

04. ලැබිය යුතු මුදල්

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| පාරිභෝගිකයන් සඳහා ලබා දුන් ප්‍රචාරක පත්‍රිකා එක්සත් රාජධානිය | 2,428,920.00 | 2,428,920.00 |
| ඉන්ධන තැන්පතු | 200,000.00 | 100,000.00 |
| වාහන කුලී තැන්පතු එක්සෙල් කැබ්ස් | 20,000.00 | 20,000.00 |
| හික්කඩුව ප්‍රවේශ පත්‍ර | 876,000.00 | 876,000.00 |
| ඒ. ටී. එම්. 2011 පරිශ්‍රය සඳහා පිරිවැය | 359,844.58 | 1,807,792.08 |
| අමෙරිකන් ප්‍රීමියම් වෝටර් සිස්ටම් | 4,000.00 | 4,000.00 |
| ප්‍රති විකුණුම් ආයෝජන මගින් ඉපයූ පොළී ආදායම | 26,610,849.39 | - |
| ICPL බේරුම්කරණ මධ්‍යස්ථානය | 25,000.00 | 25,000.00 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව සඳහා අනුග්‍රහකත්වය ලබා දීම | - | 90,350,000.00 |
| විගමන බදු | 199,792,498.19 | 497,082,141.16 |
| කටුනායක බදු කුලිය සඳහා බැංකු ප්‍රදානලාභියා (තැන්පතු දිනය2014.03.07–කල් පිරෙන දිනය2017.01.01) | 1,403,005.29 | - |
| කටුනායක බදු කුලිය සඳහා බැංකු ප්‍රදානලාභියා (තැන්පතු දිනය2014.03.07 – කල් පිරෙන දිනය2017.01.01) | 342,720.00 | - |
| සංචාරක සංවර්ධන බදු | 400,590,402.52 | 475,586,496.39 |
| ප්‍රොපර්ටි ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් (මහනුවර) | 330,000.00 | 330,000.00 |
| **ලැබිය යුතු මුළු මුදල** | **632,983,239.97** | **1,068,610,349.63** |

05. අත්තිකාරම්

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| දේශීය අත්තිකාරම් | 1,720,477.00 | 1,979,721.06 |
| විදේශ අත්තිකාරම් | - | 118,898.83 |
| **මුළු අත්තිකාරම්** | **1,720,477.00** | **2,098,619.89** |

06. පූර්ව ගෙවීම්

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| සේවා ගිවිසුම | - | 105,101.31 |
| වෛද්‍ය රක්ෂණාවරණ අළුත් කිරීම් (2015 වසර සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්) | 2,927,357.51 | - |
| ෆැක්ස් යන්ත්‍ර තුනක් (මෙට්‍රොපොලිටන් ඔෆිස් (පුද්.) සමාගම 2015.01.01 2015.10.27 | 22,400.00 | - |
| ටොෂිබා ෆොටෝ කොපි යන්ත්‍රය (ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් (පුද්.) සමාගම 2015.01.01 2015.11.16) | 15,312.51 | - |
| වායු සමීකරණ යන්ත්‍රය (එයාර් ටෙක් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම 2015.01.01 2015.09.30) | 7,949.99 | - |
| **මුළු පූර්ව ගෙවීම්** | **2,973,020.01** | **105,101.31** |

07. සේවක ණය

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| **සේවකයන් සඳහා ලබා දුන් ණය මුදල** | 2,045,021.60 | 1,956,393.00 |
| **සේවකයන් සඳහා ලබා දුන් මුළු ණය මුදල** | **2,045,021.60** | **1,956,393.00** |

08. ණයගැතියෝ

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| විවිධ ණයගැතියෝ SLTDA | 46,905.74 | 46,905.74 |
| **මුළු ණය ගැතියෝ** | **46,905.74** | **46,905.74** |

## 09. දේපළ, පිරියත සහ උපකරණ

| විස්තරය | 2013.01.01 දිනට ශේෂය | එකතු කිරීම් 2013 | මාරු කිරීම් 2013 | 2014 වර්ෂය සඳහා ශුද්ධ එකතු කිරීම් | 2014.12.31 දිනට ශේෂය | 2014.01.01. දිනට සමුච්චිත ක්ෂය කිරීම | 2014 වර්ෂය සඳහා ක්ෂය කිරීම | 2012 අපහරණ මත ක්ෂය කිරීම | 2014.12.31 දිනට සමුච්චිත ක්ෂය කිරීම | 2014.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ගොඩනැගිලි සංවර්ධන පිරිවැය | | | | | | | | | | |
| ලී බඩු හා සවිකිරීම් | 9,762,579.53 | 392,980.40 | | 392,980.40 | 10,155,559.93 | 3,728,054.07 | 734,661.33 | | 4,462,715.40 | 5,692,844.53 |
| දුරකථන | 769,039.00 | 52,522.57 | | 52,522.57 | 821,561.57 | 192,872.54 | 58,222.09 | | 251,094.63 | 570,466.94 |
| පරිගණක උපකරණ | 13,412,596.81 | 2,581,750.00 | | 2,581,750.00 | 15,994,346.81 | 9,740,112.03 | 818,735.27 | 5,985.00 | 10,552,862.30 | 5,441,484.51 |
| කාර්යාල උපකරණ | 3,765,294.50 | 1,965,693.00 | | 1,965,693.00 | 5,730,987.50 | 1,214,239.56 | 305,442.47 | | 1519,682.03 | 4,211,305.47 |
| මෝටර් වාහන | 7,400,000.00 | 13,600,000.00 | (12,100,000.00) | 11,500,000.00 | 18,900,000.00 | | 333,287.00 | | 333,287.00 | 18,566,713.00 |
| පරිගණක මෘදුකාංග | 867,750.00 | 723,500.00 | | 723,500.00 | 1,591,250.00 | | | | | 1,591,250.00 |
| වායු සමීකරණ යන්ත්‍ර | 717,900.00 | | | | 717,900.00 | 202,452.15 | 53,842.50 | | 256,294.65 | 461,605.35 |
| විවිධ උපකරණ | 1,436,185.35 | 2,676,190.00 | | 2,676,190.00 | 4,112,375.35 | 335,004.54 | 111,873.87 | | 446,878.41 | 3,665,496.94 |
| **මුළු ගණන** | **38,131,345.19** | **21,992,635.97** | **(12,100,000.00)** | **19,892,635.97** | **58,023,981.16** | **15,412,734.89** | **2,416,064.53** | **5,985.00** | **17,822,814.42** | **40,201,166.74** |

## 10.කලින් ලැබූ අයභාරය (කලින් ලැබූ ආදායම)

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| විදේශීය වෙළඳ ප්‍රදර්ශන | 14,016,458.58 | 13,107,856.20 |
| **කලින් ලැබූ මුළු ආදායම** | **14,016,458.58** | **13,107,856.20** |

## 11. ගෙවිය යුතු තැන්පතු

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| නැවත ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 497,080.00 | 377,080.00 |
| නැවත ගෙවිය යුතු රඳවා ගැනීම් | 199,251.40 | 193,553.40 |
| වෙනත් | 13,884.19 | 8,363.19 |
| **ගෙවිය යුතු මුළු තැන්පතු** | **710,215.59** | **578,996.59** |

## 12. සේවක ප්‍රතිලාභ

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| ඉදිරියට ගෙන ආ විශ්‍රාම පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | 5,089,957.58 | 5,167,304.33 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 1,331,156.92 | 725,494.76 |
| ගෙවන ලද පාරිතෝෂික | 991,779.00 | 802,841.51 |
| මුළු සේවක ප්‍රතිලාභ | **5,429,335.50** | **5,089,957.58** |

13.ණය හිමියෝ

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| විවිධ ණය හිමියෝ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (ජල, විදුලි සහ දුරකථන බිල්පත්) | 8,187,104.72 | 26,091,752.94 |
| විවිධ ණය හිමියෝ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය | | 44,484.00 |
| **මුළු ණය හිමියෝ** | **8,187,104.72** | **26,136,236.94** |

14. වෙනත් ආදායම්

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| මුද්‍රිත හා ඡායාරූපකරණ ද්‍රව්‍යවලින් ලද ආදායම් | 497,695.00 | 950,215.00 |
| පොළීවලින් ලද ආදායම කාර්ය මණ්ඩල ණය | 72,769.23 | 68,589.78 |
| වෙළඳ දායකත්වය | 90,834,657.72 | 70,147,550.53 |
| බැංකු පොළී ආදායම | 82,642,014.52 | - |
| විනිමය අනුපාතිකවලින් ලද ලාභය | 534,742.31 | 569.42 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව | - | 114,147,950.00 |
| ටෙන්ඩර් තැන්පතු | 17,000.00 | 1,445,000.00 |
| වෙනත් | 152,837.80 | 10,000,000.00 |
| **වෙනත් මුළු ආදායම්** | **174,751,716.58** | **196,759,874.73** |

15. වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| වැටුප් සහ දීමනා | 28,850,738.39 | 21,564,150.72 |
| නිවාඩු දීමනා | 15,729.25 | 21,216.50 |
| අතිකාල | 698,939.42 | 606,128.93 |
| සේවක අර්ථසාධක අරමුදල සඳහා මණ්ඩලයේ දායක මුදල | 1,327,971.86 | 1,377,760.68 |
| සේවක භාරකාර අරමුදල සඳහා මණ්ඩලයේ දායක මුදල | 265,594.40 | 274,468.92 |
| කාර්ය මණ්ඩල සුබසාධනය සහ පැමිණීමේ දීමනාව | 3,744,106.43 | 3,084,997.71 |

| | | |
|---|---|---|
| ගමන් වියදම් දේශීය | 112,945.00 | 135,002.50 |
| කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් | 284,994.97 | 37,770.00 |
| පාරිතෝෂිකය | 1,331,156.92 | 817,714.19 |
| රක්ෂණය | 3,144,951.96 | 2,901,118.05 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 73,000.43 | 165,297.75 |
| **මුළු වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ** | **39,850,129.03** | **30,985,625.95** |

## 16. සැපයුම් සහ භාවිත කරන ලද පාරිභෝජන ද්‍රව්‍ය

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| ලිපි ද්‍රව්‍ය | 1,665,216.48 | 1,074,610.08 |
| තොරතුරු තාක්ෂණ උපදේශනය | 311,215.11 | |
| දුරකථන සහ අන්තර්ජාලය | 2,417,069.52 | 2,420,195.23 |
| තැපැල්, කුරියර් ගාස්තු සහ මුද්දර ගාස්තු | 525,926.32 | 1,339,827.99 |
| ගොඩනැගිලි සඳහා කුලිය | 8,611,014.62 | 7,057,439.76 |
| විදුලිය | 3,894,086.49 | 4,038,528.40 |
| උපකරණ නඩත්තුව | 1,720,342.91 | 771,524.07 |
| වාහන නඩත්තුව සහ අළුත්වැඩියා කිරීම | 1,612,724.91 | 1,864,895.56 |
| වාහන කුලියට ගැනීම | 4,784,181.41 | 11,153,988.48 |
| ජලය | 295,465.98 | 193,823.44 |
| ග්‍රන්ථ සහ වාර සඟරා | 336,910.00 | 376,854.00 |
| ඉන්ධන ගාස්තු | 1,339,699.50 | 1,059,957.72 |
| දේශීය විනෝද කටයුතු | 344,002.52 | 917,226.45 |
| සැපයුම් පිරිසිදු කිරීම | 1,395,945.21 | 2,033,088.58 |
| ආරක්ෂක කටයුතු | 864,732.99 | 877,283.00 |
| ගොඩනැගිලි නඩත්තුව | 409,620.00 | 15,579.00 |
| ගාස්තු ප්‍රමාණ සහ බලපත්‍ර | 29,180.00 | 3,500.00 |
| මෙනුපත් සහ මල් | - | 51,000.00 |
| කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් | 962,807.89 | - |
| **මුළු සැපයුම් සහ භාවිත කරන ලද පාරිභෝජන ද්‍රව්‍ය** | **31,520,141.86** | **35,249,321.76** |

## 17.වෙළඳ කටයුතු ආශ්‍රිත වියදම්

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| ප්‍රවර්ධන කටයුතු හා වෙළඳ දැන්වීම්කරණය විදේශීය | 734,582,024.61 | 448,298,756.34 |
| දේශීය දැනුවත් කිරීමේ වැඩසටහන් | - | 1,862,275.07 |
| ප්‍රවර්ධන කටයුතු හා වෙළඳ දැන්වීම්කරණය දේශීය | 6,574,410.75 | 3,407,023.01 |
| සංචාරක සන්නිවේදන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම | 102,540,507.27 | 51,177,291.24 |
| උත්සව අවස්ථා (පරිත්‍යාග ද ඇතුළත්ව) | 56,889,495.65 | 31,324,839.34 |
| උත්සව අවස්ථා පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව | - | 292,532,476.56 |
| විදේශීය රටවල මාධ්‍යවේදීන් උපයෝගී කර ගනිමින් ගමනාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන හා ගමනාන්තය හුරු කිරීමේ ව්‍යාපාරික සංචාර | 49,690,190.73 | 64,613,996.79 |
| සමාජීය වගකීම ප්‍රවර්ධනය කිරීම | 37,907,680.00 | - |
| නව නිෂ්පාදන වැඩි දියුණු කිරීම සහ විවේක කාල තුළ සංචාරක ගමනාන්තය ප්‍රවර්ධනය කිරීම | 5,812,097.60 | - |
| චීනයේ, රුසියාවේ, එක්සත් රාජධානියේ පරිපාලන කටයුතු සිදු කිරීම | 3,101,478.36 | 7,276,836.23 |
| වෙළඳ ප්‍රදර්ශනය – ITB | 48,536,273.58 | 38,166,954.59 |
| වෙළඳ ප්‍රදර්ශනය – WTM | 49,889,952.14 | 54,145,556.12 |
| වෙබ් අඩවි නඩත්තු හා විද්‍යුත් ප්‍රවෘත්ති | 2,416,028.80 | 2,970,414.84 |
| වෙළඳ දැන්වීම්කරණය සාමාන්‍ය | - | 19,286,413.56 |
| ගෝලීය රූපවාහිනී ව්‍යාපාරය | 236,031,241.20 | - |
| අමුත්තන් සඳහා පහසුකම් සැපයීම සහ සංචාරකයන් ආකර්ෂණය කිරීමේ කටයුතු | 1,172,831.84 | 2,401,649.40 |
| මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරක කටයුතු සිදු කිරීම | 29,057,402.13 | - |
| ගුවන් සමාගම් සමඟ සහ අනෙකුත් විශේෂ ආයතන සමඟ කටයුතු කිරීම | 1,398,417.98 | - |
| විදේශීය දූත මණ්ඩල සමග කටයුතු කිරීම | - | 1,976,057.55 |
| තෙදින වැඩසටහන ඉන්දියාව | - | 140,351,583.16 |
| තෙදින වැඩසටහන චීනය | 157,399,715.17 | 239,079,588.01 |
| තෙදින වැඩසටහන රුසියාව | - | 123,601,024.42 |
| බස්රථවල වෙළඳ දැන්වීම්කරණය චීනය | 39,525,931.43 | 273,295,948.16 |
| **වෙළඳ කටයුතු ආශ්‍රිත මුළු වියදම දේශීය** | **1,562,525,679.24** | **1,795,768,684.39** |

## 18. වෙනත් වියදම්

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජික දීමනාව | 344,055.67 | 200,770.00 |
| ප්‍රසම්පාදන කමිටු සාමාජික දීමනාව | 1,296,837.69 | 871,900.00 |
| විගණක ගාස්තු | 475,000.00 | 762,570.00 |
| නෛතික ගාස්තු | 800,232.58 | 432,624.98 |
| මුද්දර ගාස්තු | 35,840.00 | 27,180.00 |
| **වෙනත් මුළුවියදම්** | **2,951,965.94** | **2,295,044.98** |

## 19.මූල්‍ය පිරිවැය

| විස්තරය | 2014 (රු.) | 2013 (යළි උපලේඛනගත කරන ලද) (රු.) |
|---|---|---|
| බැංකු ගාස්තු | 106,597.92 | 58,362.28 |
| අතිරික්ත අරමුදල | 500,000,000.00 | - |
| **මුළු මූල්‍ය පිරිවැය** | **500,106,597.92** | **58,362.28** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } විඅයිපී/ඒ/එස්එල්ටීපීබී/01/14/05

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2016 ඔක්තෝබර් 05 දින

DF/SLTPB

DE SA

16/10

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ **2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව **1971** අංක **38** දරන මුදල් පනතේ **14(2) (සී)** වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පිටපත් :-
1. ලේකම් , සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය
2. ලේකම් , මුදල් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය * SRI LANKA TOURISM PROMOTION
11 OCT 2016
1068

CHAIRMAN OFFICE
10 OCT 2016
Sri Lanka Tourism Promotion Bureau

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } විඅයිපී/ඒ/එස්එල්ටීපීබී/01/14/05 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 ඔක්තෝබර් 05 දින

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය.

**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙලිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති
------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 අනුව ගිණුම් ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් කර දැක්විය නොහැකි වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දේ වලට අදාළ වටිනාකමින් රු.81,485,839 ක බැංකු සෘණ ශේෂය අඩුකර දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද රු.මිලියන 500 ක මුදල සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට ගැලපීම වෙනුවට මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනයේ මූල්‍ය වියදම් වලට ඇතුළත් කර තිබුණි.

(ආ) වර්ෂ 02 කට වැඩි කාලයක සිට පරිශේෂව පවතින ණයගැති ශේෂ සහ ලැබිය යුතු ශේෂ රු.4,090,670 ක අයවීමේ සම්භාවිතාව සලකා බලා ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර නොතිබුණි.

3

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

---

කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන වල ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට අදාළ ණයහිමි ශේෂය රු.8,187,104 ක් වුවත් සංචාරක සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයට අදාළ ණයගැති ශේෂය රු.8,753,371 ක් වුයෙන් රු.566,267 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ තානාපති කාර්යාල වලට ප්‍රේෂණය කරන ලද රු.655,474,602 ක් වෙළඳ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණද වියදම සනාථ කිරීමට අදාළ ටෙන්ඩර් ලියවිලි, ඉන්වොයිසි පත්‍ර හා අදාළ පාර්ශවයන්ට මුදල් ලද බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) මාර්ගස්ථ මුදල් ලෙස මූල්‍ය වාර්තාවට ඇතුළත් කර තිබූ රු.38,565,610 ක ප්‍රමාණය තහවුරු කිරීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) එක්සත් ජනපද ප්‍රවර්ධන කාර්යාලයෙන් හා බාහිර පාර්ශවයකින් ලැබිය යුතුව තිබූ රු.3,304,920 ක් දීර්ඝ කාලයක් පරිශේෂව පැවතුනද එම ශේෂවලට අදාළ පාර්ශවයන්ගෙන් සනාථ කරගෙන නොතිබුණි.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ වලින් එකතුව රු. 2,448,920 ක් වසර 4 ඉක්මවා තිබූ අතර එකතුව රු. 1,594,844 ක් වසර 01 සිට වසර 04 දක්වා පැරණි ශේෂ වලින් සමන්විත වී තිබුණි. තවද ගෙවිය යුතු ශේෂ වලින් රු.48,000 ක් වර්ෂ 04 ඉක්මවා තිබුණු අතර රු.7,836,960 ක් වසර 02 සිට වසර 04 දක්වා පැරණි ශේෂ විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

2.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

---

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උප වගන්තිය | සෑම ලිත් වර්ෂයක් අවසාන වී මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු කාර්යාංශයේ වැඩ පිළිබඳ වාර්තාව, අර්ධ වාර්ෂික ගිණුම් වාර්තාව, ඉදිරි 03 අවුරුදු කාල සීමාවකට අපේක්ෂිත සැලැස්ම හා පූර්ව වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද සැලසුම් සම්බන්ධයෙන් වූ කාර්යය සාධනය ඇතුළත් ප්‍රකාශනයන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| (i) 10 වගන්තියේ 5 උපවගන්තිය | යම් වර්ෂයක ශුද්ධ අතිරික්ත ආදායමින් ඉතිරි සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) 16 වගන්තියේ 2 හා 3 උපවගන්ති | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.81,485,839 ක බැංකු අයිරාව සඳහා අදාළ ඇමතිවරයා හා මුදල් ඇමතිවරයා යන දෙදෙනාගේ එකහත්වය ලබාගෙන නොතිබුණි. |

5

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 | වලංගු කාලය ඉක්ම වූ රු.139,573 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 9 පරිච්ඡේදයේ 9.14.1 වගන්තිය | මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් වන සියළුම කාරණා පිළිබඳව පනවනු ලබන රීති සහ රෙගුලාසි භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ යුතු වුවත් කාර්යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2011 පෙබරවාරි 11 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 57 ප්‍රකාරව මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව, එක්තරා පෞද්ගලික ආයතනයකට රු.5,000,000 ක අනුග්‍රාහක දීමනාවක් ලබා දී තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.17,936,798 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.118,913,920 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.100,977,122 ක පිරිහීමක් විය. සමාලෝචිත වර්ෂය තුල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබූ රු.මිලියන 500 ක මුදල මූල්‍ය වියදම් ලෙස දැක්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලය පිරිහී තිබුණි.

6

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

**3.2** ආයතනයට එරෙහිව ආරම්භකර ඇති නෛතික සිද්ධි

ජාත්‍යන්තර ඉන්දියානු සිනමා සම්මාන උළෙල වෙනුවෙන් රු.120,694,486 ක ගෙවීම් ලබාදෙන ලෙස සේවා හා සැපයුම් ලබා දුන් පෞද්ගලික ආයතන හා පාර්ශවයන් විසින් කාර්යාංශයට එරෙහිව ගොනුකර තිබුණ නඩු 08 ක් සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් අධිකරණයේ විභාග වෙමින් පැවතුණි.

**3.4** වියදම් වල අසාමාන්‍ය වැඩිවීම

2013 වර්ෂය සමහ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී වියදම් විෂයයන් 09 ක රු.683,787,300 ක අසාමාන්‍ය වැඩිවීමක් නිරීක්ෂණය විය.

**3.5** කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ සහ පූර්ව වර්ෂ දෙකකට අදාළව ගණනය කරන ලද කාරක ප්‍රාග්ධන අනුපාත අනුව ඉහල ද්‍රවශීලතාවයක් පවතින බව නිරීක්ෂණය වූ අතර අඛණ්ඩව කෙටිකාලීන ආයෝජන වල මුදල් යොදවා තිබීම මෙයට හේතු වී තිබුණි.

| | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| ජංගම | 10.1:1 | 5.25:1 | 2.84:1 |
| ක්ෂණික | 9.96:1 | 5.2.2:1 | 2.83:1 |

**4.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ වෙළඳ කටයුතු වියදම රු.මිලියන 1,562 ක් වූ අතර පෙර වර්ෂයේ එම වියදම සමහ සැසඳීමේදී සියයට 12.9 කින් අඩු වී තිබුණි. එහෙත් සංචාරකයන්ගේ පැමිණීම 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 19.8 කින් වැඩි වී තිබුණු අතර ශ්‍රී ලංකාව ලැබූ ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් බිලියන 0.716 ක් හෙවත් සියයට 41.7 කින් වර්ධනය වී තිබුණි. මෙ අනුව සංචාරකයින්ගේ පැමිණීම හෝ ශ්‍රී ලංකාවේ සංචාරක ආදායම කෙරෙහි වෙළඳ වියදම් සෘජුව බලපාන බව තහවුරු නොවිය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

AGDSL

4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 03 දින සිට 2014 නොවැම්බර් 06 දක්වා එක්සත් රාජධානියේ පැවැත් වූ වෙළඳ ප්‍රදර්ශනය වෙනුවෙන් ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව මිළදී ගන්නා ලද රු.350,000 ක් වටිනා මැණික් ගල් 02 ක් හා නොමිලේ කාර්යාංශය වෙත ලැබී තිබූ මැණික් ගල් 02ක් තොග පොත්වල ඇතුළත් කර නොතිබුණු අතර නොමිලේ ලැබී තිබූ මැණික් ගල් 02 හි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පරීක්ෂණ වාර්තා අනුව කාර්යාංශයට ලැබී තිබුණු මැණික් ගල් 4 හි බර කැරට් 1.4,1.6,1.63 හා 1.54 ක්වූ අතර ඉන්වොයිසි අනුව රු.350,000 කට මිලදී ගත් මැණික් ගල් දෙකක බර කැරට් 5.6 ක් වූයෙන් ස්වර්ණාභරණ අධිකාරියේ පරීක්ෂණ වාර්තා සමඟ මැණික් ගල් වල බර නොසැසඳීම විගණනයේ දී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ආ) එක්සත් රාජධානියේ පැවැත්වූ වෙළඳ ප්‍රදර්ශනය (WTM (UK) 2014) වෙනුවෙන් වෙළඳ ප්‍රදර්ශන කුටි ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව ලබා දීමේදී මිල කැඳවුම් ලිපි විවෘත කළ යුතු දිනට දින 4 කට පෙර විවෘත කිරීම, ටෙන්ඩර්කරු හෝ නියෝජිතයෙක් ටෙන්ඩර් ලිපි විවෘත කරන අවස්ථාවට සහභාගී නොවීම, කොන්ත්‍රාත්කරු බ්‍රිතාන්‍ය තනාපති කාර්යාලය සමඟ ගිවිසුමකට එළඹ එහි පිටපතක් ප්‍රවර්ධන කාර්යාංශය වෙත එවිය යුතු බවට උපදෙස් දී ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබීම සහ වෙළඳ ප්‍රදර්ශන කුටි සාර්ථකව ඉදිකළ බවට වගකිවයුතු නිලධාරියෙකුගේ සහතිකයක් නොතිබියදී ඉහත ඉදි කිරීම සඳහා රු.17,803,508 ක ගෙවීමක් කාර්යාංශය මඟින් සිදු කර තිබුණි.

(ඇ) රුසියාවේ මොස්කව් නුවර පැවති සංචාරක ප්‍රවර්ධන වැඩසටහන (Leisure Travel and Tourism fair – 2014) සඳහා ටීෂර්ට් මිල දී ගැනීම වෙනුවෙන් රු.7,800,000 ක් වැය කර තිබූ නමුත් එම ටීෂර්ට් තොගය කාර්යාංශය වෙත ලැබී නොතිබූ අතර මිලදී ගැනීම් වෙනුවෙන් පිළියෙල කළ ලේඛන විගණනයේදී පිළිගත නොහැකි විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ලෝක සංචාරක දිනය පදනම් කරගෙන රු.5,824,000 ක් වැයකර මුද්‍රණය කරනලද ටීෂර්ට් තොගය දේශපාලන පක්ෂයක ප්‍රචාරක කටයුතු සඳහා යොදාගත් බව ද්‍රව්‍ය සැපයුම් ආයතනයේ අධ්‍යක්ෂකගෙන් තහවුරු වී තිබියදී මේ

8

සම්බන්ධව පරීක්ෂණයක් සිදු කිරීමට විගණිත දිනය වූ 2016 අගෝස්තු මාසය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) සංචාරක ක්ෂේත්‍රය තුළ සාමාජීය වගකීම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලික ආයතන දෙකකට ගෙවන ලද රු.99,439,900 (බදු රහිත) ක මුදල ආයතනයේ පරමාර්ථ ඉටුකිරීම සඳහා යෙද වූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට අමාත්‍යවරයා විසින් ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබූ බව අනාවරණය විය. මෙකී කමිටුව වාර්තාවක් අදාළ අමාත්‍යවරයා වෙත භාර දී ඇති බවත් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු මේ දක්වා ආරම්භ කර නොමැති බවත් කාර්යාංශයේ සභාපතිවරයා විගණනයට දන්වා තිබුණි.

(ඊ) හෝමස්ටේ ප්‍රචාරාත්මක වැඩසටහන නිර්මාණය සඳහා වන රු.මිලියන 33.9 ක් වන කොන්ත්‍රාත්තුව රාජ්‍ය ආයතනයකට භාරනොදී සීමිත මිල ගණන් යටතේ පුද්ගලික ආයතනයකට ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව ලබා දී තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත රු.14,500,000 ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබූ අතර අදාළ කාර්යය ඉටු කිරීමෙන් තොරව නැවත මාස 8 ක කාලයක් මුදල් අත රඳවා ගෙන 2015 වර්ෂයේ දී නැවත කාර්යාංශය වෙත ගෙවීමෙන් රජයේ මුදල් අයථා පරිහරණයට ඉඩ සලසා දී තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

4.3 ආර්ථික නොවන ගනුදෙනු
------------------------------
චීන මාධ්‍යවේදීන් 12 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් වෙනුවෙන් රු.3,506,757 ක වියදමක් දරා ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ශණීය ප්‍රදේශ කීපයක් ආවරණය වන පරිදි සිදු කල Familiarization Tours පිළිබඳ වාර්තා, චීන මාධ්‍ය මඟින් ප්‍රචාරය කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී. ඒ අනුව මෙම චාරිකාව සඳහා දරන ලද පිරිවැය ආර්ථික නොවන වියදමක් ලෙස නිරීක්ෂණය විය.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය
-------------------------------
කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 88 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩල 45 ක් වූයෙන් පුරප්පාඩු 43 ක් විය. කාර්යාංශයේ ඉහළ කළමනාකරණයේ සැළකියයුතු පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීමෙන් සංචාරක ප්‍රවර්ධන කටයුතු ප්‍රශස්ථ මට්ටම කරා ගෙනයාමට බාධාකාරී වී තිබූ බව නිරීක්ෂණය විය.

4.5 වාහන උපයෝජනය

වාහන කුලියට ලබාගැනීමේදී කිලෝ මීටරයකට රු.40 ක් ගෙවීමට එකඟ වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී කිලෝමීටර් 95,692 ක් ධාවනය කිරීම වෙනුවෙන් වාහන කුලී ලෙස රු.4,784,181 ක් ගෙවා තිබුණි. දිනකට අවම කිලෝමීටර් ගණන ධාවනය කර නොතිබීම හේතුවෙන් එක් ධාවන කිලෝමීටරයකට රු.50 ක් වැයවී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ගිණුම් ඉදිරිපත් කලයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 10 ක ප්‍රමාදයකින් පසුව එනම් 2016 ජනවාරි 05 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට ආයතනයේ ශක්තිය, දුර්වලතා, වාසි වූ අවස්ථා සහ තර්ජන හඳුනාගෙන ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම මෙම ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් ද හඳුන්වා දී නොතිබුණි.

(ආ) කාර්යාංශය විසින් 2014 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික කාර්යසාධන වාර්තා පරීක්ෂා කිරීමේ දී වර්ෂය තුළ ඉටු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 137 න් 94 ක් ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

කාර්යාංශයේ අභ්‍යන්තර විගණනය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පවරා තිබුණ ද අභ්‍යන්තර විගණන සැලැස්මේ පිටපතක් සහ අර්ධ කාලීන විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛයේ 4 පරිච්ඡේදයේ 4.2.1 (අ) සහ (ඇ) වගන්ති අනුව ඉදිරි වර්ෂය සඳහා වූ සවිස්තරාත්මක සැලැස්ම සමඟ අවම වශයෙන් වසර තුනක් ආවරණය වන සේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද, කාර්යාංශය විසින් එම සැලැස්ම සකස් කර නොතිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනයක් පිළියෙල කර තිබුණ ද ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබූ අතර 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තියේ නියමයන් පරිදි එය මුදල් වර්ෂයට මාස තුනකට පෙරාතුව පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ විෂයයන් 35 ක අයවැය ගත සංඛ්‍යා තථ්‍ය සංඛ්‍යා සමඟ සැසඳීමේදී සියයට 20 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) අයවැය ලේඛනමය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) වෙළෙඳ හා අලෙවිකරණ ක්‍රියාකාරකම්
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) ප්‍රසම්පාදනය
(ඊ) අභ්‍යන්තර විගණනය
(උ) මූල්‍ය කළමනාකරණය

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

11



srilanka
WONDER OF ASIA

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
අංක 80, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව
දුරකථන: +94 112 432 059 – 60 | www.srilanka.travel